ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 ආගමික සමුළුවෙන් නිවේදනයක්


08 බස්නාහිරට තරග වදින කතෝලික අපේක්ෂකයෝ - 03


12 සසුන් පියාගේ චතාරික පණිවුඩය


ඥානාර්ථ ප්‍රදීපය
ආරම්භය : 1866 ජූනි 07

සෙත් සරණ චතාරික වැඩසටහන
"ස්වාමින් වහන්සේගේ දුක්ගාවිනාවලට හවුල් වෙමු"
මෙවර ව්‍යාපෘතිය අගරදගුරු පදවි නිවාස සංවර්ධන අරමුදල සඳහා වෙන් කැරේ


ක්‍රි.ව. 2014 ක් වූ මාර්තු 23 ඉරිදා 148 වෙළුම 42 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

# ගිහි ධර්මදූත සේවාව නව මං ගන්වමින් ප්‍රථම ගිහි අපෝස්තලික කණ්ඩායම දහම් සේවයට

## ප්‍රථම කණ්ඩායම අගරදගුරු පදවි පූජක සංඝය ඉදිරියේ දිවුරුම් දෙයි

**කොළඹ අගරදගුරු වසමේ ගිහි ධර්මදූත සේවාව නව මං ගන්වමින් ගිහි අපෝස්තලිකයන් සය දෙනෙක් කොළඹ අගරදගුරු හිමි, සහයක රදගුරු හිමිපාණන් මෙන්ම අගරදගුරු පදවියේ පූජක සංඝය ඉදිරියේ ඉකුත් සඳුදා දිවුරුම් දුන්හ.**



දිවුරුම් දීමෙන් අනතුරුව ගිහි අපෝස්තලික කණ්ඩායම කාදිනල් හිමිපාණන්, සහයක රදගුරු හිමිපාණන් සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු

සය මාසයකට වැඩි කාලයක් තිස්සේ පූර්ණ කාලීන පුහුණුවකින් පසු දිවුරුම් දුන් මෙ පිරිස කොළඹ අගරදගුරු වසමෙ ධර්මදූත කලාපයේ මුලින්ම සේවාවට එක්වන අතර අවිස්සාවේල්ල සහ වග මීසම්වල පූර්ණකාලීනව කැපවීමෙ සේවා දැක්මක් මත කටයුතු කිරීමට නියමිතය.

සරළ ධර්මෝපදේශය, වැඩිහිටි ධර්මෝපදේශය, කියා දෙමින් විසිරී සිටින කතෝලික පිරිස් සොයා යමින් ද ඔවුන් හඳුනා ගනිමින් කතෝලිකත්වය තුළ ඔවුන් කිසිසේත් තනිවී - කොන් වී නැති බව එත්තු ගන්වා එකම සංඝයක් ලෙස එකමුතු කිරීමට මීසම් සේවක පියතුමන්ට සහය වීමට මෙ ගිහි අපෝස්තලික සහයක පිරිස කටයුතු කරනු ඇතැයි පළ විය.



ගිහි අපෝස්තලික කණ්ඩායම දිවුරුම් දුන් අවස්ථාව

## ප්‍රවීණ රංගන ශිල්පිනී මර්සි එදිරිසිංහ මහත්මිය සගසුව දිනයි




ඇයගේ දේහය මහජන ගෞරවය සඳහා පසුගිය අඟහරුවාදා මධ්‍යාහ්න 12.00 දක්වා කොළඹ 07 ජාතික කලාභවනේ තැන්පත් කර තැබු අතර අවසන් කටයුතු පසුගිය බදාදා (19) දින අඹේපුස්ස රෝමානු කතෝලික සුසාන භූමියේදී සිදුකෙරිණි. ප්‍රදීප පාඨක ලේඛක සැම එක්ව ඇයගේ ආත්මයට නිත්‍ය සුව ප්‍රාර්ථනා කරන්නෝය.

## මරිය වසරේ දහම් පාසල් ප්‍රදර්ශනයට දරුවන්ගේ දායකත්වය ඉහළ මට්ටමක

මරිය වසර නිමිත්තෙන් වත්තල සා. ආනා දෙව්මැඳුරේ දහම් පාසල විසින් සංවිධානය කළ "දේවමාතා දහම් ප්‍රදර්ශනය" පසුගියදා එම දෙව්මැඳුරු භූමියේදී පැවැත්විණි.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හා සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු සහ අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම ප්‍රදර්ශනය මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ, සහයක ගරු ක්‍රිෂාන් ජයශාන්ත පියතුමන් ප්‍රමුඛ සා. ආනා දහම් පාසල විසින් සංවිධානය කර තිබුණි.



කාදිනල් හිමිපාණන් මෙම ප්‍රදර්ශනයේ දී කුඩා දැරියකගෙන් විස්තර විමසූ අයුරු. (සේයා - ටී සුනිල් ප්‍රනාන්දු)

## "කිතුනු ගී" 500 ට ස්වර ප්‍රස්ථාර පොතක්

ජනවන්දනාව අරුත් ගැන්වීම සඳහා නව "කිතුනු ගී" පොතක ප්‍රබල අවැසියාව මතුවී තිබූ යුගයක 1993 වර්ෂයේ දී එවකට පැවති කුඩා "කිතුනු ගී" පොතට එම කාල වකවානුවේ දී දෙව්මැඳුරුවල භාවිත කළ අර්ථවත් ගීතිකා එකතු කරමින් ගීතිකා 500 ක් ලෙස ගරු දොන් සිසිල් කුමාර පියතුමා විසින් සකසන ලදී.

එය කොළඹ කතෝලික මුද්‍රණාලයෙන් වසර 21 ක් පුරා පිටපත් අති විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කර දේව ජනතාව අතට පත් කෙරිණි. අප දෙව්මැඳුරුවල මෙන්ම විදෙස් රටවල වෙසෙන සිංහල කිතුනුවන් පවා බහුල ලෙස භාවිත කරන "කිතුනු ගී" පොත සඳහා වූ ස්වර ප්‍රස්ථාර පොත මුද්‍රණ ද්වාරයෙන් ඉතා මෑතක දී පිටවනු ඇත.

15 පිටුවට »

## කතෝලික පෞද්ගලික පාසල් සඳහා ඉදිරිපත් කැරෙන සහතික පිළිබඳවයි

කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත් ලබා ගැනීමේදී දෙමාපියන්ගේ විවාහ සහතිකයේ සහ දරුවන්ගේ ක්‍රිස්තියානි සහතිකයේ මුල් පිටපත් ඉදිරිපත් කරන්න.

15 පිටුවට »

## ගාල්ල රදගුරු වසමට නව මීසමක්

ගාල්ල රදගුරු අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් විසින් උඩුගම නව මීසමක් වශයෙන් නම් කරනු ලැබ තිබේ. මෙතෙක් හිනිදුමට අයත්ව තිබූ උඩුගම සා. සෙබස්තියන් දෙව්මැඳුර කේන්ද්‍ර කරගෙන පිහිටුවා ඇති නව මීසමට තල්ගස්වල හා නාකියාදෙණිය අයත් වේ. නව මීසමේ ප්‍රථම මීසම් සේවක ලෙස ගරු ශ්‍රේෂන් මරියාලන්ගාරම් පියතුමා පත් කර ඇත.

## "සසුන් පිය හමුව" ජාතික රූපවාහිනියේ

මාර්තු මස 23 වන ඉරිදා (අද) සවස 6.00 ජාතික රූපවාහිනියේ සුපුවත වැඩසටහන තුළින් "අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ ශ්‍රී ලාංකික සංක්‍රමිකයින් හමුවීම" වැඩි දෙනාගේ ඉල්ලීම පරිදි නැවත විකාශය වන බව වැඩසටහන් සම්පාදක රංජුල සේනාධීර ප්‍රදීපයට පැවසීය.

**"ස්වාමින් වහන්සේගේ දුක්ගාවිනාවලට හවුල් වෙමු"**

පදවියට

# සලාපුර පදවි සාසන සේවක මංඩලය පත්වේ

**සාසන සේවක මංඩලය පදවියේ ඉතා වැදගත් ගිහි අපෝස්තලික සංවිධානවල හඬයි. මෙම සාසන සේවක මංඩලයට ඉතා දීර්ග ඉතිහාසයක් තියෙනවා වගේම අපට හොඳ ශක්තිමත් ගිහි පිරිසක්ද ඉන්නවා. මීසම් වල හොඳ නරක නොවෙයි අප සාකච්ඡා කළ යුත්තේ පොදු කරුණුයි. පදවියක් ලෙස ගමනක් යන විට විවිධ අභියෝග තිබෙනවා. ගිහියන්ගේ හඬ තුළ සභාව ඉදිරියට ගෙන යන්නේ කෙසේද කියා හඳුනාගෙන සමස්ත කතෝලික සභාවේ අභියෝග අප සාකච්ඡා කළ යුතුයි.**



හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් මෙසේ පැවසුයේ හලාවත පදවි සාසන සේවක මංඩලයේ 16 වැනි සැසිවාරයේ ප්‍රථම රැස්වීමේදීය.

2016 දෙසැම්බර් දක්වා පත් වූ නව නිළ මඬුල්ල මෙසේය. සභාපති - අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමි, උප සභාපති - එච්. ඒ. පෝල් පෙරේරා, උප සභාපති - නිච්කි තමෙල්, ලේකම් - ෂෙල්ටන් ප්‍රනාන්දු කාරක සභිකයින් පස්දෙනෙකුද පත්කර ගන්නා ලදි. සාසන සේවක මංඩලයේ ප්‍රථම රැස්වීම් වාරය අමතා පදවි අනුනායක අතිගරු පීටර් චාල්ස් සහ පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමන්ද දෙසුම පවත්වන ලදි.

මෙ අවස්ථාවට පදවියේ ගිහි අපොස්තලික අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් සහ ආසන දෙව්මැඳුරේ මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් පියතුමන් ඇතුලු මීසම් 46 නියෝජිතයින්ද, පැවදි නිකා නියෝජිතයන්ද සහභාගි විය.

**එච්. ඒ. සිරිල් පෙරේරා**

## මේ දැරියගේ දිවි ගමනට සහයවන්න



රාකේල් නම් මාස 6 ක මේ කුඩා දියණිය උපදින විට නාසයේ සහ උඩුතල්ලේ අස්වාභාවික පිහිටීමකින් යුතුවිය. වෛද්‍ය නිර්දේශය අනුව ඇයට මාස හයේදී සැත්කමක් කළ යුතු අතර මෙම සැත්කම සඳහා රු. 400,000/= ක් වැයවේ. රජයේ රෝහලක දී සැත්කම කිරීමට දරුවාගේ නම ලේඛන ගතව ඇත්තේ 2015 වසරටයි. එවිට දරුවාට වසරක් පිරෙන අතර සැත්කම් කළහොත් දරුවාට කථා කළ නොහැකි බව වෛද්‍යවරු පවසති.

මීගමුව සෙලාන් බැංකුවේ ගිණුම් අංක 0130-31535138-101 මුදල් පරිත්‍යාග කරන්නැයි මව චින්තානි පීරිස් ඉල්ලා සිටී. වැඩිවිස්තර 077-16766016 හෝ 031-4914020 වෙතින් දැනගත හැකිය



පමුණුගම දෙව්මැඳුරු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ වැඩ ආරම්භ කිරීමේදි බාරයක් වූයේ මීසම් පවුලකට නිවසක් ඉදිකිරීමටයි. ඒ අනුව මීසම් පාලක ගරු ආනන්ද විතාන පියතුමාගේ මඟපෙන්වීම යටතේ ඇලෙන්එගොඩ ප්‍රදේශයේ ඉතා ඉක්මනින් නිවසක් ඉදිකරමින් එම බාරය ඉටුකරන ලදි. පමුණුගම මීසමේ පියතුමන්ලා නව නිවසේ යතුර එම පවුලේ අයට බාරදීම මෙම සේයාරුවෙන් දැක්වේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**

## කුරුණෑගල පදවියේ පූජක මාරු

මීසම් සේවක - ගරු සුනෙත් බෙනීටෝ ආබරේ පියතුමා (ගල්ගමුව), අර්ධ මීසම් - මීසම් සේවක ගරු තරංග දිලෙක්ෂිත අප්පුහාමි පියතුමා - මිල්ලව (මාවතගම), මීසම් සේවක ගරු පැට්‍රික් රතුගම පියතුමා - තිසෝගම (හිරිපොකුණ), සහයක - ගරු නියොමාල් සිල්වා පියතුමා - (කුරුණෑගල), ගරු දිමුතු රොහාන් ෆොන්සේකා පියතුමා (මැල්සිරිපුර), ගරු ගෝමි දිවාකර පියතුමා (කුලියාපිටිය), ගරු ඇලෙක්සි කැලිස්ටස් පියතුමා (තල්ගහපිටිය), ගරු සම්පත් සුජීව පියතුමා (දුනකදෙනිය),

අපෝස්තලික සේවා - ගරු සාගර ප්‍රිසාන්ත පෙරේරා පියතුමා - සහයක අධ්‍යක්ෂ, කරිටාස් - කුරුණෑග 'ජනසෙත' පැල්ලන්දෙනිය, අධ්‍යක්ෂ පියතුමා - ධර්මදාන කටයුතු, ප්‍රධාන සංස්කාරක - "Fraternity" පදවි පුවත් සඟරාව, ගරු තරංග දිලෙක්ෂිත අප්පුහාමි පියතුමා - සහයක අධ්‍යක්ෂ - ජනවන්දනාව, ගරු දිමුතු රොහාන් ෆොන්සේකා පියතුමා - සහයක අධ්‍යක්ෂ - කුඩා කිතුනු සංඝ

අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා
පදවි පරිපාලන නාහිමි



බත්තුළුඔය සා. අන්තෝනි දහම් පාසලේ අඩුපාඩු සපුරාගැනීම සඳහා අරමුදල් තරකර ගැනීමේ අරමුණින් එම ගුරු මණ්ඩලය මුන්දලම මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමන්ගේ උපදෙස් මත තලවිල සා. ආනා ජාතික සිද්ධස්ථානයේ චතාරික මංගල්‍යයට සහභාගි වී ආපසු ගම්බිම් බලා පැමිණෙන සැදැහැවත් ජනතාවගේ ගිමන් පහස නිවාලමින් ඔවුන් වෙත කෝපි සංග්‍රහයක් කර එම ජනතාව තම කැමැත්තෙන්ම කරන පරිත්‍යාගයන්ගෙන් තම දහම් පාසලේ අරමුදල තරකර ගැනීමට කටයුතුකර තිබුණි.

**ඩබ්ලිව්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**

## පේරලන්දේ ඥානාර්ථ ප්‍රදීපය අලෙවිය සිව් ගුණයකින් ඉහළට!

පේරලන්ද මීසමේ, 50 කට සීමාවී තිබූ 'ඥානාර්ථ ප්‍රදීපය' අලෙවිය 200 දක්වා සිව් ගුණයකින් වර්ධනය වී ඇතැයි වාර්තා වෙයි.

මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි පියතුමන්ගේ මඟපෙන්වීම ඇතිව, මීසම් ධර්ම සේවා සභාව සමඟ කොට්ඨාශ හා ඒකක නායක නායිකාවන් දියත් කළ 'ඥානාර්ථ ප්‍රදීපය' ගෙන් ගෙට ගොස් අලෙවි කිරීමේ විධිමත් වැඩ පිළිවෙල නිසා මෙම අලෙවිය වර්ධනය වූ බව මීසම් ධර්ම සේවා සභාවේ ලේකම් තුෂාර ප්‍රනාන්දු මහතා 'ඥානාර්ථ ප්‍රදීපය'ට පැවසීය.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

## විමුක්තියේ ජේසු පාස්කු නාට්‍යය ජා-ඇළදී

ප්‍රවීණ කලාකරු රිචඩ් මානමුදලි මහතා ලියා නිෂ්පාදනය කොට අධ්‍යක්ෂණය කරන විමුක්තියේ ජේසු පාස්කු රංගනය මෙවරත් වේදිකා ගත කෙරේ. එහි මුල්ම දැක්ම අප්‍රේල් 13 ගොබ්ඉරිඳා කණුවන ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේදී පැවැත්වේ.

**ප්‍රියන්ත පීටර්ස්**



අගරදගුරු පදවි සා. වින්සෙන්තිද පාවුලා සංගමයේ චතාරික පාදනමස්කාරය මුන්දලම ශු. මහා සන්තියාගො මුනි දෙව්මැඳුරේ දි වින්සෙන්තිද පාවුලා පදවි අධ්‍යක්ෂ ගරු රොහාන්ද අල්විස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

**ඇග්නස් සියඹලාපිටිය**

## කුරුණෑගල පදවි තරුණ චතාරික ධර්ම විවේකයක්

කුරුණෑගල පදවියේ තරුණ තරුණියන් වෙනුවෙන් තෙදින තරුණ චතාරික ධර්ම විවේකයක් ඇතුගල්පුර පදවි කතෝලික තරුණ සංගමය මඟින් සංවිධානය කර තිබේ. "එන්න, අපි සමිඳාණන් වහන්සේ වෙත හැරී යමු. අප සුවකරන්නේ උන්වහන්සේය" (හොසියා 6:1) යන තේමාව යටතේ මාර්තු 28 සිකුරාදා ප.ව. 4.00 සිට මාර්තු 30 මධ්‍යහ්නය දක්වා කුඩාගම නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේදී ගරු ජීවන්ත පීරිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

කුරුණෑගල පදවි තරුණ අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු ආනන්ද වීරකෝන් සහායක ගරු ගෝමි දිවාකර පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය වේ.

**එරික් ජීවන්ත රොද්‍රිගු**

## තරාල චතාරික වන්දනා ගමන 06 දා

තරාල මීසමේ චතාරික වන්දනා ගමන අප්‍රේල් 06 ඉරුදින පුත්තලම තබ්බෝවට යෑමට මීසම් සේවක ගරු සුමිත් රෝෂන් පියතුමා හා දහම් සේවා සභාව සංවිධානය කර ඇත.

**සමන්කාන්ත සිල්වා**

## තඹකන්දෙන් මඩු චාරිකාවක්

තඹකන්ද මීසමේ වාර්ෂික වන්දනා චාරිකාව මෙවර මඩු සිද්ධස්ථානය කරා සිදුවිය. බස්රථ දෙකකින් 120 ක පමණ පිරිසක් සහභාගි වූ අතර මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ මඟපෙන්වීම මත සිදුකැරිණ.

**ජූඩ් රංජන්**



කිතුනු බැතිමතුන්ගේ ප්‍රධාන ආගමික සිද්ධස්ථානයක් වන තලවිල සා. ආනා මුනිශ්වරියගේ දෙව්මැඳුරේ වාර්ෂික චතාරික මංගල්‍යයට අවශ්‍ය යටි තල පහසුකම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන චෙක් පත් දෙව් මැඳුරු මීසම් ගෘහයේදී ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මිල්රෝයි එස්. ප්‍රනාන්දු මහතා විසින් හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ට ප්‍රදානය කළ අයුරු. එම අවස්ථාවට ධීවර නියෝජ්‍ය අමාත්‍ය සරත් ගුණරත්න, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ලලිත් නියෝමාල් පෙරේරා, පොල් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය වික්ටර් ඇන්ටනි පෙරේරා යන අමාත්‍යවරු හා ආගමික හා ක්‍රිස්තියානි කටයුතු අධ්‍යක්ෂ ආර්. ගුණවර්ධන, ජනාධිපති තුමාගේ මුදල් අමාත්‍යංශ සම්බන්ධීකරණ ලේකම් ජේ. නෙල්සන් පෙරේරා යන මහත්වරුද සහභාගි වූහ.

**පර්සි ප්‍රනාන්දු**

## ධර්ම විවේකයෙන් ගෝනවිල මීසමට අධ්‍යාත්මික පෝෂණයක්

ගෝනවිල ශුද්ධවූ ජුසේ සංවත්සරය වෙනුවෙන් නිර්මල මුනිඳුන්ගේ දෙව්මැඳුරේ 143 වන මරිය නිකායේ දේශනාවාදී ගරු පියවරුන් විසින් වත්වන ලද මහා ධර්මවිවේකයේදී පවුල් බැහැදැකීමෙන් අනතුරුව දේවස්ථානයේ සෑම කිතුනු ඒකකයක්ම නියෝජනය කරමින් දිව්‍ය පූජා සිදුකරන ලදී.

පුරා සති දෙකක කාලයක් අධ්‍යාත්මික පෝෂණ වැඩමුළු පවත්වමින් පවුල් විවාහ සකස්කිරීම හා වැඩිහිටි ප්‍රසාද ස්නාපනය දානය කිරීම සිදුකැරිණ. ගෝනවිල මීසම් සේවක ගරු සිල්වෙස්ටර් විජයකුසූරිය පියතුමාගේ ඉමහත් කැපවීම හා උනන්දුව මත මෙය සාර්තක කරගන්නට හැකිවිය.

**මේරි හිල්ඩා බලාසූරිය**



චතාරික කාලය තුළ සුදානම් වීම සඳහා ඥානකාන්තියක් මැදකොළඹ දිසාවේ දිව්‍ය හෘදය සමිති නිලධාරින් සහ සාමාජිකාවන් සඳහා මැදකොළඹ දිව්‍ය හෘදය දිසා අධ්‍යක්ෂ ගරු රොෂාන් වාස් නි.ම.නි පියතුමාගේ ආරාධනයෙන් ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි පියතුමා මට්ටක්කුලිය ද මැසනඩ් නිවසේදී පැවැත්විය. දිසා දිව්‍ය හෘදය සමිති අනුශාසිකා ගරු ප්‍රියානි පැවිදි සොයුරියද එක්වූවාය.

**සුසිලා ඩයස්**

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com
ක්‍රිස්තු වර්ෂ 2014 මාර්තු 23 ඉරිදා

# "මෙන්න නුඹේ අම්මා"

මේ වසරේ චතාරිකය දැන් දෙවන සතියත් පසු කරමින් සිටී. මරිය වසර තුළ සිහිකරන චතාරිකය සැබැවින්ම පෙර නොවූ අයුරකින් කතෝලික ආධ්‍යාත්මය පුබුදුවාලීමකට නතු කර ඇත. බෙත්ලෙහෙමේ සිට කල්වාරිය දක්වා මරියාවන් ගිය දිගු ගමන සිහිපත් කරන්නටත් ඒ දිරි දැක්මෙන් කල්වාරි කුරුස පාමුලට මරියාවන් හා එක්ව ගමන් කරන්නටත් මෙවර චතාරිකය තුළ කතෝලිකයින් ලත් ඇරියුම විවිධ පැතිකඩ ඔස්සේ ගැඹුරු චිත්ත ධර්ම ගවේෂණයකට කදිමට මං සලසා තිබේ.

තම පුතුනුවන්ගේ අතිමහත් යාගය සිදුවූ මොහොතේදී කුරුස පාමුල සිට මරියාවන් අත් දුටු අති මහත් වේදනා සම්භාරය ඔස්සේ කිතුනුවා ලත් ඇරියුම සම්පූර්ණයෙන්ම අන්තර්ගත වන බැවින් කුරුස පාමුල මරියාවන් අමතක කරන කිසිවෙකුට සැබෑ කිතුනුවකු වීමට බැරිය. ඒ කුරුස පාමුලදී දරුකම අත්විඳීම තුළින් මව් සෙනෙහස පිළිබඳව මවන චිත්‍රය අවබෝධ වනවා මෙන්ම එකී සෙනෙහසේ උත්තරීතර බව හදවත් මත නිසැකවම සටහනක්ද තබයි.

ක්‍රිස්තුන් වහන්සේ අත් විඳි දරුපෙම බෙත්ලෙහෙමේ සිට කල්වාරිය දක්වා ඔවුන්වහන්සේ රැගෙන ගියේ ඒ සනිටුහන් වීම සැබෑ ලෙසින්ම ඔවුන්වහන්සේ ආත්ම කොට ගෙන තිබූ බැවිනි. එම නිසාම දරු පෙම හා දරුකම උදාර දාරකත්වය හා මුසුකරමින් තමන්වහන්සේ අත්දුටු සුවිශේෂී ආදරය පොදුවේ සියළු දරුවන් වන් ජනතාවට අත් දකින්නට කුරුස පාමුල විවෘත කළ මාතෘත්වයේ සෙනෙහස අමතක කරන කිතුනුවකුට ක්‍රිස්තුන් වහන්සේට ආදරය කළ නොහැකියි. කුරුසිය පාමුලදී මරියාවන්ගේ මාතෘත්වයේ කර්තව්‍යය නවමු හා අභියෝගාත්මක මුහුණුවරක් දිස් කළේ සිය පුතුණුවන් ලබාදුන් අනුහස් ඇරැයුමත් සමඟමයි. ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ කිට්ටුවන්ත ශ්‍රාවකයාව ඇයගේ පුත්‍රයා ලෙස ඒ මහෝත්තමාවට පවරා දුන් අතරම මරියාවන් සිය මෑණියන්සේ ඒ ශ්‍රාවකයාටම පවරා දුන් බව ජුවාම් සුවිශේෂය අනාවරණය කරයි. ඒ සුවිශේෂී පවරා දීම හා උරුම කර දීම නිසාම සුවහසක් ජනතාවට ගැළවීම ලබා දුන් ගැළවුම් කරුවාණන්ගේ මාතාව සේ එතුමියගේ මාතෘත්වයේ දිගු කර්තව්‍ය ලෝකයේ අවසානය දක්වාම කුරුසිය මත ප්‍රතිඥාව තුළින්ම දීර්ඝ කරනු ලැබ ඇත.

ක්‍රිස්තුන් වහන්සේගේ මේ බලවත් පවරාදීම පිළිබඳව මරිය වසර තුළදී අත්දකින චතාරිකය ඒ ඓතිහාසික කථාන්දරය නැවතත් දිග හරිනු ලබයි. තමන්වහන්සේ අනුගාමී වන සියළු ජනතාව ශ්‍රාවකත්වය තුළ ඔවුන් ලත් දිව්‍ය සත්ප්‍රසාදයේ මහඟු කැඳවීමට විශ්වාසවන්ත වීම ඔවුන් තුළින්ම තහවුරු කරන්නට මරියාවන් හට විශේෂ කාර්යය භාරයක් කුරුසිය මත සමිඳාණන් ලබාදුන් බව අමතක කරන්නට කොයියම් කිතුනුවකු හට පිළිවන්ද? මරියාවන්ගේ සුවිශේෂී කාර්යය භාරය හොඳින්ම අවබෝධ කොට ගෙන සිටියේ පුතුණුවන්මයි. කුරුසිය මත ලබාදුන් අනුහස් භාරකාරත්වය සමිඳාණන් එතුමියට පෑ උපහාරයක්මයි. කිතුනු ලෝකයට එය අමතක කළ හැකි නොවේ. අමතක කළ යුතු ද නොවේ.

ක්‍රිස්තුන් වහන්සේව තනි නොකළ මෑණියන් ගැළවීමේ ඉතිහාසයේ මාතාවන බව පසක් වන්නේ අදටත් ඒ ගැළවීම තුළ ලබන සන්තෘෂ්ටියේ ප්‍රධාන පංගුකාරිය එතුමියම වීම තුළයි. ඒ මෑණියන් අමතක කර කුරුසියේ පහස ලබන බව පැවසීමට කිතුනු කිසිවෙකුට නොහැකියි. එතුමියගේ සහභාගිත්වය හා සමීපතාව පුතුනුවන් ලෙස ක්‍රිස්තුන් වහන්සේට කුරුස ගසේදී දැඩිව දැනුනේ පියාණන් වහන්සේ සමග සහයෝගිව දායක වෙමින් කල්වාරියේ පුදන තමන්වහන්සේගේ පරිත්‍යාගයේ පිදුම අවසන් අදියර කරා යන තෙක්ම මහත්වූ ආදරය පෑමක් තුළ එතුමිය තමන්වහන්සේ ළඟින්ම සිටිය බැවිනි.

තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ මාතාව මෙන්ම මුළුමහත් ශු. සභාවේ මාතාව මෙන් සුවිශේෂී අයුරින් එතුමිය ඉටුකරන භූමිකාව පිළිබඳව ක්‍රිස්තුන්වහන්සේ තුළ තිබූ සැබෑ පැවත්ම කුරුස පාමුල අත්දැකීමෙන් මොනවට පැහැදිලි කරයි. මුල් තැන්හිලා තමන්වහන්සේ වෙත පෑ මරියාවන්ගේ රැකවරණය. පෝෂණය හා බලගැන්වීම සිය කාර්යය ඉටුකිරීමට බලාත්මක වූයේ යම්සේද ඒ අයුරින්ම මරියාවන් තුළින් ඒ රැකවරණය, බලාපොරොත්තුව ඇති කිරීම හා දිරි ගැන්වීම තම ශ්‍රාවකයින් හටත් නොඅඩුව ලැබෙන බවට ඉඟි වන සාධක පිළිබඳව ඔවුන්වහන්සේ තහවුරු ගැන්වීමක සිටි බව පැහැදිලියි.

මේ නිසාම කල්වාරි පිදුමේ මහා ආනිශංසනය තුළ කුරුස පාමුල සිටි මරියාවන් දිව්‍ය පරමාදර්ශී මාතාව ලෙස ඔවුන්වහන්සේ විසින්ම අපට දායාද කොට ඇත. තමන්වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය දිව්‍ය සත්ප්‍රසාදය තුළින් සදාතනික ආහාරයක් සේ මෙන්ම තමන්වහන්සේ ජනිත කළ ආදරයේ මාතාවන්වද පරම පිවිතුරු මාතෘක රැකවරණයකට නතු කරමින් ශ්‍රාවක සියළු දෙන හට ලබාදුන් බව ප්‍රත්‍යක්ෂයි.

'මෙන්න ඔබේ අම්මා' යන වචනය අසන්නට සැම කිතුනුවෙක්ම කුරුස පාමුලට ගමන් කළ යුතුව ඇත. කුරුසිය පාමුලට නොයන්නාට දිව්‍ය මාතෘත්වයේ සෙනෙහස උරුම නොවනවා සේම ජීවමාන කුරුස සංකේතයේ පහස ද අහිමි වේ. මෑණියන් තම නිවසට නොපිළිගන්නා කිසිවෙකු හට ක්‍රිස්තුන් වහන්සේවද පිළිගැනීමට නොහැකියි. අපේ කතෝලික විශ්වාසයේ මරියාවන් පිළිබඳ මේ පැතිකඩය විශ්වාසය ජීවමාන කරවන අයුරු විහිදාලන පූර්ණ සංරචකයක් බව අමතක නොකරමු. 'මෙන්න ඔබේ අම්මා' යන වචනය අසන්නට කුරුස පාමුලට යළි යළිත් දෙපා ඔසවන්නට මේ චතාරිකයේ අපි කවුරුත් අදිටන් කර ගනිමු.

# රජය හා ඡන්දදායකයන් වෙත ආගමික සමුළුවෙන් කෙරෙන නිවේදනයකි

"මහජනයාට ලැබෙන්නේ ඔවුන්ට ගැලපෙන නායකයන්ය." යනු ප්‍රකට කියමනකි. මෙම කියමනෙහි විශාල සත්‍යතාවයක් ගැබ්ව පවත්නා බව පෙනී යන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනුව මහජනතාව තම නායකයන් ඔවුන්ගේ ඡන්දයෙන් පත්කර ගන්නා බැවිනි. එහෙත් එම සත්‍යතාවය වලංගු හෝ අවලංගු වන්නේ අදාළ මැතිවරණය නිදහස් හා සාධාරණ වන ප්‍රමාණයටය.

එහෙත් අවාසනාවකට මෙන් ඉදිරි පළාත් සභා මැතිවරණය නිදහස් හා සාධාරණ එකක් වන බවට විශ්වාසය කාරණා කිහිපයක් හේතුකොට ගෙන හීනවෙමින් පවතී. මැතිවරණ කොමිෂන් සභාව පමණක් නොව, පොලිස් කොමිෂන් සභාවද, ඉවතට දමා ඇත. මැතිවරණ කොමසාරිස්වරයා විසින් භුක්ති විඳින බලතල මැතිවරණ නීතිය ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බව පෙනේ. විශේෂයෙන්ම මෙම තත්ත්වයට හේතු වී ඇත්තේ නීතියේ රැකවල්කරුවන් වන පොලිස් සේවාව ඇතුළු රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීමේ සන්දර්භය තුළය. නිදසුන් ලෙස ගතහොත් මැතිවරණ කොමසාරිස්වරයා වෙත අපේක්ෂකයන් නාමයෝජනා බාර දුන් දා පටන් රාජ්‍ය දේපල වාහන හා මාධ්‍ය ආදිය භාවිත කරමින් මැතිවරණ නීතිය බරපතල ලෙස උල්ලංඝනය කරමින් පවතී. සමහර අපේක්ෂකයෝ රාජ්‍ය අනුග්‍රහය භුක්ති විඳිමින් රටේ මැතිවරණ නීතියට එරෙහිව ක්‍රියා කරති. මෙකී නීති කඩ කරන්නන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ග යක් ගෙන නොමැත. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කරනු පිණිස නීතියේ ආධිපත්‍යය සුරක්ෂණය කිරීම රජයේ වගකීමයි. මේ සම්බන්ධයෙන් යුතුකම් හා වගකීම් පුරවැසියන්ටද පැවරේ. පළමුකොට ඡන්ද බලය හිමි සැමදෙනා සිය ඡන්දය නොවරදවාම භාවිත කිරීමේ වගකීම අවධාරණය කරමු. එම නිසා අවංකව හා පරහිතකාමී ලෙස පොදු මහජන සුභසිද්ධිය වෙනුවෙන් තම වගකීම් සිතට එකඟව ඉටු කිරීමට හැකියාවක් ඇතැයි සිතන අපේක්ෂකයන් පමණක් තෝරා පත් කර ගැනීමේ මහඟු අවස්ථාව උපයෝගී කරගන්නා ලෙස තරයේ ඉල්ලා සිටිමු.

දෙවනුව මැතිවරණ වේදිකාවල නිස්සාර භාවය ගැන අවධාරණය කරමු. දේශපාලනඥයින් විසින් කඩ කරන පොරොන්දු ගැන මනා අත්දැකීමක් ඇති ඡන්දදායකයන් පහසුවෙන් මුලාකර ගත නොහැකි වේ යැයි යනු අපගේ බලවත් විශ්වාසයයි.

තුන්වනුව, පළාත් සභා සභිකයකුගේ වගකීම් ඉටු කිරීමට හැකියාවක් නොමැති වූ අධ්‍යාපනය, චරිතශුද්ධිය, අදාළ දක්ෂකම් ආදිය නොමැති සැහෙන දෙනෙකුට දේශපාලන පක්ෂ නාම යෝජනා දීම අවාසනාවන්ත අමිහිරි තත්ත්වයකි. චරිත ශුද්ධිය හා ක්‍රියා කලාපය උසස් මට්ටමක ඇති අපේක්ෂකයන් පමණක් ඉදිරිපත් කරන ලෙස ආගම් සමුළුව කීපවතාවකදීම දේශපාලන පක්ෂ නායකයන්ගෙන් ඉල්ලා ඇත. මෙම අවවාදය නොතැකීමේ හේතුවෙන් ස්ත්‍රී දූෂණ, අපරාධ, බාල අපයෝජන, මත්කුඩු ජාවාරම්, මූල්‍ය දූෂණ ආදී චෝදනා ලැබ වෙනත් හැකියාවන්ගෙන් පරිපූර්ණ ඇතැම් සාමාජිකයෝද, ජාතික හා පළාත් පාලන ව්‍යවස්ථාදායක ආයතන වල පෙනී සිටිති. නුසුදුසු සාමාජිකයන්ගෙන් යහපතට වඩා අයහපත ව්‍යවස්ථාපිත මණ්ඩලවලට සිදුවිය හැකිය. මෙයින් පැහැදිලි වන්නේ සුදුසු හා නිසි අය තෝරා පත්වීම සහතික කරනු පිණිස තම ඡන්දය ඉතා බුද්ධිමත්ව භාවිත කිරීමේ මහත් වගකීමක් ඡන්දදායකයන් වෙත පැවරෙන බවයි. නොඑසේ නම් අප සහයෝගය අයහපත් පාලනයකට පිරිනැමීමෙන් එහි ප්‍රතිඵල අත්විඳින්නට සිදුවනු නියතය.

අවසාන වශයෙන් කිවයුත්තේ, මෙම සියල බාධක හා ගැටලූ මැද අපි ජනතාවගේ ප්‍රඥාසම්පන්න ස්ථානෝචිත ඥානය කෙරෙහි විශ්වාසය තබමු. ඉදිරි පළාත් සභා මැතිවරණ වලින් අපේක්ෂිත යහපත් ප්‍රතිඵල ලැබිය හැකිවනු ඇත්තේ එසේ වුවහොත් පමණි.

**අත්සන් කළේ :**


- අතිපූජ්‍ය ආචාර්ය ඉත්තෑපානේ ධම්මාලංකාර වැඩ බලන මහනායක හිමිපාණෝ
- අතිපූජ්‍ය මහචාර්ය බෙල්ලන්විල විමලරතන නායක හිමිපාණෝ
- අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත නායකහිමිපාණෝ
- පූජ්‍ය බ්‍රහ්මණවත්ත සීවලි නායකහිමිපාණෝ
- පූජ්‍ය නාගොඩ අමරවංශ හිමිපාණෝ
- අතිඋතුම් දේව ධර්මාචාර්ය මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණෝ
- අතිඋතුම් දේව ධර්මාචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ
- අතිඋතුම් දේව ධර්මාචාර්ය ඉමැනුවෙල් ප්‍රනාන්දු සහයක රදගුරුතුමා
- අතිගරු ඩිලෝරාජ් කනගසබෙයි කොළඹ ලංකා සභා රදගුරුතුමා
- අතිගරු දුලිප් ද චිකේරා රදගුරුතුමා
- බ්‍රාහාම ශ්‍රී කුහානන්ත ශර්මා කුරුක්කාල් තුමා
- ඉස්ලාම් ආගමික නියෝජනය
- ගරු ඩබ්ලිව්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා

## දැනුම් දීමයි !

අගරදගුරු පදවිය තුළ සේවය කරන ගරු පියතුමන්ලා, සහෝදර තුමන්ලා සහ පැවිදි සොහොයුරියන් ඇතුලූ කතෝලික ජනතාව වෙත දන්වා සිටින්නේ, 2002 වසරේ දී ශුද්ධාසනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද දිව්‍ය යාගයට අදාල මූලික පූජා පොතේ 3 වන නිල අනුවාදනය තුළ සඳහන් වන දිව්‍ය පූජාව සඳහා වූ ජාත්‍යන්තරව වලංගු වන පොදු නියෝග යන්ට අනුව දිව්‍ය පූජාව සිදු කිරීම සඳහා පූජා ප්‍රසාදිතුමන් විසින් පැළඳිය යුතු පළඳනාවන් මෙසේ වන බවයි.


ඒවා නම්:
ඇල්බ් පලඳනාව : තම පූජක හෝ පැවිදි කැපවීම සංකේතවත් කරන ලෝගුවට උඩින් ඇල්බය නමැති දිගු පළඳනාව ද, එම ඇල්බය විවෘත කරකින් යුත් නම් එම ප්‍රදේශය ආවරණය කිරීම සඳහා ඇමිසය නමැති පලඳනාව ද, ඇල්බය තමන්ට සරිලන ආකාරයට සකස් කර ගැනීම සඳහා අවශ්‍ය වන බඳ පටිය ද ඉන්පසු ස්ටෝල් පටිය හා දයාවරණය (වැසුබලය) ද යන්නෝය (GIRM/335-347) මෙසේ පූජක පලඳනා පැළඳීමේදී පූජා ප්‍රසාදි තුමන් විසින් පළඳනු ලබන නිල පූජක ලෝගුව ඇල්බය ලෙස සැලකිය නොහැක (රෙඩෙම්සියෝනිස් සක්‍රමෙන්තුම් 126).

මෙම නියෝගය කොළඹ අගරදගුරු පදවිය තුළ සේවය කරන සියලුම පදවි හා පැවිදි පූජා ප්‍රසාදිතුමන්ලා අනුගමනය කළ යුතු වන්නේ තමන් සේවය කරන ජනතාව ආධ්‍යාත්මික සහ ශුද්ධවත් ජීවිත පැවැත්මක් වෙත යොමු කරන්නට හැකි මහඟු දායාදයක් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අති පරිශුද්ධ වූ දිව්‍ය යාගය දේවස්ථානයේ පූජාසනය මත සිදුකරන බැවිනි. ඒ නිසා ශුද්ධාසනය මඟින් නියෝග කර ඇති පූජක පලඳනාවන් පැළඳීම දේව ජනතාවගේ ගෞරවය ආරක්ෂා කරන සංකේතයක් වන බව ද දන්වනු කැමැත්තෙමි. ඒ සඳහා සියල්ලන් බැඳී සිටින බව ද ශුද්ධාසනයෙන් අවසර නොමැතිව මෙය ස්ව කැමැත්තට අනුව වෙනස් කරන්නට කවර තත්ත්වයක සිටින්නකුට වුව ද බලය නොමැති බව දන්වා සිටිමි. මෙය සියලුම දිව්‍ය පූජා සඳ ... ාවෙන් සලකන්න.



✠ අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
කොළඹ අගරදගුරු
2014 මාර්තු 10 වෙනිදා

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත



# උල්හිටිය කල්වාරි පුදබිම ආසිරි ගැන්වේ



අපගේ ජීවිත කුරුස යනුවෙන් හඳුන්වන්නේ දෙවියන්ගේ කැමැත්ත සැලැස්ම තේරුම් ගත් පසු එන කුරුසයයි. දේව කැමැත්ත ඉටුකරන්න පැමිණෙන වේදනා පමණයි කුරුස වන්නේ අපරාධයක් කර එයට ලැබෙන දඬුවම කුරුසියක් නොවේ. උන්වහන්සේ දේවකැමැත්ත සොයමින් දේව කැමැත්ත පිළිගත් පසුවයි කුරුසිය බාරගත්තේ. එයින් මුළු මිනිස් සංහතියටම ගැළවීමක් ලැබෙන බව තේරුම් ගන්නැයි බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමිපාණෝ පැවසූහ.

එතුමා මෙසේ පැවසුවේ මහියංගනය උල්හිටිය සා. අන්තෝනි සිද්ධස්ථානයේ නව කල්වාරි පුදබිම විවෘත කරමින් පැවැත්වූ දේව මෙහෙයේදීය.

බදුල්ල පදවියේ ගරු පියතුමන් 14 නමක් පාදනමස්කාර ස්ථාන 14 විවෘත කළ අතර රදගුරු හිමි ප්‍රථමයෙන් ඒවා ආසිරි ගැන්වීය. අනුනායක අතිගරු මාර්ෂල් රාජනායගම් පියනම ඇතුළු බදුල්ල පදවියේ ගරු පියතුමන්ද, සා. එමාඩ් දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු යොහාන් ප්‍රනාන්දු පියනම බණ්ඩාරවෙල ‘සිදු පිය නිල’ දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු රොෂාන් ප්‍රනාන්දු සහ රුවන් පියනමද එම ගරු පූජක සොයුරන්ද රත්නපුර පදවියේ ගරු ඩේමියන් ප්‍රනාන්දු පියනම සහ බදුල්ල පදවියේ ගරු පැවිදි සොයුරියෝද සහභාගි වූහ. බිබිල මීසම් සේවක ගරු ජූඩ් නිශාන්ත පියනම සිංහල භාෂාවෙන්ද දමිළ බසින් ගරු මර්වින් සුදර්ශන් පියනමද දේශන පැවැත්වූහ.

පැමිණ සිටි සියලුදෙනාට, ආධාර කළ සැමට ස්තුති කළ මහියංගන මීසම් සේවක බදුල්ල දිසා නායක ගරු ඩිලෙක්ස් ශාන්ත පියතුමා වසර 31 ක් පැරණි මේ පුණ්‍ය බූමියේ පාදනමස්කාර ස්ථාන පිහිටුවීමට, පසුගිය වසරේ මංගල්ලයේදී රදගුරු හිමිපාණන්ගේ අනුමතිය ලබාගත් බව පැවසීය.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**

## කටුපොත වින්සෙන්තියානුවෝ රජයේ රෝහල බැහැදකිති

කටුපොත සා. වින්සෙන්තිද පාවුලා සංගමය පසුගියදා කටුපොත රජයේ මූලික රෝහලේ රෝගීන් බැහැදැකීමට ගියේය.

වෛද්‍ය හා හෙදියන් ඇතුලු රෝහල් කාර්ය මංඩලය නේවාසික හා බාහිර රෝගින්, ළමා ළපටින් ඇතුළු සැම දෙනා පිනවමින් ගීත ගායනා කරමින්, රසකැවිලි හා නෙස්ටෝමෝල්ට් පානයකින් සංග්‍රහ කරන ලදී.

**ඔස්ටින් කැෂ්මියර් ප්‍රනාන්දු**



කළුතර ලූර්දු දේවමාතා මංගල්‍යයත් සමගින් මරිය වසර නිමිත්තෙන් දේව මාතාවන්ගේ ප්‍රතිමාව පසුගියදා කළුතර දිසාවේ මීසම් වටා රැගෙන ගියහ. දියලගොඩ මීසමේ සිට මග්ගොන මීසමට මෙ ප්‍රතිමාව රැගෙන ආ අවස්ථාවේදී දියලගොඩ මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන් විසින් මග්ගොන මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන පියතුමන්ට මග්ගොන දෙව්මැඳුරු මංසංධියේදී ප්‍රතිමාව බාර දුනි. එතැන් සිට පෙරහරින් දෙව්මැඳුර කරා ප්‍රතිමාව රැගෙන ආ අයුරුයි මේ. කළුතර දිසානායක ගරු ජූලියන් තිසේරා පියතුමන්ගේ මූලිකත්වයෙන් මෙම කටයුතු සංවිධානය කරන ලදී.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## පල්ලන්සේන චතාරික වැඩ පිළිවෙළ

පල්ලන්සේන මීසමේ චතාරික සමය ආරම්භ කරන ලද්දේ “ගෙන යනු මැන දෙවි මවේ අප ජීවිත අඳුරෙන් ආලෝකයට” මරිය වසර හා බද්ධවූ තේමාව මුල්කරගෙනය.

දූවන ශුද්ධවූ ත්‍රිත්වයේ දේවස්ථානයේ දී පැවති අර්ධ රාත්‍රික අධ්‍යාත්මික දේව මෙහෙයක් ගීත භාවනාවක් සමගින් පුළුල් තිරයක් මත පරිඝනක ආධාරයෙන් පවත්වමින් ගරු කලන පීරිස් පියතුමා මීසම් ජනතාව සූදානම් කළේය. දින 40 තුළ මීසමට අයත් දේවස්ථාන පහේම පාදනමස්කාරය හා දිව්‍ය පූජාව සවස පැවැත් වේ. මෙ සමගම කිතුනු ඒකක 61 ක් කලාප 10 කට වෙන් කර ඇති මෙම මීසම ගම හරහා එළිමහන් පාදනමස්කාර පැවැත්වේ. අප්‍රේල් 05 මීසමේ චතාරික වන්දනා ගමන වහකෝට්ටේ පුදබිමට ගමන් කරයි.

මීසම් මට්ටමින් චතාරික අරමුදලක් රෝගීන් වෙනුවෙන් සූදානම් කෙරේ. ආලේලූයා සෙනසුරාදා දුගී පවුල් සඳහා වියලි ද්‍රව්‍ය පරිත්‍යාග කැරේ. මෙ වසරේ එළිමහන් පාදනමස්කාරය ගොබ් ඉරුදින කොච්චිකඩේ ශුද්ධාත්ම දේවස්ථානයේ සිට පෝරුතොට ශුද්ධ වූ සෙබස්තියන් මුනිඳු දේවස්ථානය දක්වා ප්‍රධාන මාර්ගය මගහැර පැවැත්වේ. මීසම් සේවක ගරු ජයන්ත නිමල් සහයක පියතුමා හදිසි අනතුරකින් රෝගීව සිටින බැවින් ගරු ඔගස්ටින් ප්‍රනාන්දු පුල්ලේ පියතුමා හා සහයෝගීව කටයුතු සංවිධාන කෙරේ.

**මෙල්වින් ද කොස්තා**

## වැලිවිට මීසමේ ආත්මික වැඩසටහන් රැසක්

වැලිවිට චතාරිකය වැඩසටහන් මීසම් සේවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමා ආරම්භ කර ඇත. අඟහරුවාද දිනවල නුවාන මට්ටමින් පාදනමස්කාරයද සිකුරාදා දිනවල දේවස්ථානයේ පාදනමස්කාරයද පවත්වා අවසානයේ යාම යැදුම හා ආශිර්වාදය දානය කැරේ. ඉරිදා දහම් පාසල් දෙමව්පියන්ගේ පාදනමස්කාරයක් පැවැත්වේ.

**සුසිල් හැරිසන්**

## සහයක පියතුමාව පිළිගනිති

කංජුක්කුලිය සා. බෙනඩික් දෙව්මැඳුරේ මාර්තු දෙවන ඉරුදින සවස දිව්‍ය යාගයෙන් අනතුරුව නව සහයක ගරු දිනේෂ් දුමින්ද පියතුමාව ගරු ජූඩ් ඩයස් පියතුමා සහ කංජුක්කුලිය දේව ජනතාව ඉතා ලෙන්ගතුව, හෘදයාංගම උණුසුමින් පිළිගත්හ.

**ඇම්. ඩබ්. අනුර ශාන්ත පීරිස්**



මාරවිල පොලිසියේ නිළධාරි මහතුන් නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා තරුණ කැලට මත්ද්‍රව්‍ය උවදුර ජංගම දුරකථන භාවිතය වැනි දේ තුළින් වන හානි පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමාගේ අනුදැනුමීන් මෙය සිදුකැරිණ.

**ශ්‍රියාංගණී පිලිපියා**



හපුගොඩ ජනතාවට අමතක කළ නොහැකි යුග මෙහෙවරක් කළ ස්වර්ගස්ථ ගරු ෆර්නැන්ඩ් මොයිස් නි.ම.නි පියතුමන් අනුස්මරණය කරමින් දෙව්මැඳුරු බිමේ මීසම් ශාලාව නම් කිරීම හපුගොඩ ජ්‍යේෂ්ඨ පුරවැසි කමිටුවේ සංවිධානයෙන් ගරු බැසිල් නික්ලස් හපුආරච්චි හිටපු මීසම් සේවක පියතුමන් අතින් සිදුවිය. මීසම් සේවක ගරු ඉවාන් රසික කුරේ පියතුමා ගරු අජිත් සුරංග සහයක පියතුමා සමග ජ්‍යේෂ්ඨ පුරවැසි කමිටුවේ සභාපති ක්‍රිස්ටෝපර් සිල්වා මහතා ප්‍රමුඛ කමිටුව මීට දායක වූහ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**



හැඳල නායකකන්ද ක්‍රිස්තුරාජ සමිතියේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ට පදක්කම් පැළඳවීම මෙවර සංවත්සර උළෙලේදී සිදුකෙරින. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා විසින් සමිතියේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වූ ලෝරන්ස් මාදිවල මහතාට පදක්කමක් පැළඳවූ අවස්ථාව මෙහි දැක්වේ.

**නිමල් පෙරේරා■**

## හිඟුරාණ කල්වාරි පුදබිම

අම්පාර දිස්ත්‍රික්කයේ ගල්ඔය ව්‍යාපාරය තුළ පිහිටි හිඟුරාණ සීනි කර්මාන්ත ශාලාවේ සේවය කළ කතෝලික ජනතාව එදා පවුල් 120 පමණ විය. කිතුනු ජනතාවට ආගමික කටයුතු කරගෙන යාමට ස්ථානයක් නොතිබුණු කලෙක ගරු පියතුමකු හිඟුරාණට පැමිණ සීනි කම්හලේ සේවය කළ මහතකුගේ නිවසේ දිව්‍ය පූජා පැවත්විය. හිඟුරාණ කතෝලික සංගමයේ ඉල්ලීමක් මත ආගමික කටයුතු කරගෙන යාමට ස්ථානයක් ලබා දෙන ඉල්ලීම මත 1978 වසරේදී සංස්ථා පාලනාධිකාරය මගින් හිඟුරාණ සීනි කර්මාන්ත ශාලාවට අයත් භූමිභාගයක් දේවස්ථානයක් ඉදිකිරීමට පරිත්‍යාග කරන ලදි.

අක්කර 15 භූමිභාග යක විහිදුණු අඩි 100 පමණ උසට විහිදුන මුදුණක් ඇති ඇකුම්කලු ගල්තලාවකින් යුක්ත මෙම ඉඩම ලැබීමෙන් පසු ශු. අන්තෝනි මුනිතුමා නමින් දෙව්මඳුරක් ඉදිකරන ලද අතර ගරු ප්‍රැක්සිඩ් සිල්වා




පියතුමාගේ ප්‍රධානත්වයෙන් 1979 වසරේ ජූනි 23 දින ප්‍රථම මංගල්‍ය පූජාව පවත්වා ඇත.

හිඟුරාණ කල්වාරියේ ඉතිහාසය ගැන පොතක් ලිවිය හැකි කරුණු ඇත. ස්වර්ගස්ථ ඩබ්. ඩී. මැතිව් ගරු පියතුමා විසින් ලී කුරුස කිහිපයක් සාදා පළමු පාදනමස්කාරය සිදුකර ඇති අතර එය 1980 වසරේදී සිදුවිය. තාවකාලික ලී කුරුස වෙනුවට ජීවමාන ප්‍රතිමා තැන්පත් කළ යුතු බව යෝජනා වූයෙන් 1985 දී ගරු ප්‍රැක්සිඩ් සිල්වා පියතුමා එම ජීවමාන ප්‍රතිමා තැන්පත් කිරිමට මුලපිරීය.

ජාතින් අතර සමගියේ පුදබිම ලෙස ප්‍රසිද්ධියක් උසුලන හිඟුරාණ කල්වාරියේ පාස්කු දැක්ම සඳහා ඔබත් සහභාගිවීමට කැමැති නම් ගරු ක්‍රිස්ටි ප්‍රනාන්දු පියතුමා දුර:063-2222450 හෝ ජෝ බෙනඩික් වාස් දුර: 0777-850154 අමතා තම කැමබීම හා ස්ථානයක් වෙන්කර ගන්න.

**මැක්සිමස් රෝයි පෙරේරා**

## මාම්පුරිය වැල්ල බෝට්ටු මංගල්ලය

කල්පිටිය ප්‍රදේශයේ පිහිටි මාම්පුරිය වැල්ල ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික ‘බෝට්ටු මංගල්‍යය’ මෙවරද ධීවර ප්‍රජාවගේ සහ අති විශාල ජනතා සහභාගිත්වයෙන් පසුගියදා සිදුකරනු ලැබීය.

නුවාන, සන්ධ්‍යා මෙහෙය සහ මංගල්‍යය කටයුතු සේතාපොළ මීසම් සේවක ගරු සම්පත් ප්‍රසංග සහ සහයක ගර ජූඩ් චානක පියතුමන් විසින් මැනවින් සංවිධානය කර තිබිණි.


බෝට්ටු විශාල සංඛ්‍යාවක් දර්ශණීය ලෙස සරසා ප්‍රතිමාව රැගෙන පෙරහරක් විලසින් මුහුදේ සංචාරය කර මුහුද ආසිරි ගන්වනු ලැබීය. අනතුරුව සැදැහවතුන් ආසිරි ගන්වනු ලැබීය.

**ඇන්ටනි මෙරිල්**




රාගම සා. පේදුරු සහ පාවුළු දේවස්ථානයට අයත්, අංක 4 කිතුනු ඒකකයේ පවත්වාගෙන යන සතිපතා ජපමාල උච්චාරණය 100 වැන්න ගරු බෙන්සිරි පෙරේරා පියතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වුණි.

**මෙරිල් රාජපක්ෂ**



# මනස්ථාපනය වීමේ විශිෂ්ටතාවය



චතාරික කාලය, අප දිව්‍ය
ගැළවුම්කාර, ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ දුක් විඳීම, කුරුසියේ
හා විජයග්‍රාහී උත්ථානය අපට සිහිග
මෙම කාලය කිතුනු අපට ප්‍රසාදජනක
ති. එය ඇත්තටම ප්‍රසාදජනක කාලයක්
, අපගේ පාපිෂ්ඨ තත්ත්වය පිළිගෙන
නස්ථාපනයක් තුළින්, ජීවිත වෙනසක්
ගත හොත් පමණි. මෙවැනි
විච්ඡේදයක් අප වෙනුවෙන් වෙන්කර,
ව, අපට ලැබුණු භාග්‍යයක් කොට අපි
.

ලොව ජීවත්වන අප පාපිෂ්ඨකම්,
ම, බැරිකම් රාශියකට අප පාත්‍රවන
ැකවම පිළිගත යුතුවේ. "පවට නැමුම
මා මෙලොව උපන්නේ, කෙලෙස්
ුතුවයි මා මව්කුසේ පිළිසිඳුණේ"
යන් වන අප බොහෝ විට සිටින්නේ
න්ධකාරයේ ය. ඉඳ හිට හෝ අප ජීවිත
ාපසු හැරී බලා, ජීවිත අලුත් කරගත
වතොත්, එය මොන භාග්‍යයක් ද?
ාලයෙන් අප උපරිම ප්‍රයෝජන ගත
ාවේ ද?

සු සමිඳුන්, තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ
පවත්වනු ලැබූ දේශනාවේ මුල්
ීපය අප සිත් මවිත කරවන සුළුය.
ථාප වන්න, දේව රාජ්‍යය ආසන්නය"
ජොහාන් තුමා ද, එතුමන් ගේ
ව ආරම්භ කරන්නේත් එලෙසින්මයි.
ම මෙහි විශේෂත්වයක් තිබිය යුතු
ද? ඇත්තටම, පාපයේ භයානක කම,
පාපය නිසා මිනිසාගේ විනාශ වීම, දේව
සබඳතාව බිඳීයාම, දේව රාජ්‍යය අහිමි
කර ගැනීම, මේ සියල්ලක් පිළිබඳව,
ජනතාවට වටහා දෙන්නට හා එහි
ආදීනව එළිගන්වන්නට විය හැකිය.
මනස්ථාප වන්න! "මනස්ථාපනය
නොවුවහොත්, ඔබ හැමද එසේම
විනාශ වන්නහුය" මේ දෙව් වදන අපට
අනතුරු ඇඟවීමක් කරනවා නිසැකයි.
මනස්ථාපනය යනු, අපගේ මනස
ස්ථාපනය කර ගැනීමයි. සිත් වෙනස්
කර ගැනීමයි. මෙතෙක් අප ගමන්
ගත් මාර්ගය නවතා ආපසු හැරී බලා,
නිවැරදි මාර්ගයට පිවිස ගමන් කිරීමයි.
පාපයට දුක් වෙලා, හඬා වැළපිළා,
පසුතැවිලි වූ පමණින් පාපය අපෙන්
දුරුවන්නේ නැත. එයට අප නැවත
නැවත ගොදුරු වෙනවා. පාපය අත
හැර, එය පලවා හැර, ඉන් මිදී සිටිය ද
හැරී බැලූ විට නැවත පාපයට ඇයි මා
යන්නේ ඇදී?

මනස ස්ථාපනය කරගැනීමම, පාපයෙන්
මිදෙන්නට ගත් තීරණයක් සේ සැළකිය
හැකිය. ඒ තීරණය වඩාත් ඵලදායී කරගන්නට
සමිඳු දැතේ රැඳෙමින්, මේ චතාරික කාලය
තුළ සභාව අපට ඉදිරිපත් කරන වත්
පිළිවෙත්, මෙනෙහි කිරීම, දේව වචනය බෙදා
ගැනීම, නොයෙකුත් භක්ති අභ්‍යාසයන් තුළින්
සැබෑ මනස්ථාපනයක් ඇති කරගෙන ජීවිත
වෙනසක් අත්දකින්නට හැකිවෙතොත්...

"මනස්ථාපනය වීමට වුවමනාව නැතැයි සිතන සිල්වතුන් අනූ නව දෙනෙකුට වඩා මනස්ථාපනය වන එක පව්කාරයකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය ඇතිවන්නේ යයි මම ඔබට කියමි." (ලූක් 15:7)

✍ **රිචඩ් වික්‍රමසිංහ**
**බටගම**

---

දිව්‍ය සත්ප්‍රසාදීය ජේසුස් වහන්සේ ඉදිරියේ

## භාවනාත්මක යැදුමක්



ආදර සමිඳුනි,

එදා කල්වාරියේ දිවි පිදූ ඔබවහන්සේම අදත් දිව්‍ය යාගය තුළින් මා තුළට වඩිනවා. අද දින මා ඔබවහන්සේ හමුවට එන්නේ ඊයේ දවස ගිනිගත් මගේ හදවතට සිසිලක් ලබන්නයි.

පය තබනා පියවරක් පියවරක් පාසා ඔබවහන්සේගේ හඬ ළඟ ළඟම වාගේ ඇසෙන්නට වුණා.

"දියණියනි, ධෛර්යය ගන්න. ඔබේ ශ්‍රද්ධාව ඔබ සුවපත් කළේය." (මතෙව් 9:22)

ඔව් සමිඳුනි, එදා දොළොස් මසක් මහලේ රෝගයෙන් පෙළුන ස්ත්‍රිය ඔබවහන්සේගේ සළුවට පමණක් අත තැබුවහොත් තමන්ට සුවය ලැබෙනු ඇතැයි සිතා විශ්වාසයෙන් අත තැබුවා. විශ්වාසය නිසා ඇය සුවය ලැබුවා. එහෙත් ඔබවහන්සේ මගේ හදවත පමණක් සුවපත් කරන්න. මොහොතක් නිහඬව සිටි මට "බැගෑ සිතින් දෙව් සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය, ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය (මතෙව් 5:3) යන හඬ ඇසුණි. මම ඒ දෙව් වදන අයිති කර ගත්තෙමි.

✍ **අයිරින් කොස්තා**
**තුඩැල්ල**

---

## සමිඳුනි.... දිවිය පුදන්නම් මා



දූලි වලින් සැදි මිහිමත බිහිවුනු
වැලි කැටයක් වූ මා...
නැවතත් දූවිලි බවට හැරෙන තුරු
දිවිය පුදන්නම් මා...

දෙපයට පෑගී මිරිවැඩි සඟලේ
රැඳී ඉවත ගසනා...
කිසිම පලක් නැති වැදගැම්මක් නැති
විලස නොඉන්නම් මා...


එකමුතු බැම්මේ ලොවම එක්කරන්
සමිඳුන් ගොඩනගනා
ලැබේවි නම් ඉඩ රැඳී සිටින්නට
සතුටින් ඉන්නම් මා ...

✍ **පද්මා ප්‍රනාන්දු**
**දුම්මලදෙණිය**

---

"දේව රාජ්‍යය හඳුනාගැනීම සඳහා අවශ්‍ය වන සැබෑ ශ්‍රද්ධාව ඉල්ලා යාච්ඤා කිරීම, මහා ප්‍රාතිහාර්ය පතා දෙවිඳුන් යැදීමට වඩා අගනේය."

**(කුලියාපිටියේ රීටා සේනානායක)**




---

රිදුම් දී පාරවයි කටු ඇනී ඉරුණු ගත
රුහිර බිඳු ගලා යයි වල ගොඩැලි හැපුණු පය
නෙතින් රූරා හැලෙන කඳුළු වැල් පිසලන්න
අනේ මා හා ඉන්න ජේසුනි එදා ලෙස

ගල්කුලකි නගින්නට දිවි මගේ ඉදිරියට
වාරු නෑ පියලන්න විඩාබරවූ සිතට
එදා ගෙන ගිය ලෙසින් ඔබේ මිතුරන් තිදෙන
අනේ මා ගෙන යන්න අත නෑර මගේ අත

ධවල වර්ණෙන් දිලුනු ඔබේ වත දැකගන්න
සගපුරේ පියාණගෙ විභූතිය දැනගන්න
වර ලැබූ සිත දිනූ මිතුරු සේ සැනහෙන්න
කන්ද මුදුනෙදි මටත් ජේසුනී ඉඩදෙන්න

**නෙලී ප්‍රනාන්දු**
**දුම්මලදෙණිය**

---

## අපේ චතාරිකය

ගෙවයි ධර්මානුකූලව.. රකියි එක්වරු ශීලය
ලැදියි නිරතුරු පල්ලියට
කරයි පින්දහම් නිරතුරු අසරණයනට
පතයි පින්දහමින් සැපවත් ජීවිතය

කියයි මුසා බස් හොඳ හැටියටම
පතුරවයි කේලම් බස් සිත් සැටියටම
කරයි නින්දා අපහාස තම සොහොයුරකුටම
මරයි අනුන්ගේ සිත් නොසිතාම
සිතයි මා පමණක් උතුම් බව

සටනක් කරයි තනතුරු උදෙසා
සතුටක් ලබයි අනුන්ගේ පසුබැස්ම බලා
ඊර්ෂ්‍යා කරයි තව එකෙකුගේ දියුණුව ද බලා
ඇති කර ගති අධිමානයක් තමන් ගැනම සිතා

යටිසිත කියයි මේවා හොඳ නෑ කියලා
නමුදු, යටි සිත පරදා තම අරමුණු ඉටු කරලා
මෙයද? චතාරිකයේ මා ගෙවනා
ධර්මානුකූල ජීවිතය...

**මිලානි පෙරේරා**
**රත්තොට**

---

# දෙමාපියන් ලෙස චතාරිකයේ භූමිකාව

චතාරික කාලය ගැන නොදන්නා කතෝලිකයකු නොමැති වුවත් සියළු දේම නොදන්නා බව නොදන්නා කතෝලිකයන් ප්‍රමාණය වැඩි බව දැන් වැටහෙන්නේ චතාරික භක්ති අභ්‍යාසයන් කෙරෙහි අවධානය යොමු කරන විටය.

ගරු පියතුමන් විසින් සෑම මීසමකම අප කතෝලිකයන් තුළ නොයෙක් ආකාරයේ සිත් බැඳගත් දේශනා වලින් සිත් කාවද්දන්නේ අප අලුත් විය යුතු බවටයි. අප කැඩිය යුතු බවටයි. මර්ධන ක්‍රියා කළ යුතු බවටයි. භක්ති අභ්‍යාසයන් කළ යුතු බවටයි. ඒ මඟින් පශ්චත්තාපය වැළඳ ගත යුතු බවටයි.

ඇත්තෙන්ම අපි අලුත් විය යුත්තේ ඇයි? කැඩී යා යුත්තේ ඇයි? පශ්චත්තාප විය යුත්තේ ඇයි? හේතුව අප ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට හේතු වුණා. අපේ සෑම ක්‍රියාවක්ම එයට හේතු වුණා. අපේ පව් කිරීම් සෑහෙන ප්‍රමාණෙකින් වැඩි වී තිබෙනවා. එය සත්‍යයයි. අපි ප්‍රධාන වැරදිකාරයන් බව ජනමාධ්‍ය වලින් දර්ශනය වන සිදුවීම් වලින් අපට සිතා ගැනීමට පුළුවන.

පශ්චත්තාප විය යුතු නම් අපේ වැරදි පිළිගත යුතුයි. කුමන තරාතිරමක පුද්ගලයකු වේවා කතෝලිකයකු නම් තම වැරදි වලට පසුතැවිලි විය යුතු විශේෂිත කාලයයි මේ චතාරික සමය.




සමාජයේ නොයෙක් ආකාර වැරදි දේ සිදුවන්නේ පුද්ගලයකුගෙන් නම් ඒ පුද්ගලයා කරන හොඳ හෝ නරක සමාජය මනින්නේ ඒ ඔහුගේ නොපෙනෙන දෙමාපියන්ගෙනුයි. එතකොට මේ හැම කෙනෙක්ම යම් කිසි පවුලකට අයත් අය වෙනවා. පවුලේ ආභාෂය අනුවයි ඒ පුද්ගලයන්ගේ චර්යාව හැඩ ගැසෙන්නේ.

ශුද්ධවූ පවුලක් නම්, පෙළපත් කතෝලිකයන් නොවිය යුතුයි. එදිනෙදා ජීවිත රටාව අනුව සාර ධර්මවලින් හෙබි ආගමානුකුල පූර්ණ පවුලක් විය යුතුයි. එසේ වීමට නම් මව්පිය සම්බන්ධතාවය පැහැදිලිව පවුලට එකතු විය යුතුයි. පවුලක දූ දරුවන් යහපත් ලෙස හැඩගැස්වීමට මව මෙන්ම පියාට ද ඇති කාර්යභාරය ඉතාමත් වැදගත් වේ.

ඒ නිසා මේ චතාරික සමයේ ප්‍රධාන වශයෙන් මවක් පියෙක් හැටියට පශ්චත්තාපී වී වෙනස් විය යුතුයි. තමන් අතින් පවුලේ සමගියට, එකමුතුකමට සිදුවුණු හානිය තේරුම් ගත යුතුයි. නිවැරදි මඟට පිය මැනිය යුතුයි.

මව හා පියා එකිනෙකාට බැහැපත් වෙමින්, තේරුම් ගනිමින් තම ආධ්‍යාත්මය ගොඩනඟා ගැනීම තුළින් යහපත් දූ දරුවන් සමාජයට ගෙන යාමට හැකිවනු නොඅනුමානයි. පවුල් දිවිය අර්ථවත් කර ගන්නට මේ චතාරිකය තෝතැන්නක් කර ගැනීම අප සැමගේ වගකීමයි.

✍ **ක්‍රිස්ටෝපර් සිල්වා**
**කෝපියාවත්ත**



## ඉන්න දෙන්න ඔබ තුරුලේ..



සමිඳුනි ඔබ අභියස
පිපි කුසුමක් කළ මැන
ඔබටම පිදෙන්න...
එළිය කළ මැන මා දිවිය
ගෙන එන්නට මා මිතුරු
ඔබ වෙතටම...
සවිය දෙන්න මා හට
බාධා ජයගෙන යන්න
මේ දිගු ගමන...
දෙන්න මට එක්වරයක්
ඉන්නට ඔබ තුරුලේම
මා හට සදහට...

✍ **සිතාරා ශෂිකා**
**පන්නිපිටිය මීසම**

## ළ යුතු අඩු බදාදා

ජුදා ජනතාව
න් කරන වැරදි
පන්වා දුන්නා
නාව ඒවා නිවැරදි
නම් ඔවුනට සිදුවන
වහන්සේ සිය
න් උපමා උපමෙය
පැහැදිලි කළා.
ය තුළ සිදුවූ වැරදි
වහන්සේ නිර්දය
ර ගසා කතා කළාක්
වැරදි කරන ලද
කයන්ට විරුද්ධව
න් විවේචනාත්මක
ාක් මෙන්ම ඒ
වැරදි නිවැරදි
ට ක්‍රියා කරන
දෙස් දීමක් ද කළා.
න් වහන්සේ එදා
ප්‍රභූවරු නියැලී
දූෂණ හා වැරදි
විවේචනය කිරීම
රුස්සන්නාක්
නිසාම
ස්ව විනාශ කිරීමට
ත් සොයමින්
කස් කරන්නට
නයේදී අවස්ථාව
ට තමාගේම
වරයකුට මුදල් දී
ස්ව අල්ලාගෙන
ඇණ ගසා මැරීමට
ිමය පසුබිම
සකසන්නට විය.

බරපතළ වැරදි අපරාධ කරන අය කුරුසියක ඇණ ගසා මැරෙන තුරු එල්ලා තැබීම එදා සමාජයේ බරපතල වරදකරුවකුට පැවති ප්‍රධාන දඬුවමකි. ක්‍රිස්තුන් වහන්සේ වැරදිකාරයෙක් නොවන බැවින් ප්‍රධාන දඬුවම වන කුරුස ගසේ එල්ලා මැරීමට අවශ්‍ය කරුණු රැස්කර බොරු චෝදනා ගොනුකර ඒවා නීත්‍යනුකූල කරන්න. උන්වහන්සේ අල්ලාගත් අයගේ අභිප්‍රාය වුණා.

ඒ අනුව ජේසුස් ක්‍රිස්තුන් නමැති සාමය ලොවට හඳුන්වා දුන් ඒ උතුම් බලපරාක්‍රමයාණෝ කුරුසිය මත ඇණ ගැසුම්කා තුරු දුක්වේදනා විඳ අප වෙනුවෙන් දිවි දුන්නා පමණක් නොව අපහට නවතම සම්පූර්ණ දහම් මාර්ගයක් ද පෙන්වා දුන් සේක. ඒ දහම් මාර්ගය අනුව අප ජීවිත ගත කිරීමට කිසියම් හෝ උත්සාහයක්වත් ගත යුතුව ඇත.

✍ **ගාමිණී පිටර්ස්**
**පයාගල**

## ාරික සිතුවිලි



දා...
යා ගිය ගමනේ මද්දහනේ
කාන්තාව එහි මුණ ගැසුනේ
යක වත ගොත
කෙරුණෝ
ියම ඔබ දුටු තැනමයි
ුණෝ

..
ට ඇදෙනා ජීවිතයට හමුවෙම්දෝ?
න තුරු සැමදා රැඳී සිටිම්දෝ?
ඔබ මා හා දොඩමළු වෙම්දෝ?
ළිඳ ළඟ කවදා ඔබව දකිම්දෝ?

යයි සමිඳුනි ඔබ මා සිත සනසන්නේ
යි සමිඳුනි මගෙ ජීවිතයට පණ දෙන්නේ
ිතටයි ආදරෙ ගලා හැලෙන්නේ
ය නොවන ජලය ඔබ පමණයි මට පොවන්නේ

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

## සභාවක උපත

'ඔවුහු සියල්ලෝ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වී ආත්මයාණන් ඔවුන්ට දුන් කතා ශක්තිය ලෙස අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන් ගත්හ' යනුවෙන් කියැවේ (ක්‍රියා 2:4) ශුද්ධාත්මයාණන් විසින් දූත මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ දී ජේසුස් වහන්සේ මඟ පෙන්වනු ලැබුවාක් මෙන් ශ්‍රාවකයන්ද තම දූත මෙහෙවර තුළ ශුද්ධාත්ම මග පෙන්වීම ලබනු ඇත. මෙහිදී අන්‍ය භාෂාවලින් කතා කිරීම යනුවෙන් අදහස් වන්නේ, ඔවුන් විසින් කරනු ලබන ප්‍රකාශය, භාෂාව හා සංස්කෘතිය ආශ්‍රිත සියලු බාධක අභිබවා ජයගන්නා බවයි. මෙය කිතුනු පණිවුඩයේ විශ්වීය ස්වභාවය අවධාරණය කිරීමකි. විවිධ සංස්කෘතික පරිසරයන් ගෙන් මෙන්ම, විවිධ ජාතීන් අතරෙන් ද එහි පැමිණ සිටි සියල්ලන් අපෝස්තුළුවරුන් ප්‍රකාශ කළ දෑ වටහාගත් බැව් පෙනේ. (ක්‍රියා 2:7-117) මෙහි දී දක්නට ලැබෙනුයේ, බාබෙල් කොත සිද්ධියේ සඳහන් කරුණු ආපස්සට හැරවීමකි. (උත්. 11:1-9) පෙන්තකොස්ත මංගල්‍ය සඳහා ජෙරුසලෙමේ රැස්ව සිටි ජුදා ජනතාව තුළ වූ වැරදි අවබෝධය දුරු කිරීම සඳහා පේදුරුතුමා තම දේශනය පැවැත්වූ බව පෙනේ. (ක්‍රියා 2:13). පුරාණ ගිවිසුමේ අපේක්ෂාවන් සමාප්තියට පත්වීම ලෙස, ජේසුස් වහන්සේගේ මරණය හා උත්ථානය විස්තර කිරීමෙන් අනතුරුව, පේදුරු තුමා උත්ථානය පිළිබඳ සුබාරංචිය ප්‍රකාශ කරයි. (ක්‍රියා 2:22-36). එයට ප්‍රතිචාර දැක්වීමක් ලෙස, තුන්දහසක් පමණ ජනතාව නව ජීවිත මාර්ගය වැළඳගනිති. එලෙස ජුදා පෙන්තකොස්තයෙන් පසුව ජුදා කිතුනු සභාවක් උපත ලබයි.

☛ ලබන සතියට



## අත්දුටිමි

එකල මම දඟකාර පාසල් ශිෂ්‍යාවක්මි. මගේ නැගණියත් තවත් පාසල් ළමුන් පිරිසකුත් සමඟ ගෙදරට නොදන්වා 2.30 ට පෙන්වන චිත්‍රපට දර්ශනයක් නැරඹීමට ගියෙමු. චිත්‍රපටය "රන්මුතු දූව"යි. ඒ වන විට මං කිසිදිනක දුම්රියේ ගමන්ගොස් නොතිබුණි.

චිත්‍රපටය අවසන් වී දුම්රියෙන් අප ආපසු ඒමට තීරණය කළෙමු. ජා-ඇලින් දුම්රියට නැගුන අපගේ ගමනාන්තය වුයේ කටුනායක දුම්රියපළයි.

දුම්රිය නැවැත්වීමට මන්ද ගාමීව යන විට මා සිතුවේ දුම්රියෙන් බැසිය යුතුයි කියා. මා කළබල වී ඉක්මනින් දුම්රියෙන් පැන්නෙමි. දෙවියන්ගේ පිහිටෙන් මා විසිවී වැටුනේ දුම්රිය වේදිකාව මතටයි. මට කිසිදු තුවාලයක් සිදු නොවීය. මා දැන් වියපත්වී සිටිමි.

මා ඉගෙනුම ලැබූ කන්‍යාරාමයේ පැවිදි සොයුරිය කියාදුන් ලෙසින් මා සැමදා උදෑසන අවදිව දේවමාතාවන්ගේ ආරක්ෂාව පතා "නමෝ මරියනී" යැදුම උච්චාරණය කරන්නෙමි. එම යැදුමේ බලයෙන් එදා මගේ ජීවිතය හානිවීම හෝ දෙපා අහිමි වීම නොවී මා බේරුණ බව අදත් මම විශ්වාස කරමි.

මගේ දෙපා අහිමි වූවා නම් කියා සිතෙන විට දේව මාතාවන් සිදුකළ එම ප්‍රාතිහාර්යයේ බලගතු බව අදත් මා සිහි කරන්නේ කඳුළු පිරි දෙනෙතිනි.

අසරණව සිටින විට දී දේව අම්මාගේ මැදහත්කම තුළ දිව්‍ය වෛද්‍යවරයාණන්ගේ සුවය මා ලැබූවාර අනන්තයි. මාගේ ජීවිතය තුළ සැමදා මම දේවමාතාවන්ගේ ප්‍රාතිහාර්යමය බලය අත්දකිමි.

මරි මව් තුළ විශ්වාසයෙන් දෙවිඳුන්ට ළඟා වන්නට ඔබටත් ආරාධනා කරමි.

✍ **අයිරාංගනී උඩුගම්පල**
**රද්දොළුගම**

## මරිය තුමිය මැදි කරගෙන යන වන්දනා ගමන...

**පසුගිය සතියෙන්**

දේව මෑණියන් වහන්සේ සහ ජුසේ තුමා දිව්‍ය බිළිඳාණන් රැගෙන එජිප්තු දේශයට යාමේදී දිනක් රාත්‍රියේ සොරුන්ගේ ගුහාවක නතර වීමට සිදුවිය. සොරුන් සමඟ කුෂ්ඨ රෝගයෙන් පීඩිත ළදරුවකු වඩාගෙන උන් ස්ත්‍රියක සිටියාය. උන්වහන්සේගේ අති මහත් දිළිඳුකම නිසාත් අති මහත් බැහැපත්කම නිසාත් යහපත් චාරිත්‍ර විලාස නිසාත් ඒ සොරු උන්වහන්සේ වෙත දයාවෙන් යුක්තව සිටියෝය.

එහෙයින් දේව මෑණියෝ දිව්‍ය බිළිඳා සේදීමට වතුර ටිකක් ඉල්ලූ සේක. ඒ ස්ත්‍රිය වහාම ගොස් වතුර ගෙනැවිත් උන්වහන්සේට දුන්නාය.
දේවමෑණියන් වහන්සේ දිව්‍ය බිළිඳා සේදූ පසු ඒ ස්ත්‍රිය දිව්‍ය බිළිඳා බලමින් මහත් ආශ්චර්යමත් වී ඒ වතුර රැගෙන එයින්ම තම දරුවා සේදුවාය. ඒ වෙලෙහිම කුෂ්ටය ළමයාගෙන්
පහවී සම්පූර්ණයෙන් සුව පත්වුණා දැක කිව නොහැකි මහත් සන්තෝෂයක් ඒ ස්ත්‍රියට ඇති විය. දීමස් නමැති මේ ළදරුවා වැඩිවියට පැමිණ තම පියාගේ අඩි පාරේ ගමන් කර නොයෙක් අපරාධ කළ තැන හේවායින්ට අසුවී ජෙරුසලමට ගෙන යනු ලැබ කුරුසියෙහි ඇණ ගසන්නට තීන්දු කරන ලද්දේය. මොහු ජේසුස් ස්වාමින් වහන්සේගේ දකුණු පස සිටියදී දේවමෑණියෝ කුරුස පාමුල සිට යාච්ඤා කළායින් පසු මොහුගේ සිත හැරී ඥානාලෝකය පහළ වී ජේසු ස්වාමින් වහන්සේ දෙස බලා "ස්වාමිනි ඔබවහන්සේගේ රාජ්‍යයට තේජස්ශ්‍රීයෙන් වඩින කල මා සිහි කළ මැනැවැ"යි යාච්ඤා කළේය. ජේසුස් ස්වාමින් වහන්සේ උත්තර දෙමින් "සැබැවින්ම අද නුඹ මා සමඟ ස්වර්ගයෙහි සිටින්නේ යැයි වදාළ සේක."

- නිමි -

✍ **දොන් වින්සන්ට් රූපසිංහ**

# පළාත් සභා සඳහා කිතුනු දායකත්වය

**කතුතුමනි,**

අබ ඇටයේ කථාව පොළොවේ ලුණු ආදි උපමා කථා යථාර්ථයක් කරමින් රටේ ජනගහනයෙන් 6% ක් පමණ කතෝලික වන අතර දකුණු, බස්නාහිර පළාත් සභාවට සෑම පක්ෂයකින්ම එඩිතර කොන්දක් ඇති කතෝලිකයින් ඉදිරිපත් වීම තුළින් අප සියල්ලන්ට මෙම අනගි අවස්ථාව පැහැර නොහැර අපගේ කෙටි ජීවිත කාලය තුළදී දෙවිඳුන්ට ප්‍රසන්න ලෙස උපරිම සහයෝගයක් ලබාදීම කතෝලික අපගේ අයිතියකි, යුතුකමක් ද වන්නේමය.

කතෝලික අපට ඇත්තේ කුමන නිදහසක්ද? ඕනෑම රටවැසියකුට ජාතිය ආගම අරභයා උසස් තැන්වලට යාමේ නොහැකියාවට සාධාරණය ඉටුකිරීමටත් සුළු ජාතික සුළු ආගමික ලෙස නොසලකන සම මිනිස් අයිතීන් වෙනුවෙන් ක්‍රියා කිරීමටත් සුළු ජාතීන්ට සුළු ආගමිකයන්ට රජයේ නොලැබෙන රැකියා ජන අනුපාත නැංවීමේ වරප්‍රසාද දීමනා වෙනුවෙන් ක්‍රියාත්මක වීමටත් රටේ නීතියට පටහැනි නීතිය මැරබලය අතට ගත් ආගමික සංවිධාන වලට එරෙහි වීමටත් සාධාරණය ඉටුකිරීමටත්, රට සංවර්ධනය කිරීමටත් මෑතකදී සිදුවූ වැලිවේරිය ජල ප්‍රශ්නයේදී කතෝලිකයන්ට සිදුකළ නින්දිත මරණ ම්ලේච්ඡ පහරදීම් අසාධාරණ මිල වැඩි කිරීම් හේතුවෙන් රැකියාව කර ජීවත්වීමට නොහැකිව ධීවරයින් භූමිතෙල් සලාකය ඉල්ලා සිටි විට තිරිසන් ලෙස පහර දී තරුණයකු මරා දමා කතෝලිකයින් මර්ධනයටත්, අර්ථ සාධකය රැකගැනීමට යාමේදී කතෝලික තරුණයකු කෲර ලෙස වෙඩිතබා ජීවිතය නැති කිරීම ආදියෙන් අප අසාධාරණයට අයුක්තියට එරෙහිව යුක්තිය වෙනුවෙන් දේව මැදිහත් කම මත කතෝලික අප මරණයට වුවද නොබියව මුහුණ දීමේ හැකියාව ඔප්පු කර ඇත. තමන් කැමති පක්ෂයකට පළමු මනාපය සටහන් කර මනාප ඡන්ද ක්‍රමය යටතේ ඇති මනාප තුනම හෝ මනාප තුනෙන් දෙකක් අනිවාර්යෙන් කතෝලික අපේක්ෂකයන් වෙනුවෙන් භාවිත කිරීමට සියළුම කතෝලික ඡන්ද දායකයින් උත්සුක වීම තුළින් සියළුම කතෝලික ඡන්ද අපේක්ෂකයින් දිනවීමට අපට හැකිවනු ඇත.

**මෙරිල් පෙරේරා**
වැලිවේරිය

# පවුල් ගස් හදන්නට අතදෙන්නේ ජනතාවයි

**කතුතුමනි,**

බලය ඇත්තන් විසින් තම බලය එලෙසම යොදවමින් වරින්වර පැවැත්වෙන ඡන්ද ප්‍රජාතන්ත්‍රවාදී රටකට නොගැලපෙන්නාක්මෙන්ම කිසිදු ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක්ද නොවේ. මෙය රටේ තත්ත්වය පිළිබිඹු වීමට ද බාධාවකි.

මේ කියන්නට යන්නේ තවත් දෙයකි. අද අප රට තුළ බලයට හිමිකම කියන්නේද එකම පිරිසකි. ස්වාමි පුරුෂයාගෙන් (මැරුණු හෝ ලෙඩ වූ විට) භාර්යාවට, පියාගෙන් පුතාට පුතකු නැති විට දුවට, නෑනාට මස්සිනාට, ඥාති දියණියට පුතාට යන දේශපාලනයකි. දැන් අප රට තුළ දැකිය හැකි වන්නේ. නායකත්වයට, පාලනයට සුදුස්සන් එමටය.

උගතුන් එමටය. එහෙත් ඔවුන් දේශපාලන පවුල් වලට අයත් නොවන නිසා නැතිනම් මුදල් නැති නිසා බලපෑමක් නොකළ හැකි නිසා ඔවුන්ට කිසි විටකත් දේශපාලනයට සම්බන්ධ විය නො හැකිය. දේශපාලනයට එන්නට හැක්කේ එකම පවුලේ අයටය. බලය ඇත්තන්ටය.

එසේනම් මෙම තත්ත්වය නැති කළ හැක්කේ පවුල් දේශපාලනය නැති කළ හැක්කේ සුදුස්සන් පත් කළ හැක්කේ කාටද? ජනතාවටය. ජනතා බලය නිසි ලෙස භාවිත කර පවුල් දේශපාලනය කඩා සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක්, ජනතා පරමාධිපත්‍යයක් ගොඩනැගීමට මෙවර ඡන්දයේදී ඉටා ගනිමු.

තවත් කිව යුතු දෙයක් ඇත. විවිධ ක්‍රමවලින් ජනතාව සූරා කෑමට හුරුවූ බැටලු හම් පොරොවා ගත් වෘකයන් ද මෙවර ඡන්දයට ඉදිරිපත් වී සිටින බව පෙනෙන නිසා ඔවුන්ගෙන් ද පරෙස්සම් වීමට ඉටා ගනිමු.

**ජස්ටින් වර්ණකුලසූරිය**
මීගමුව

# මරිය හමුදා නම වෙනස් කරන්නේ කුමට ද?

**කතුතුමනි,**

මරිය හමුදාව ආයතනයක් නොව සමිතියක් බවත් එය 1921 සැප්තැම්බර් මස 07 වන දින එනම් දේව මාතාවහන්සේගේ උපන්දිනයට පෙරදින අයර්ලන්තයේ දී ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය තුළ ප්‍රැන්ක් ඩප් මහතා විසින් ආරම්භ කරන ලදී.





මරිය හමුදාව මුළු විශ්වය පුරා ව්‍යාප්ත වී ඇති බව නොරහසකි. මරිය හමුදාව සතු අත්පොතක් ඇති බවත් ඒ අනුව සතිපතා රැස්වීම් පවත්වන එකම සමිතිය බවත්, මීසමේ පියතුමාගේ මඟපෙන්වීම සහ සභා ශ්‍රේෂ්ඨයන්ට අවනතව කටයුතු කරන සමිතියකි. තවද රැස්වීම් පැවැත්වීමේදී දේව මාතා ප්‍රතිමාව ඉදිරිපිට ශුද්ධවූ ජපමාලය උච්චාරණ කිරීමෙන් ආරම්භ කැරේ. අපට ඇති එකම ආයුධය ශුද්ධවූ ජපමාලය බවත් දේවමාතාවන්ට මංගලම් කී බයිබල් පාඨය දිනපතා උච්චාරණය කිරීමට ද අපට ඇති ආයුධයන්ය.

විශ්වය තුළ ඇති දේව මාතාවන්ගේ සමිතිය මෙය පමණකි. එහි නම වෙනස් කිරීමට කිසිවකුට අයිතියක් නැති බවත් අයර්ලන්තයේ කොන්සිලියම් සභාව මගින් පාලනය වන බවත් දන්වා සිටිමි. 2013 ඔක්තෝබර් ඔබ තුමාගේ කතුවැකියද එය මනාවම පැහැදිලි කර දෙයි. මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පීටර් කැමිලස් සුබසිංහ මහතා වෙත අපගේ බලවත් කණගාටුව ප්‍රකාශ කර සිටිමි.

**සනී ප්‍රැන්සිස් ප්‍රනාන්දු**
**සභාපති**
ලංකා අප ස්වාමිදුවගේ කොමිටිසියම - කොළඹ

# ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රචණ්ඩත්වය

**කතුතුමනි,**

එදා සුදු අධිරාජ්‍යවාදින්ගෙන් මේ රට බේරා ගැනීමට උගත් සමාජය වෙහෙසුනි. එහි ප්‍රතිඵලයක් ලෙස 1932 දී මේ රටට ඩොනමෝර් කොමිසම යටතේ බලය ලැබුණි. දිස්ත්‍රික්ක 22 ක් යටතේ එක් දිනකදී හෝ දින දෙකකදී මැතිවරණ පැවැත්වුනි. වර්ෂ 1948 දී සොල්බරි කොමිසම යටතේ පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වුණි. අග්‍රාණ්ඩුකාර සොල්බරි සාමි මැතිතුමාගේ බලතල යටතේ එංගලන්ත මහා රැජිනගේ වගකීම් සහිතව අගමැති තුමකු යටතේ මේ රටේ පාලන බලය පැවතුණි. අගමැති තුමාගේ තේරීම අනුව මන්ත්‍රී මණ්ඩලයෙන් උගත් ඇමැති මන්ඩලයක් පත්කෙරුණි.

එදාත් නාම යෝජනා භාරදීමෙන් පසුව ඒ ඒ අපේක්ෂකයින්ගේ ඡන්ද රැස්වීම් පැවැත්වුනි. සමහර අවස්ථාවලදී සුලු සුලු ගැටුම් ඇතිවිය. නමුත් මෑත කාලයේ මෙන් විවිධ පක්ෂවල අයගේ බැනර් කටවුට්වලට හානි නොකළේය. රජයේ වාහන පොදු දේපල කිසිවක් මැතිවරණ කටයුතුවලට යොදා ගත්තේ නැත. අද එක එක පක්ෂවල අය හා මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම් මැතිවරණ කොමසාරිස් තුමාට නොයෙකුත් විදියේ පැමිණිලි ඉදිරිපත් කරති. කොපමණ මැසිවිලි ඉදිරිපත් කළත් මහත්මා දේශපාලනය කරන එකම පක්ෂයක්වත් නොමැති බව කණගාටුවෙන් මෙහිලා සඳහන් කරමි. රාජ්‍ය මන්ත්‍රණ සභාවෙන් පසුව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය ඇරඹුණි. එතැන් සිට මේ දක්වා යම් යම් ධනවත් පවුල්වල අය මේ රටේ පාලන බලය ගත්තේය.

අද වෙන විට මේ රටේ පාලන තන්ත්‍රය භාර ගැනීමට උගත් නූගත් බොහෝ දෙනෙක් දත මැත දොඩවති. සමාජයේ වෙසෙන බොහෝ දෙනෙක් ඇඟ බේරාගෙන කටයුතු කරන බවක් පෙනේ. අද පළාත් සභාවට ඉදිරිපත් වී සිටින සෑම දෙනාම මැතිවරණය දිනපු විදියට වහසි බස් දොඩවති. සමහරෙක් මම තමයි මෙදා මහ ඇමැති කියාද දොඩවති.

මේ අය රටට සේවය කිරීමට ඇප කැපවෙන අයනම් මහජන හිත සුව වෙනුවෙන් වැඩ කරන අපේක්ෂකයින් විය යුතුය. රටේ කෘෂි කර්මාන්තය හා අත්කම් හා වෙනත් හැකියාවෙන් ප්‍රයෝජනය ගත හැකි තරුණ තරුණියන් සඳහා නිෂ්පාදනාගාර ඇති කර ඒ භාණ්ඩ විකුනා ගැනීමේ වෙළඳපොල ඇතිකර දිය යුතුය.

ඉදිරි පළාත් සභා මැතිවරණය සාමකාමි දැහැමි මානව හිතවාදී එකක්ම වේවා කියා යාච්ඤා කරමි. තවම අපි සියලුම දෙනා දෙවියන් වහන්සේගේ මැවිල්ලේ දූවිල්ලක් පමණක් බව හිතා කටයුතු කරමු. අපි මොනදේ කළත් දෙවියන් වහන්සේට හොරෙන් නොකළ හැකි බවද සිහියේ තබා ගනිමු.

**රන්ජන් පල්ලෙවෙල**
කදිරාණ

# අපේ පාසල් රැකගනිමු

**කතුතුමනි,**

මෙරට කතෝලික සභාව සතුව තිබූ කිතුනු පාසල් රජයට පවරාගැනීම හේතුවෙන් එම පාසල්වල තිබූ කිතුනු පරිසරය, කිතුනු අනන්‍යතාවය, වත් පිලිවෙත් හා විනය ආදිය ක්‍රම ක්‍රමයෙන් පිරිහී ගිය බව රහසක් නොවේ. එබැවින් මේ වනවිට එහි අයහපත් ප්‍රතිඵල භුක්තිවිඳීමට සිදුවී ඇත.

කෙසේ වෙතත් වර්තමානයේ දී අප කිතුනු පාසල්වල ඉහත කී ගුණාංගයන් තරමක් හෝ දුරට රැකගනිමින් ආරක්ෂා කිරීමට කිතුනු ගුරු භවතුන් හා ගරු පූජාප්‍රසාදීන් වහන්සේලා ගන්නාවූ උත්සාහය ද අගය කළ යුතුය. එම නිසාම කිතුනු දෙව් මැඳුරු ආශ්‍රිතව පිහිටා ඇති කිතුනු විදුහල් තම නාමයේ ගෞරවය ආරක්ෂාකර ගනිමින් විවිධාකාර වූ බාධකයන් මැද වුව ද තම අනන්‍යතාවය රැකගැනීමට උත්සාහ දරති.

එහෙත් මෑතක සිට ක්‍රියාත්මක වන්නාවූ පාසල් වර්ගීකරණය හෙත්වෙන් 1-11 දක්වා ශ්‍රේණි පවත්වාගෙන ගිය කිතුනු විදුහල් ද නීති ප්‍රකාරව මේ වනවිටත් වසරින් වසර ශ්‍රේණි අඩු කරමින් 1-5 දක්වා ශ්‍රේණි පැවැත්වෙන විදුහල් බවට පත්වෙමින් පවතී. කිතුනු පරිසරයක් තුළ විනයානුකූලව හැදුනු වැඩුනු අප දූ දරුවන් 6 ශ්‍රේණියේ සිට අධ්‍යාපනය කරා පිය නගනුයේ එවන් පරිසරයකින් තොර වූ වෙනත් විදුහල් කරා වීම වැලැක්විය නොහැකිය. තවද මෙවන් තත්ත්වයන් තුළ ආර්ථික අපහසුතා නිසා දුර බැහැර විදුහල් කරා තම දරුවන් යැවීමට අපොහොසත් වන්නාවූ දෙමාපියන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනයට කණ කොකා හඬන බවට සැක නැත.

තවද මෙම ක්‍රම වේදය තුළින් පහසුකම් සහිත විදුහල්කරා පිය නැගිය හැකි දරුවන් ඇනුමින් දුරස්ථ වුවහොත් ඉන් ඇතිවන ප්‍රතිඵලය කුමක් විය හැකිද? මෙහි ආදීනව අද හෙට දැකිය නොහැකිය. මේ වනවිටත් විවිධාකාර වූ පීඩනයන්ට මුහුණ දෙමින් තම විශ්වාසය රැකගන්නා කිතුනු ජනතාවගේ ඉදිරි අනාගතය අඳුරු කරලීමේ සූක්ෂම ක්‍රියා දාමයක් මෙම ක්‍රම වේදය තුළ ගැබ්ව ඇත්දෝයි සැක පහළ වේ. එබැවින් මේ පිළිබඳව වමිසිලිමත් වීමත් මෙවන් තත්ත්වයක් හමුවේ ඉදිරි පියවර ගැනීමත් අප සැමගේ වගකීමක් වන අතර ගතයුතු පියවර ගැනීමට තවත් කල් යැවිය යුතු ද නොවේ.

**ලෙස්ලි වර්ණකුලසූරිය**
කට්ටිමහන

# 'විමසුම' හා විග්‍රහය


**කතුතුමනි,**

පසුගිය පෙබරවාරි 1 වැනි දින රාත්‍රී 7 ස්වාධීන රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශයෙන් පසුව කෙරෙන 'විමසුම' සම්බන්ධවයි. එය ලියන මහින්ද අබේසුන්දර මහතා එදින කථා කළේ හැඳල ලාදුරු රෝහල සහ ලාදුරු රෝගීන් පිළිබඳවය. මුලින්ම සඳහන් කරන්නට යෙදුනේ බයිබලයෙන් පවා ලාදුරු රෝගීන් කොන්කරනු ලැබූ යුගයක් ගැනත් දැන් මෙන් වෛද්‍ය විද්‍යාව දියුණු යුගයක ලාදුරු රෝගීන් එසේ කොන් කිරීමකට ලක් නොකරන බවත්ය.

වෛද්‍යවරුන්ට එකී රෝගීන් සුව කරන්නට, සොයා ගැනීම් කරන්නට ඥාන ශක්තිය ලැබෙන්නේ දෙවියන්ගෙන් බව අබේසුන්දර මහතා නොදන්නවා විය හැකිය. බයිබලය ගැන හරිහැටි නොදැන එහි ඉගැන්වීම් හා අතීතයේ සිදුවූ දේ හරියාකාරව නොදැන යම් යම් දේ සඳහන් කිරීම කොතරම් දුරට සාධාරණද? ස්වාධීන රූපවාහිනී සේවය නිතර කතෝලික දහමට ගරු නොකරන බව පෙනේ.

උත්සව අවස්ථාවන් හීදි පැමිණ සිටින පූජක පැවිදි අය ප්‍රදර්ශනයේදී පියතුමකු සිටින තැන එය නතර කරන අවස්ථා අප බොහෝවිට දැක ඇත.

**මේරි ක්ලෙයා ද සිල්වා**
මොරටුව



# මෙවර බස්නාහිර පළාත් සභාවට තරග වදින කතෝලික අපේක්ෂකයෝ කොටසක්

බස්නාහිර පළාත් සභාවට තරග වදින සියළුම පක්ෂවල කතෝලික අපේක්ෂකයින් හඳුන්වා දෙන පියවරේ අවසන් අදියරයි මේ. කතෝලික ආධ්‍යාත්මය තුළ අවංක, හරයාත්මක දේශපාලන ගමනක් යන්නට කතෝලික අපගේ ඡන්දය අප සහෝදර සහෝදරියන් වෙත ලබා දීම අප සතු යුතුකමක් බව අමතක නොකරමු. ශ්‍රී ලාංකීය දේශපාලන අඹරේ හෙට දවසේ පායන අවංක තරු සේ ඔවුන් මඟ සකසන්නට අපටත් යුතුකමක් ඇත.



## පංචරත්නම් රාම්

**- කොළඹ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 14**

කොටහේන සා. ලූසියා ආසන දෙව්මැඳුරේ මීසම් වාසියකු වන රාම් කතෝලික පාසල්වල හා දහම් පාසල් සංවර්ධන කටයුතු වලදී නොපැකිලව ඉදිරිපත්ව ආධාර කරන්නේ ය. ප්‍රදේශයේ මුඩුක්කු වාසී ජනතාවගේ සුබ සිද්ධිය සහ අභිවෘද්ධිය උදෙසා කටයුතු කරමින් සිටී.

## එක්සත් ජාතික පක්ෂයේ කතෝලික අපේක්ෂකයෝ



### රොඩ්නි ෆ්‍රෙසර්

**- කොළඹ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 34**

ප්‍රකට කලාකරුවකු, රංගන ශිල්පියකු වශයෙන් නමක් දිනා ඇති ඔහු පන්නිපිටිය මීසම් පුත්‍රයෙකි. ස්වාධීන රූපවාහිනියේ කෝපිකඩේ ටෙලි නාට්‍යයෙන් ජනප්‍රියත්වයට පත් ඔහු කතෝලිකයකු ලෙස කිතුනු දැක්ම මත පිහිටා කටයුතු කරන්න ඇප කැප වී සිටින ජනතා පුත්‍රයෙකි.



### සරත් පීරිස්

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 26**

සීදූව මීසම් පුත්‍රයකු වන ඒ මහතා 1991 දී සීදූව නගර සභාපති ලෙස පත්ව 1996 දක්වා සේවය කර විශාල වැඩ කොටසක් ඉටු කළේය. එහි විපක්ෂ නායක ලෙස 1996 දී පත්වූ අතර 2002 දී ලංකාවේ වැඩිම ප්‍රතිශතයක් ලබාගත් අපේක්ෂකයා ලෙස ජය ලැබීය.



### සිරිමසිරි හපුආරච්චි

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 39**

උතුරු බටගම වෙසෙන ඔහුගේ බිරිය මෙන්ම දරු තිදෙනා ද කතෝලික වන අතර කතෝලිකයන් හා එත්වැල් බැඳ ගනිමින් සාමයික සමගිය හා එකමුතුව පතා නිරතුරු කටයුතු කරයි. මාධ්‍යවේදියකු ලෙසද නමක් ගෙන ඇත.



### නයාල් හසිත විජේසිංහ

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 18**

කෝන්ගොඩමුල්ල මීසම් පුත්‍රයකු වන ඔහු කෝන්ගොඩමුල්ල සා. අන්තෝනි දෙව්මැඳුරේ නුවාන මූලිකයෙකි. සා. අන්තෝනි තරුණ සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයකු වන අතරම දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ද වේ.



### අමල් පුස්සැල්ලගේ

**- කොළඹ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 05**

අවිස්සාවේල්ල මීසම් පුත්‍රයකු වන ඒ මහතා එම මීසමට අයත් අලුත් අම්බලම දේවස්ථානයේ සමාජශීලි බැතිමත් කතෝලිකයෙකි. වසර 15 කට වැඩි කාලයක් ගීතිකා කණ්ඩායමේ ඕගනය වාදනය කර ඇත. කතෝලික සමිති සමාගම් වල ක්‍රියාශීලිව කටයුතු කර ඇති අතර දහම් පාසල් අධ්‍යාපනයෙන් උසස් පෙළ ද සමත් වූ අයෙකි.



### ජේ. ප්‍රිම්ලස් කොස්තා

**- කොළඹ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 17**

සෙක්කු වීදිය මීසම් පුත්‍රයකු වන ඒ මහතා මරිය හමුදාව, විසෙන්ති පාවුලා සමිතිය, මීසම් සභාව හා කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ සාමාජිකත්වය දරමින් සභාව වෙනුවෙන් ඇප කැපවී සේවය කළේය. 2002 සිට නාගරික මන්ත්‍රීවරයකු වූ ඔහු 2012 සිට බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයකු ද විය.

## ජනතා විමුක්ති පෙරමුණේ කතෝලික අපේක්ෂකයෝ



### කමල් මෙන්ඩිස්

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 34**

කුරණ මීසම් පුතකු වන අතර ප්‍රදේශයේ පොදු කටයුතු වලදී මූලිකත්වය ගෙන ක්‍රියා කරයි. ආදි ශිෂ්‍ය සංගමයේ උප භාණ්ඩාගාරික ලෙස කටයුතු කරන මොහු තරුණ ක්‍රිස්තියානි සංගමයේ ද කටයුතු කර ඇත.



### ගාමිණී ප්‍රනාන්දු

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 31**

මීගමුව පිටිපන මීසම් පුත්‍රයකු වන අතර පූජා උදව් සමිතියේ සේවය කළ අයෙකි. ගරු ප්‍රැන්සිස් රොහාන් සොහොයුරු තුමාගේ වැඩිමහල් සොයුරා වේ. කිතුදන පුබුදුවේ - ශිෂ්‍ය අංශයේ, තරුණ අංශයේ, පවුල් අංශයේ සේවය කර ඇත. සමස්ත ලංකා කිරිගොවි සම්මේලනයේ මීගමු ශාඛාවේ ලේකම් ලෙස සේවය කරයි.



**පසුගිය සතියේ නාවලගේ ඇන්ටනි කුරේ මහතාගේ මනාප අංකය 15 ලෙස වැරදියට පළ වූ අතර එම මනාප අංකය 25 ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න.**



### උපුල් රාජිත

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 11**

කඳවල මීසම් පුත්‍රයකු වන ඔහු කටාන ප්‍රාදේශීය සභාවේ උප සභාපති වේ. ප්‍රදේශයේ කතෝලික දේවස්ථානයන්හි ගොඩනැගිලි ඉදි කිරීම සඳහා මෙන්ම දහම් පාසල් අවශ්‍යතා සඳහා පුද්ගලික ධන පරිත්‍යාගයෙන් විශාල ලෙස ආධාර කරයි.

## එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කතෝලික අපේක්ෂකයෝ



### ඩිල්ෂාන් ජයවර්ධන

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 13**

කඳාන මීසම් පුත්‍රයකු වන ඒ මහතා හිටපු පළාත් සභා මන්ත්‍රී නිහාල් ජයවර්ධනයන්ගේ පුත්‍රයා ය. පාසල් හා දෙව්මැඳුරු සංවර්ධන කටයුතු වලට සිය පියාගේ විමධ්‍යගත අරමුදල් යොදාගෙන කටයුතු කරන අතර තරුණ කතෝලික සංගමයේ ද සාමාජිකයෙකි.



### තුෂාර පෙරේරා

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 41**

දළුගම මීසමේ පමුණුවිල උපන් කතෝලිකයකු වන ඒ මහතා 2004 සිට බස්නාහිර පළාත් සභාව නියෝජනය කරයි. ආගමික සිද්ධස්ථානවලට මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දී ඇත. ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරයෙකි.

සංග්‍රහය

# දනෝ වහරති, වරද නොදකිති

ලෙඩා කවරෙකු වුවද, වෛද්‍යවරයාගේ සැලකිල්ලට යොමුවිය යුතු බවට තර්කයක් අවශ්‍ය නැත. එහෙත්, හදවත් රෝගියා දෙවැනිකොට, දතක් පිරවීමට ආ රෝගියාට ශල්‍යාගාරයේ දොර විවර වීම වු කලී, දොස්තර කෙනෙකු නොව කොන්දොස්තර කෙනෙකුගේ ක්‍රියාවක් බඳු අපභ්‍රංසයකි. යළි යළිත් විමසා බැලිය යුතු පැමිණිල්ලකි. '

නමෝ මරිය' වැනි මුතුහරක්, පරම්පරා ගණනාවක්ම මහත් ප්‍රියතාවයෙන් උච්චාරණය කරතිබියදී, එහි වෙනසක් කරමින් 'ස්වාමි නුඹ කෙරෙහිය' යන කොටස 'ස්වාමින් වහන්සේ නුඹකෙරෙහිය' කියා වහරණු ඇසේ. වැඩහිටි පූජක පිරිසට වඩා, තුරුණු පූජක පෙළ එහි පෙරමුණ ගන්නා බවක් නිරීක්ෂණය වෙයි. ගිහි පිරිස මෙතෙක් තමන් උච්ඡාරණය කර ඇත්තේ වැරදි වහරක් දෝ යන සැකයෙන් ලජ්ජාවට පත්වීදෝ, ආපදා රථයක් පසු පස ඔහේ ඇදියන අබලන් වාහනයක් පරිද්දෙන්, ඔවුහුද 'මැකෝ' ගිරවුන් මෙන් 'ස්වාමින්වහන්සේ නුඹ කෙරෙහිය'යි වහරති. එහි වරදක් භාෂාමය වශයෙන් නැතිබව සැබවි.

එහෙත්, එහි වෙනසක් අවශ්‍ය වූයේ කාටද, කුමටද යන්නත් එවන් වෙනසකට වියත් පූජක උතුමන්ගේ අවධානය යොමුවී ඊට නිසි අවසරය ලැබ භාවිතයට පැමිණියේ දැයි විමසනු වටී. ස්ථාපිත යාච්ඤා, කවරෙකුට හෝ හිතුනු පලියට වෙනස් කිරීමේ සම්ප්‍රදායක් පෙර නොවිණි.

ස්වාමිවූ දෙවිඳුනට, හැකි ගෞරවයක් වශයෙන් 'ස්වාමි....' යන්න 'ස්වාමින්වහන්සේ' යන ගෞරවාර්ථයෙහි යෙදුවා යයි උදාසීන, ලිස්සායන, සරළ උත්තරයකින් මේ පැනය සාධාරණීය කළ නොහැකිය. එවිට එය පෙර සඳහන් හදවත් රෝගියාත් දත් රෝගියාත් සම්බන්ධයෙන් කී කථාවට දෙස්දෙන පසුතලයක පිහිටයි. 'විශ්වාස ලක්ෂණ' යාච්ඤාවේදී ඔහුගේ එකම පුත්‍රවූ ජේසුස් ක්‍රිස්තුස් යනුවෙන් දෙවිමහෝත්තමයාණන්ට 'ඔහු' යනුවෙන් අමතා... 'මොහු' ස්ප්‍රිතු සාන්තු විසින් ගැබවැස යනුවෙන් ලෝකාලෝකය වූ ජේසු සමිඳුන්ට 'මොහු' යනුවෙන් ඇමතීම නුසුදුසු යයි නොදැක හෝ නොසළකා, 'ස්වාමී' යන්න 'ස්වාමින් වහන්සේ' යනුවෙන් වෙනස් කිරීම කවර සාධාරණයක් දැයි මටනම් නොවැටහේ. මෙයද අධිකතර, අධිකරණ, අධීක්ෂණයක් යටතට පත් කළ යුතු සාක්ෂි වාචකයෙකි. කලෙකට පෙර ජේසු සමිඳුණනට 'ජේසු තුමා' යන යෙදුම පවා අගෞරවයක්ය. මන්ත්‍රී තුමා 'ඇමති තුමා' වැනි ගිහි නායකයන් විෂයෙහි ඇමතීමක් වැනියයි පත්තර පිටු පිරවූ වියත් පූජකවරු මෙහිදී කුමක් කියාවිදැයි මම බලාහිඳිමි.

මෙහිදී මගේ අදහස වන්නේ අතරින් පතර යැදුම්ගෙන පැලැස්තර අලවනවාට වඩා ස්ථාපිත යැදුම් සියල්ල එකටගෙන වියත් ගිහි පැවිදි, පූජක මණ්ඩලයක් හමුවේ තර්කණයට හා විමංශණයට භාජනය කොට, නිල වශයෙන් පිළිගත් ස්ථාපිත යාච්ඤා යළි නව මුද්‍රණ ද්වාරයකින් දොරට වැඩීම වඩා උචිත බවයි. නැතහොත්, ප්‍රසිද්ධ වන්දනා ස්ථානවලට නන්දෙසින් ඇදෙන සැදැහැ ජනතාව අමුතු අමුතු ආරේ පරමණ්ඩල ආරාධනා, නමෝමරිය හා අමුතු අමුතු ආරේ විශ්වාස ලක්ෂණද කියමින් පළාත් සභා ප්‍රාදේශීය සභා වැනි ආයතනවල විෂය පථයන්හි වෙනස වන් වෙනසක් තමන්ගේ යැදුම් තුළින්ද විදහාපානු ඇත. දැනටත් දිව්‍ය පූජා අවස්ථාවන්හි. ගරු පූජාප්‍රසාදීන් වහන්සේලා පවා පියාණන් වහන්සේගෙන් හා පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන සමිඳාණන්වූ ස්ප්‍රිතුසාන්තු කෙරෙහිද විශ්වාස කරමියි පවසන්නේ පුත්‍රයාණන් වහන්සේගෙන් යන තැනට මුද්‍රණදෝෂයකින් වැටී ඇති අනුචිත 'හා' අකුරක් ක්‍රිස්තු භාෂිතයක් මෙන් සලකාගෙන මෙනි. සැදැහැ ජනතාවද එයම වහරති. එය ඉංග්‍රිසියෙහි වූවා නම් වහා නිවැරදි කරනු ඇති මුත් සිංහලය මව් බස වූ කල්හිත් භාෂාමය දෝෂ වගේ වගක් නැතිව වහරණ විට 'අනේ අපේ මව් බසටත් ගිය කලක්' යයි මහත් සංවේගයක් දැනේ. සුදු ජාතිකයන් අපේ භාෂාවට ගරු කරනු ඇතිමුත් අපේ කළු සුද්දනට ඉංගිරිසිය රජබසක් තරමට ගෞරව සම්ප්‍රයුක්ත බවකින් දැනෙන්නේ බටහිරට ඇති 'ජන්මාන්තර නොනිසි පෙම' නිසා විය හැක.

**ඩී. ඒ. සමරවික්‍රම**
පැල්ලන්දෙණිය



අගරදගුරු පදවි පවුල් සේවා හිටපු අධ්‍යක්ෂ ගරු කේ. කැලිස්ටස් ප්‍රනාන්දු පියතුමන් විසින් රචිත තිඹිරිගෙයින් සුසානයට නමැති නවතම කෘතිය පසුගියදා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට පිළිගන්වන ලදී. දැනට කැනඩාවේ ධර්මදූත සේවයේ යෙදී සිටින පියතුමා වෙනුවෙන් පොත පිළිග ැන්වූයේ ගරු සිසිල් ජෝයි පියතුමාය. කොළඹ කතෝලික මුද්‍රණාලයෙන් හා අගරදගුරු මැඳුරෙන් ග්‍රන්ථය ලබාගත හැක.

**සටහන - බී. ඩී. ප්‍රියන්ත මෙන්ඩිස්**
**සේයා - ශෙහාන් ඇන්ටන්**

## පැට්රික් දෙනිපිටියගේ ආත්මයට සගසුව පතා දේව මෙහෙයක් හෙට

කණ්ඩායම් සංගීතයේ පුරෝගාමියෙකු වූද ප්‍රවීන සංගීත අධ්‍යක්ෂවරයකුමෙන්ම දක්ෂ ඉලෙක්ට්‍රික් ගිටාර් වාදකයකු වු පැට්රික් දෙනිපිටිය කැනඩාවේදී සග සුව දිනා වසරක් පිරීම නිමිත්තෙන් තිඹිරිගස්යාය ශාන්ත තෙරේසා දේවස්ථානයේදී මාර්තු 24 සඳුදා ප.ව. 6.30 සා. තෙරේසා දේවස්ථානයේදී මිස්ම සේවක ගරු රොහාන් පෙරේරා තුති පිදීමේ දේව මෙහෙයක් සිදුකරනු ලැබේ. ඔහුගේ පුතුන් දෙදෙනා වන සංගීතවේදී මහේෂ් සහ ප්‍රිමස් දෙනිපිටිය සමග දෙනිපිටිය මහත්මිය දිව්‍ය පූජාව සංවිධානය කරන අතර සියලු දෙනාට එයට සහභාගි වන ලෙස ඇරියුම් කරති.

**- හෙන්රි ප්‍රියශාන්ත මැන්දිස්**



යොවුන් ලේඛක ලක්රුවන් ලියනගේ ලියූ "හිරු නොදුටු මලක්" නවකතාවේ මුල් පිටපත පුත්තලම මීසම් සහායක ගරු ප්‍රභාත් සංජය තමෙල් පියතුමාට පිළිගැන් වූ අවස්ථාව.

## මවකගේ විලාපය

පුතුනේ ඇයි හඬන්නේ මේ කඳුළු සලා
දුකහිතුනාද පාසල් යන අය දැකලා
ලකුණක් අඩුනිසා පුතුහට දොර වැහිලා
දාහතරෙත් මාස දෙකක් දැන් ගෙවිලා

දයාව පා කොයි කාගෙත් දරුවෝ වෙතේ
නොම්ලෙ ගිල්පදී යැවුමට ජය මාවතේ
කන්නංගර පියාණන් දැරූ උසස් මතේ
එලගන්වන්න හැකියාවක් නැතිය පුතේ

දයා ප්‍රේමෙ ගැන හැමවිටකම දොඩනා
වචනෙට මිස කිරියාවට නොම නගනා
මිනිසුන් සිටින තැන දෙවිඳුන් වැඩ වසනා
බව කිව හැකිද යනුවෙන් මට සැක හිතෙනා

ඒ රොප්පේ ඉඳලා ආ දරුවාට
ලෙස දයාව නැත්තේ ඇයි පැල්පතෙ පුතුට
තම සමකමට මිනිසා මැව් දෙවිඳුන්ට
නිගාකරනවා නොවෙදැයි සිතෙයි මට

**ඇම්. ඒ. වැන්ඩලන්**
වෙන්නප්පුව

## බැතින් පුදනෙමු මෑණියනි අපි

බැතින් බරවී සියලු ජනයා වැඳ වැටෙන ඔබේ පාමුලේ
ගතින් වෙහෙසුන දුබලකම් මඟ හැරෙයි ඔබට ලංවූ කලේ
රකින් මව්නි ඔබේ දරු කැල වෙලා අසරණ ලෝ තලේ
බැතින් පුදනෙමු සිරස නමමින් මෑණියනි අපි තලවිලේ

ඔරුද තෙප්පන් පාරු අරගෙන සයුර රළ තරණය කරන්
කාර් ලොරි බස් කරත්ත ට්‍රැක්ටර් බයිසිකල් බොහෝ එයි අරන්
දහස් ගණනින් වැඳ පුදා යයි ඇතැත් කරදර කොයි තරන්
එන්නෙ සැමදෙන මෙපුද භූමියෙන් අරන් යන්ටලු දෙවිඳුන් වරන්

දෙව් මැඳුර මඩු තේවත්ත රාගම හැරුණු විට මාතර ඇති
මෙපුද භූමියට ඇදෙන සෙනගගෙන් නොමැත අඩුවක් සිරිලක වෙති
සුරැක ධීවර අසරණුන් සැම බැතිනි බෝ සේ රැක නිති
රැඳුණ සැමගේ මුවින් පිටවුනෙ සන්ත ආනා නාමය වෙති

බටහිරෙන් දක්ෂිණෙන් මඩු පල්ලි යන්නන් පළමු ඔබ ලඟ වැඳ වැටෙයි
අවහිරෙන් ධෛර්යෙන් මුදල් රැස් කරන් බාර හාර පඬුරුද වැටෙයි
සනදුරෙන් පාපයෙන් වෙලී ඇති බොහෝ ජීවිතද කල එළි වැටෙයි සිත දුරෙන්
භීතියෙන් සන්ත ආනා මෑණියන් ලඟ වැඳ වැටෙයි

**පී. ඩබ්. සුනිල් ප්‍රනාන්දු** - වාද්දුව

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 262

### පළවෙනි සිකුරාදා

පළමු සිකුරාදා නවයක් එක දිගට නොකඩවා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන්නන්ට ශුභ මරණයක් අත්වන බවට 1675 දී ශු. මර්ගරීතා මරියතුමිය ලද දිව්‍ය හෘදය පොරොන්දුව ප්‍රකාරව පළමු සිකුරාදා දිව්‍ය හෘදය භක්තිය ලෝක ව්‍යාප්ත විය. එකල සිට දිව්‍ය හෘදය මංගල්ලයද පැවැත්වෙන්නේ සිකුරාදාවකය. මේ බැතිය අනුකරණයෙන් පළමු අඟහරුවාදා වශයෙන් සතියේ අන් දිනවලත් සිදුවන භක්ති අභ්‍යාස කතෝලිකයනට විශේෂයි.

ශොක් ඉරිදා, පාස්කු ඉරිදා, ස්ප්‍රිතු සාන්තු ඉරිදා, අළු බදාදා, මහ බ්‍රහස්පතින්දා, මහසිකුරාදා කිතුනු ජනවන්දනාවේය. ගුරු අඟහරුවාදා ජනවහරේ තිබුණත් ජනවන්දනාවේ එවැන්නක් කිසිදා නොතිබිණ. අළු බදාදාට පෙරදින SHROVE TUESDAY පවා ජනවන්දනාවේ නැත. SHROVE පාපෝච්චාරණය හඟවයි. HOLY SATURDAY සඳහා ආලෙලූයියා සෙනසුරාදාත් පොදු වහරින් ආවකි.

චතාරික කාලයේ පස්වන ඉරිදාට (කලින් දුක්ප්‍රාප්ති ඉරිදා) පසු සිකුරාදා වික්ෂෝප මෑණියන්ගේ මංගල දිනයක් විය. ජනවහරේ මෙදින වික්ෂෝප සිකුරාදා විය. 1926 යාච්ඤා නිධාන මුද්‍රණයේ පටුන ඇතුළු හැමතැන වික්ෂෝප නිදොස් වදන සඳහන්ය. වික්ෂේප - ප්‍රතික්ෂේප - සංක්ෂේප බලන්න. වික්ෂිප්ත - සංක්ෂිප්ත මෙන් ප්‍රතික්ෂිප්ත නිවැරදි වචනයයි. ඡන්ද ප්‍රතිඵලවල කියැවෙන්නේ ප්‍රතික්ෂිප්ත නොවේ.

ප්‍රථම - පඨම කෙරෙන් පළමු හටගත් නිසා වැනි යොදා පළමුවැනි කීම සදොස් බවට මතයකි. ප්‍රථමයෙන් සඳහා පළමුව කීවත් ප්‍රථමයාට පළමුවා කියන්නේ නැතිසේය. පෙරේදාට කලින්දා ජනවහරේත් සාහිත්‍යයේත් පළමුදා නම විය.

කිතුනු දිවිමගේ පළමුව සිදුවන අවස්ථා අතුරින් පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම අගතැන්පත්ය. මෙසේ ප්‍රථම මෙන් අන්තිමද කිතුනුවන් අතරේය. අන්තිම ආලේපය, අන්තිම රාත්‍රි භෝජනය, දෙසැම්බර් 31 අන්තිම ආශිර්වාදය, ලෝකාන්තිමය.

ශුද්ධ බයිබලය ආරම්භයේදී ලෙස පටන්ගෙන අවසාන වන විට මම අල්ෆා (ග්‍රීක හෝඩියේ පළමු අකුර) වෙමි. මම ඔමෙගා (ග්‍රීක හෝඩියේ අග අකුර) වෙමි. මම ප්‍රථමයාත් අන්තිමයාත් වෙමි. මම ආරම්භයත් අවසානයත් වෙමි. (එළිදරව්ව 22:13)

ප්‍රථමයෝ බොහෝදෙනෙක් අන්තිමයෝද අන්තිමයෝ ප්‍රථමයෝද වන්නෝය. (මතෙව් 19:30) මෙබඳු වැකියක් මතෙව් 20:16 ද ඇත.

## 'භක්ති ප්‍රබෝධනය' නව සංස්කාරක ගරු ලාල් පුෂ්පදේව පියතුමා

නිර්මල මරිය නිකාය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන 'භක්ති ප්‍රබෝධනය' මාසික කිතුනු සඟරාවේ නව සංස්කාරක පියතුමන් ලෙස ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි පියතුමා පසුගියදා වැඩභාරගත්තේය. හිටපු සංස්කාරක ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි පියතුමන් විසින් නව පියතුමන්ට සංස්කාරක පදවියේ වගකීම් භාරදීම පසුගිය සතියේ මරදාන ඩීන්ස් පාර 'භක්ති ප්‍රබෝධන' කාර්යාලයේදී සිදුවිය.

1974 පෙබරවාරි 08 වන දින මීගමුව පිටිපන මංකුළිය ග්‍රාමයේදී උපත ලැබූ පුෂ්පදේව පියතුමාගේ දෙමාපියන් වූයේ ලූර්දු එස්තර් සහ ජස්ටින් අල්විස් දම්පතීන්ය. වැඩිමහල් සහෝදරියන් තිදෙනෙකුගේ බඩ පිස්සා ලෙස මෙලොව එළිය දුටු මෙතුමා මීගමුව සා. මරියා විදුහලින් සිය අධ්‍යාපන



කටයුතු සම්පූර්ණ කරලීය. කොහුවල සා. ජෝශප් පූර්ව දෙව්සත්හලින් හා අම්පිටිය ජාතික දෙව්සත්හලින් දෙව්දහම හදාරා 2003 සැප්තැම්බර් මස 06 වන දින කොළඹ මරදාන පාතිමා දෙව්මැඳුරේදී බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු හිමිපාණන් අතින් පූජක වරම් ලැබීය.

වෙන්නප්පුව 'නාසරෙත්' හී දේශනාවාදී පියතුමකු ලෙස සිය සේවා දිවිය ඇරඹූ මෙතුමා පසුව බුරුල්ලපිටිය, අනුරාධපුරය යන මීසම්වල සහයක පියතුමකු ලෙසද සේවය කළේය. ඉන් අනතුරුව මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ කාර්මික පුහුණු පාසලේ අධ්‍යක්ෂ පියතුමන් ලෙස වැඩ භාරගත්තේය. එම පාසලේ සිසු දරුවන් කාර්මික දැනුමින් හා අධ්‍යාත්මික පෝෂණයෙන් පිරිපුන් දරුවන් කිරීමට මහත් වෙහෙසක් ගෙන කටයුතු කළේය.

කොළඹ විශ්ව විද්‍යාලයේ ජනසංනිවේදන ඩිප්ලෝමාධාරියකුද වන ලාල් පියතුමා, අගරදගුරු පදවි ජනසංනිවේදන කේන්ද්‍රය හා එක්ව ජාතික රූපවාහිනියේ කිතුනු ආගමික වැඩසටහන් සම්පාදකවරයකු ලෙස මාධ්‍ය ක්ෂේත්‍රයේ කුසලතා ප්‍රකට කර ඇත.

කෙටි චිත්‍රපට හා වාර්තාමය චිත්‍රපට, වැඩසටහන් රාශියක්ම එතුමා විසින් අධ්‍යක්ෂණය කර නිෂ්පාදනය කර එළිදක්වා ඇත.

'දිළිඳුන්ට සුබ අස්න දෙසීමේ නිර්මල මරිය නිකායික ස්ප්‍රිතුව තුළ 'භක්ති ප්‍රබෝධනය' හරහා කාලීන මාධ්‍යය මෙහෙවරක යෙදෙන්නට ගරු ලාල් පුෂ්පදේව පියතුමාට දෙව් ආසිරි නොඅඩුව ලැබේවායි' යන්න ප්‍රදීපයේ පැතුමයි.

**ටී. සුනිල් ප්‍රනාන්දු**

# සසුන් පියා ලෝක කිතුනු සභා කවුන්සලයේ නායක හමුවේ

ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් මුණ ගැසුණේය. එතුමා විසින් එම අවස්ථාවේදී ප්‍රකාශ කරනු ලැබුවේ, කිතුනු සභා ඒකත්වය, එමගින් ලෝක ප්‍රජාවට සාමූහික සේවාවක් කිරීමට දෙවිඳුන් අනුහසින් නව මං විවර කැරුම පටන් ගෙන ඇතැයි කියාය.

එතුමා ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් තවදුරටත් අමතමින් මෙලෙස ප්‍රකාශ කළේය. "උත්තමයාණෙනි, ලොවු පුරා වෙසෙන කිතුනුවන් තම තමන්ගේ ක්‍රියාකාරකම් තුළ පමණක් සිර වී කටයුතු නොකොට, සියළු ලෝක කිතුනු ජනතාවන් හා ඒක්ව වචනයෙන් හා ක්‍රියාවෙන් සේවය කරමින් දේවාදරයට සාක්ෂි දරණා ලෙස ඔබවහන්සේ නිරන්තරයෙන් කරනා ඉල්ලීම සඳහා අපි ඔබ තුමන්ට හෘදයාංගම කෘතඥතාවය පළ කරමු."

නොර්වේජියාවේ ලූතරන් සභාවේ නායක තුමකු ලෙසින් කිතුනු සේවාවේ යෙදෙනා ඔලාව් පික්සේ ට්‍රුවේට් දේව ගැති තුමා, වර්ෂ 2010 සිටැ ලෝක කිතුනු සභා කවුන්සලයේ නායක පදවිය උසුලයි. එතුමාගේ නායකත්වය යටතේ ලොවු පුරා

සරණවීමේ විවිධ ව්‍යාපාරයන් දියත් කරනු ලබයි.

ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් සිය අදහස් දක්වමින් මෙලෙස ප්‍රකාශ කළ සේක. "කිතුනුවන් වශයෙන් බෙදී සිටියහොත්, ලෝකය තුළ දේව වචනය සඳහා සාක්ෂි දැරීමට බාධා පමුණුවනු ලබනු බැව් ලෝක කිතුනු සභා කවුන්සලයේ ජනතාවන් විසින් නිරන්තරයෙන් පෙන්වා දිය යුතු වෙනවා.

කිතුනු සභා අතර බෙදීම ඉතිහාසය පුරා තුබූ බැව් ප්‍රකාශ කරමින් කිතුනු සමගිය වඩවාලීම අතහැර දැමීම වරදකි. කිතුනු එකමුතුව මගහැර සිටියහොත්, ක්‍රිස්තුන් වහන්සේ විසින් එකමුතු සභාවක් තුළ දක්වන්නාවූ එතුමාගේ ගැළවීමේ ප්‍රේමය මෙන්මැ එතුමන්ද ප්‍රතික්ෂේප කිරීමක් සිදුවනු ඇත.

එම නිසාවෙන් කිතුනු එකමුතු ගමන කඳු නැඟීමක් වුවත්, අප එය අනිවාර්යයෙන්මැ කළ යුතුමයි. එම අසීරු ගමන සඳහා අවැසි නොතිත් යැදුම තුළින්, ප්‍රඥාවද දිරි ගැන්ම ද ඔස්සේ අධ්‍යාත්මික පීඩා විඳිනා කිතුනුවන් සමගින් පෙරට යා යුතු වේ.

## කතෝලික පූජකවරු පාපොච්චාරණය අසන්නෝද තමන් පාපොච්චාරණය කරන්නෝද වෙති



මාර්තු මස 07 වෙනිදා රෝමානු පදවියේ පූජකවරු හමුවූ අවස්ථාවේදී, සුදොතුම් පියා, පාපොච්චාරණයේ සක්‍රමේන්තුව කෙරෙහි අවධාරණය කරමින්, පාපොච්චාරණයෙහි නිරත වන්නාවූ ඇදැහිළි වන්තයන් වෙත ක්‍රිස්තුන් වහන්සේගේ ආදර කරුණාව දක්වන ලෙස පූජා ප්‍රසාදි වරුන්ගෙන් ඉල්ලා සිටියෝය. සුදොතුම් පියා රැස්ව සිටි පූජක පිරිසගෙන් මෙලෙසින් ද ප්‍රශ්න කළ සේක. "ඔබේ ජනතාව වෙනුවෙන් ඔබ සැමෙදනා කඳුළු යදින්නහුද? ආබ්‍රහම් කළා සේ ඔබේ ජනතාව වෙනුවෙන් ස්වාමින් වහන්සේ හා ඔබ සැම හරඹ කරන්නාහූ ද? තවද අකර්මන්‍ය නොවී පරිත්‍යාග හදවතින් කරුණාව දයාව පෙන්වන්නැයි එතුමා ඔවුන්ට අනුශාසනා කළ සේක.

තවද එතුමාණෝ මෙලෙසින් ද ප්‍රකාශ කළ සේක. "අකර්මන්‍ය පූජකවරුන්ගෙන් සභාවට වැඩක් සිදු නොවේ. දේවාදරය යනු සිතින් හා ගතින් තුවාල ලත් ජනතාව රැක බලා ගැනීමයි. සුවදායක සක්‍රමේන්තුව ඔස්සේ එම දයා කරුණාව ක්‍රියාවට නංවාලිය හැක. යහපත් පූජකවරයකු ලෙස ක්‍රියා කිරීමේදී, එඬේරකු නැති විඩාවට පත් බැටළුවන් සේ දිවි ගෙවන ජනයා, ක්‍රිස්තුන් වහන්සේ කළා සේ, රැකබලා ගැන්මැ යහගුණැති පූජකවරයකු සතු වන්නේය. එම දයා කරුණාව, විශේෂයෙන් පාපොච්චාරණයේදී දක්වාලිය හැක. සැබෑ දයා කරුණාව දැක්වීමේදී, විශේෂයෙන් පාපොච්චාරණයේදී, සැබෑ ඇහුම්කන් දීමකින් ද, අනුශාසනාවෙන් ද, ක්ෂමා කිරීමෙන් ද සෙනෙහස දැක්වීම කළ හැක.

පාපොච්චාරණය අසන්නාගේ අධ්‍යත්මික අගය රඳා පවතින්නේ, එම පූජකවරයා සිය පාපොච්චාරණ ජීවිතය කෙළෙස ජීවත් වන්නේ ද යන කාරණාව මත යයි ද එතුමා විසින් හුවා දක්වන ලදී. වැඩි වාර ගණනක් පාපොච්චාරණයේ යෙදෙනා ලෙසට රැස්වූ පූජක පිරිසගෙන් එතුමා ඉල්ලා සිටියේය. එසේ කිරීමෙන් දේව කරුණාව බෙහෙවින් අත්දකින්නට හැකි යයි ද එතුමා විසින් දක්වනු ලැබීය.

ප්‍රැන්සිස් සසුන් පියා විසින්, තමාගේ ජීවිත සිද්ධියක් ද පාපොච්චාරණය කරනු ලැබුවේ මෙසේය. "පාපොච්චාරණය කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්වූ ආර්ජේන්ටීනියාවේ විසු ජෝසෙ ඇරිස්ට් නම් පියතුමා අභාවප්‍රාප්ත වූයේ බුවනෝස් එයාර්ස් හී රදගුරු ලෙසින් සේවය කරද්දීය; මා එතුමාගේ දේහය අසළ සිට මල් පුදා යැදුමන් කරද්දී එතුමා අත තුබූ කුරුසියක් සහිත කොන්තය මා දුටුවා. එවේලේ අප කා තුළත් සැඟවී සිටිනා සොරා එළියට පැන්නා; මා එකවර කොන්තයේ තුබූ කුරුසිය ගළවා ගත්තා" ඒ සමගම මා කීවේ, "ඔබ තුමන් අනුශාසනා කළ දේව දයා ගුණයේ අඩක් මට දෙන්න" කියාය. එදා සිට අද දක්වා මා කුරුසිය පැළඳ සිටිනවා. සසුන් පදවිය ලද දා සිටම මගේ ඇඳුමේ පොකෙට්ටුවේ මා කුරුසිය නිරන්තරයෙන් තබාගෙන සිටිනවා. යම් කෙනකු වෙනුවෙන් මා යැදුමක් කරද්දී, එසේ කරනුයේ එම කුරුසිය මත අත තබා ගෙනයි."

ශුද්ධ වූ සතියේ මහා බ්‍රහස්පතින්දා කතෝලික බැති මතුන්ගේ අති සුවිශේෂ හා ශුද්ධ වූ දිනයකි. ඉන්දීය මැතිවරණය එදිද පැවැත්වීමට ඇතැම් ප්‍රාන්තයන් විසින් තීරණය කරනු ලැබ ඇත. ඇතැම් විරුද්ධ පක්ෂ දේශපාලනඥයන් විසින් ද එම තීරණයට විරුද්ධත්වය පාති.

විරුද්ධ පක්ෂ දේශපාලනඥයන් විසින් තව දුරටත් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, පියවර ගැන්මට බලපෑම් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ හින්දු ජාතිවාදී බහරතීය ජනතා පක්ෂය විසින් බවයි. විශේෂයෙන් කතෝලිකයන් ඇතුළු කිතුනු ප්‍රජාවගේ ඡන්දය බී. ජේ. පී. පක්ෂයට නොලැබෙන බැවින්, මහා බ්‍රහස්පතින්දා දිනැ ඔවුන් ආගමික අභ්‍යාසයන්හී හිර කර තැබීම යෝග්‍ය යැ යයි ඔවුන්ගේ වෑයම වී ඇත.

ඔවුන් එසේ මහා බ්‍රහස්පතින්දා මැතිවරණය පැවැත්වෙන ස්ථානයන්ට නොපැමිණිය හොත්, තම පක්ෂයට ලැබෙන ඡන්ද ප්‍රමාණය තව තවත් වැඩි වනු ඇතැයි ද භාරත ජනතා පක්ෂය විශ්වාස කරනා බැව්. කතෝලික පුවත් විසින් වාර්තා කරත. එහෙත්, ඉන්දීය මැතිවරණය එළැඹෙන මහා බ්‍රහස්පතින්දා දිනැ සිදු වුවහොත්, ඔවුන් කෙසේ ක්‍රියා කළ හැකිදැයි තවම කිසිවෙකුටවත් තීරණය කළ නොහැකි යැයි ද කිතුනු පුවත් විසින් තව දුරටත් දක්වා ඇත.

## ඉන්දීය දෙව්සත්හල් ප්‍රධානියාගේ මරණය පිළිබඳ පරීක්ෂණ



ඉන්දියාවේ බැංගලෝර් හී පිහිටි සා. ජෝශප් දෙව් සත්හලේ ප්‍රධානියා වශයෙන් සේවය කළ කේ. ජේ. තෝමස් පියතුමා 2013 වර්ෂයේ අප්‍රේල් මස 1 වැනිදා සිය කාමරයේ මරා දමා තිබිණි. එම මරණය පිළිබඳ මෙතෙක් ස්ථිර නිගමනයන්ට එළැඹීමට බංගලෝර් හී පොලීසියට බැරි වී ඇත. මේ නිසාවෙන්, විශේෂ ක්‍රියාමාර්ග ඔස්සේ, විවිධ පුද්ගලයින් පරීක්ෂණයන්ට පාත්‍ර කරවීමෙන් යම් යම් කරුණු කාරණා සනාථ කර ගැන්මේ උත්සහයක පොලීසිය නිරත වී සිටී.

දෙව් සත්හලේ සේවයේ නියුතු පූජකවරු 4 දෙනෙක් ද, කාර්ය මංඩලයේ දෙදෙනෙක්ද පොලීසිය විසින් පරීක්ෂණයට භාජනය කරනු ලැබ ඇත. මේ අනුව පියතුමාගේ මරණය සිදුවූ රාත්‍රියේදී, එම ස්ථානයේ කාලය ගත කළ පූජකවරුන් ඇතුළු සියළු දෙනා යළි යළිත් නව තාක්ෂණ ඔස්සේ දිගින් දිගට පර්යේෂණයන්ට පාත්‍ර කැරෙනා අතර, ඒ සඳහා කිසිදු බාධාවක් පොලීසිය වෙතැ ඉදිරිපත් වී නැතැයි ද වාර්තා වේ.

## නයිජීරියාවේ කිතුනු ගම්මාන 4 ක් විනාශ කැරේ

මධ්‍ය නයිජීරියාවේ රියොම් නම් ප්‍රදේශයේ කිතුනු ගම්මාන කීපයක් වේ. ඒවායේ වෙසෙන දිළිඳු කිතුනු පවුල් නිරන්තරයෙන් ජීවත් වන්නේ කිතුනු විරෝධී ඉස්ලාම් ත්‍රස්ත කංඩායම්වලින් එල්ල වන මරණ තර්ජන හමුවේය. දේශයෙන් කිතුනුවන් ඉවත් කිරීමේ ඇවැන්ත මෙහෙවරක නිරතව සිටින "බොකෝ හරාම්" නම් ත්‍රස්ත පිරිස මාර්තු මස 05 වැනිදා රියොම් ගම්මානයට කඩා වැදුණෝය.

ඔවුන් කඩා වැදුනේ අවි ආයුධ රැගෙනයි. එම පිරිසේ සිටි ගැහැණු ද පිරිමි ද ගමේ ජීවත් වු අසරණ කිතුනුවන්ට පහර දෙන්නට වූහ. සුළු වේලාවක් තුළදී, ගේදොර 200 කට වැඩි සංඛ්‍යාවක් ගිනි බත් කැරිණි. බොහෝ දෙනෙකු මාරාන්තික තුවාල ලබා ඇති අතර 16 දෙනෙක් ඝාතනය කරනු ලැබ ඇත.

ජීවිත බේරා ගත් ඇත්තෝ ඥාති මිත්‍රාදීන් නැති ශෝකයෙන් අන් අයගේ නිවෙස්වල පසු වෙති. එහෙත් ජීවිත ගලවා ගත් අය ද ඔවුන්ට රැකවරණය ලබා දී ඇත්තන් ද පසු වන්නේ ඉමහත් වේදනාවෙනි. එහෙත් බලධාරීන් ද ආරක්ෂක අංශ වලින් ද පහර කෑ ජනතාවට කිසිදු පිහිටක් නොමැති වීම ද, ජීවිත ප්‍රශ්නයක් බවට පත්ව ඇත.

## කිතුනුවන්ට එරෙහි නඩුවේ විනිසුරුවරුන්ටත්, නීතිඥයන්ටත් තර්ජන

පකිස්තානු ජාතික අහිංසක කිතුනු යුවලක් වන අංශභාග රෝගයෙන් පෙළෙන ස්වාමි පුරුෂයා වන ෂෆකාට් සහ ෂෆග්ටා කවුසාර් නම් බිරිඳ, ඉස්ලාම් දහමට එරෙහිව ජංගම දුරකතණය හරහා කෙටි පණිවුඩ යැව්වාය යන බොරු චෝදනාව මත සිරගත කරනු ලැබ ඇත. ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනා නීතිඥවරුන් විසින් ඇප පිට ඔවුන් නිදහස් කරනා ලෙස ආයාචනා කරති. නමුත්, ලාහෝරයේ මහාධිකරණය විසින් එය ද ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ.

නඩු විභාගය ආරම්භයේදීමැ, යථාර්ථය තේරුම් ගෙන තුබූ අධිකරණය විසින් එම අඹු සැමි යුවළ ඇප මත නිදහස් කැරුමට නැඹුරුවක් තිබුණත් ඉස්ලාම් නායකයන්ගෙන් හා ත්‍රස්තවාදීන්ගේ බලපෑම් මත, තව දුරටත් සිරගත කැරුම දිගටම පවත්වාගෙන යනු ලබයි. තවද එම යුවළ වෙනුවෙන් උසාවියේ පෙනී සිටින්නා වු නීතිඥවරුන්ට එරෙහිව ද ලිඛිත හා වාචික තර්ජන එල්ල වෙමින් පවතී. කිතුනු ජනතාවන්ගේ හා ස්වාධීන මත ධාරීන්ගේ අදහස වන්නේ, උග්‍ර අංශභාග රෝගයෙන් පෙළෙන 35 හැවිරිදි ස්වාමි පුරුෂයා හා බිරිඳ වෙත මරණ දඬුවම නියම කැරුම සිදු වන බවයි. ස්වාමි පුරුෂයා ශරීරය පුරා තුවාළ සහිතව මාරාන්තික වේදනාවෙන් සිර ගෙදර රෝහලේ තනි කොට ඇත. මෙම මාරාන්තික රෝගී තත්ත්වයේ වුවද, ඔහුට පිළිසරණක් නොමැති වීම, අමනුෂ්‍ය ක්‍රියාදාමයක් ලෙසින් විශේෂයෙන් කිතුනු සංවිධාන විසින් පෙන්වා දී ඇත.

ඒක පාර්ශික ආගම් නීතිය යටතේ ඉස්ලාම් දහමට අපහස කරනු ලැබ ඇතැයි යන බොරු චෝදනා යටතේ ඔවුන් අත් අඩංගුවට ගනු ලැබුවේ, වර්ෂ 2013, ජූලි මාසයේදීය. ඔවුන් දෙදෙනා පොලීසිය විසින් අධිකතර පීඩාවට පත් කරනු ලැබූ ඇතැයි ද වාර්තා වේ. ඔවුන්ගේ කුඩා දරුවන් සතරදෙනා ආච්චි හා සීයාගේ සරණය යටතේ ජීවත් වෙති.

## දෙව් මැඳුරු විනාශ කරමින් ශුද්ධ වූ වස්තූන්ට නිගරු කරති



වෙනිසුළුලාවේ පවත්නා සිවිල් කලකෝලාහලය මාධ්‍යයේ දෙව් මැඳුරු රාශියකට පහර දෙමින් ඇවැන්ත විනාශයන් හා කෙළැසීම් කරත. එරටේ රදගුරු මංඩලයේ ප්‍රකාශකයෙක් පවසන පරිදි, සිවිල් ගැටුම් උග්‍රව පවත්නා ප්‍රදේශයන් හී පවත්නා දෙව් මැඳුරු රාශියක්, සටන්කාමී කංඩායම් කීපයකගේ ප්‍රහාරයට ලක්වී ඇත.

දෙලක්ෂයක් පමණ ජනගහණයක් ජීවත් වන ෂෙරීඩා ප්‍රදේශයේ දෙව් මැඳුරේ ඉරිදා දිව්‍ය යාගය සිදු කැරෙනා අවස්ථාවේදී ඊට පහර දී ඇත. දෙව් මැඳුරේ අල්තාරයටද පහර දෙමින්, ඇදැහිළි වන්තයන් එළව එළවා පහර දීමට ලක් කොට තිබේ. මරකයිබෝ නගරය වෙනිසුළුලාවේ දෙවැනි විශාලතම නගරයයි. එහි ජීවත් වු පූජක වරයාට එළව එළවා ඇඩි ලෙසින් පහර දී, මාරාන්තික බවට පත් කොට තිබේ. තවත් දෙව් මැඳුරකට කඩා වැදුන ත්‍රස්ත කංඩායමක් විසින්, අල්තාරය බිඳලා, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගත් පූපයත් බිම අතුරා කෙළෙසමින් විනාශ කොට තිබේ. තවද ඔවුන් දෙව් මැඳුරෙන් පිටත්ව ගොස් ඇත්තේ, දෙව් මැඳුර වැසිකිළියක් බවට පත් කරමිනි. "පොදු අපරා කරුවන්" ලෙසින් ප්‍රකාශ කැරුනු ලබන පිරිස් විසින්, මෙවැනි නින්දිත ක්‍රියාදාමයක් දිගින් දිගට කැරෙනා බැව් ද රදගුරු මංඩලය විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

# කිතුනුවන් ලෙස අප කැඳවා ඇත්තේ කළ පාප වලට සමාව දෙන ගැළවීමදායක සුපුවත පතල කිරීමටයි

## අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ චතාරික පණිවුඩය - 2014

**සහෝදර සහෝදරියනී,**

චතාරිකය ළං වත්ම පුද්ගලයන් හා සංඝයක් ලෙස අපගේ සිත්හැරීමේ මාර්ගයේ උපකාරී වන සිතුවිලි ටිකක් ලබා දෙන්නට කැමැත්තෙමි. සිතීමට උපකාරී වන මෙම අදහස් පහත සදහන් ශු. පාවුළුතුමාගේ වචනවල ආභාෂයෙන් ගෙනහැර පාන්නෙමි. 'අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගශීලී කරුණාව ඔබ දන්නහුය. උන්වහන්සේ ධනවත්ව සිටි නමුත් තමන්වහන්සේගේ දිළිඳුකම කරණ කොට ගෙන ඔබ ධනවත් වන පිණිස ඔබ උදෙසා දිළිඳු වූසේක (2 කොරි 8:9). ශු. පාවුළු අපෝස්තුළුතුමා විසින් කොරින්තියේ සිටි කිතුනුවන්ට ලියන ලද්දේ ජෙරුසලෙම් සිටි දිළිඳු සැදැහැවතුන්ට උදව් කිරීම සදහා පරිත්‍යාගශීලී වීමට දිරිමත් කරනු සදහාය. පාවුළුතුමාගේ මෙම වචන කිතුනු අපට අද කුමක් පවසයිද? මෙම ආරාධනය දිළිඳුවීමට මෙන්ම ධර්මදානීය දිළිඳු දිවියකට අද අපට කුමක් අදහස් කරයිද?


**ක්‍රිස්තුස් වහන්සේගේ වරප්‍රසාදය:**

මුලින්ම එය පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේ කෙසේ ක්‍රියා කරනවාද යන්නයි. උන්වහන්සේ ලෝකයේ බලය හා ධනය තුළ සැඟ වුනු ආකාරයෙන් ප්‍රකාශ නොවන අතර දුර්වලතාවයෙන් හා දිළිඳුබව තුළින් කථා කරයි. උන්වහන්සේ පොහොසත් වුවද ඔබ වෙනුවෙන් උන්වහන්සේ දිළිඳු වූ සේක'. දෙවියන් වහන්සේගේ සදාතනික පුත්‍රයාණන් එනම් තේජශ්‍රීයෙන් හා බලයෙන් උන්වහන්සේ සමඟ සිටින ක්‍රිස්තුස් වහන්සේ දිළිඳු වීමට කැමතිවූ සේක. උන්වහන්සේ අප අතරට පැමිණුනු අතර අප එකිනෙකා සමීපයට පැමිණියේය.

සෑම දෙයකදීම අප හා සමානවීම සදහා සිය තේජශ්‍රීය පසෙකලා හිස්වූ සේක (පිලිප්පි 2/7 හා හෙබ්‍රෙව් 4/15 ආශ්‍රිතව). මාංශගතවීම අභිරහසකි. නමුත් මේ සියල්ලටම හේතුව උන්වහන්සේගේ ආදරය වේ. මෙම ආදරය වරප්‍රසාදයකි; පරිත්‍යාග ශීලී බවකි; සමීපවීමට ආශාවකි. සිය ප්‍රේමවන්තයින් වෙනුවෙන් පරිත්‍යාගීවීමට පසුනොබසින ප්‍රේමයකි.

දයාව හා ප්‍රේමය යනු සෑම දෙයකදීම අප ආදරය කරන අය සමඟ බෙදා ගැනීමකි. ප්‍රේමය අපව සමාන තත්වයකට ගෙන එයි. එය සමානාත්මතාවය ඇති කරන අතර දූරස්ථභාවය නැති කර තාප්ප බිඳ හෙලයි. දෙවියන් වහන්සේ මෙය කළේ අප සමඟය. 'සැබවින්ම උන්වහන්සේ මිනිස් අත්වලින් වැඩ කළ සේක. මිනිස් මනසකින් සිතන්නට වු සේක. මිනිස් මනාපය අනුව ක්‍රියා කළේය. මිනිස් හදවතකින් ප්‍රේම කළේය. කන්‍ය මරියතුමියගෙන් උපත ලැබූ උන්වහන්සේ පාපය හැර අන් සෑම අයුරකින්ම අප හා සමාන වූසේක ( වර්තමාන ලෝකයේ ශුද්ධවු සභාව 22).

තමාම දිළිඳුවීම තුළ උන්වහන්සේ සෙවූයේ හුදු දිළිඳුකමක්ම නොව ශු. පාවුළුතුමා පවසන ආකාරයට අපව පොහොසත් කරන දිළිඳු බවකි. මෙය වචන හරඹයක් හෝ හුදු කියමනක් නොවේ. ඊට වඩා එය දෙවියන් වහන්සේගේ දර්ශනය, ආදරයේ දූක්ම, කුරුසිය මත දිවි පිදීම හා මාංශගතවීම සාරාංශ කරයි. දෙවියන් වහන්සේ අපගේ ගැළවීම ස්වර්ගයේ සිට පොළොවට හෙලූවේ යමෙක් තමාගේ බොහෝ වු සම්පත් වලින් භක්තිය හා පරාර්ථකාමිත්වය සලකා දෙන දානයක් ලෙස නොවේ. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය මීට වඩා වෙනස්ය. ජේසුස් වහන්සේ ජොර්දාන් නදියේ ජලයට පියවර තබන විට හා ස්නාවක ජුවාම් අතින් බෞතිස්මය ලබන විට උන්වහන්සේ එසේ කළේ සිත් හැරීමක් හෝ මනස්ථාපනයක් අවශ්‍යවු නිසා නොවේ. උන්වහන්සේ එසේ කළේ පව්කමාව අවශ්‍ය මිනිසුන් අතර සිටීමටත් අපගේ පාප වල බර උන්වහන්සේගේ කර මතට ගැනීමටත්ය.



මෙලෙස උන්වහන්සේ අපට සැනසීම දීමටත් අපව ගළවන්නටත් අපගේ කාලකණ්ණි කමින් මුදා ගන්නටත් අපව නිදහස් කළේ උන්වහන්සේගේ දිළිඳුකමින් මිස පොහොසත්කමින් නොවේ යැයි පාවුළු තුමා සදහන් කරන්නේ සිතට කා වදින ආකාරයෙනි. නමුත් ශු. පාවුළුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ අසීමිත ධනවත්කමත් (එපීස 3/8) එනම් උන්වහන්සේ සියල්ලේ උරුමකරුවා බවත් (හේබ්‍රෙව් 1/2) හොඳින් දූන සිටියේය. ක්‍රිස්තුස් වහන්සේ අපව පොහොසත් කරන හා නිදහස් කරන මෙම දිළිඳුකම කුමක්ද? මෙම දිළිඳුකමින් අදහස් වන්නේ පාරේ පැත්තක බාගෙට මිය ගොස් සිටි මිනිසාට අසල්වැසියා වූ යහපත් සමරිතානුවරයා මෙන් උන්වහන්සේ අපට ආදරය කිරීම හා අසල්වැසියෙක් වීමය(ලූක් 10/25 ආශ්‍රිතව).

සැබෑ නිදහස ගැළවීම හා ප්‍රීතිය වන්නේ උන්වහන්සේගේ දයාව මෘදුබව හා සහයෝගිතාවයයි. අපව පොහොසත් කරන ක්‍රිස්තුස් වහන්සේගේ දිළිඳුකම වන්නේ අප වෙත ඇති උන්වහන්සේගේ අසීමිත දයාවේ ප්‍රකාශවීමක් ලෙස මාංශගතවීම හා අපගේ දූර්වලතාවයන් හා පාපයන් තමාගේ කරගැනීමය. ක්‍රිස්තුස් වහන්සේගේ දිළිඳුබව සියල්ලෙහිම උතුම්ම නිධානය වේ. උන්වහන්සේගේ ධනය වන්නේ පියාණන් වෙත උන්වහන්සේගේ අසීමිත විශ්වාසනීයත්වයත් ස්ථිර විශ්වාසයත්ය. හැමවිටම උන්වහන්සේගේ ආශාව වන්නේ පියාණන්ගේ කැමැත්ත ඉටුකිරීමත් උන්වහන්සේව මහිමයට පත් කිරීමත්ය.

එක මොහොතකටවත් දෙමාපියන්ගේ ආදරය හා කරුණාව සැක නොකරන එම ආදරය ලබන හා ආදරය කරන දරුවෙකු මෙන් ජේසුස් වහන්සේගේ ධනය වන්නේ සිය පුත්‍රභාවයයි. දිළින්දෙකු වන මේ මෙසියස් තුමාගේ සුවිශේෂී වරප්‍රසාදයක් වන්නේ පියාණන් සමඟ ඇති අසහාය සම්බන්ධතාවයයි. උන්වහන්සේගේ සැහැල්ලු විය ගහ කරට ගන්නට අපට කියන විට ඉන් අදහස් කෙරෙන්නේ ධනවත් වූ දිළිඳුකමින් හා දිළිඳු වූ ධනවත් කමින් පොහොසත්වන්නටය. එලෙසම අපට ආරාධනා කරන්නේ උන්වහන්සේගේ පුත්‍රත්වයේ හා සහෝදරත්වයේ ආත්මයාණන්ගේ හා පුත්‍රත්වයේ දූ පුතුන් වීමටත් කුළුඳුල් සහෝදරත්වය තුළ සහෝදර සහෝදරියන් වීමටත්ය (රෝම 8/29 ඇසුරින්). 'සැබෑ පසුතැවීම වන්නේ සාන්තුවරයෙක් වීම පමණක් නොවේ' කියා ලියා ඇත. අපටත් කිව හැක්කේ 'ඇත්තේ එකම සැබෑ දිළිඳුකමක් පමණි. එනම් දේව දරුවන් හා ක්‍රිස්තුස් වහන්සේගේ සහෝදර සහෝදරියන් ලෙස ජීවත් නොවීමය.

**අපගේ සාක්ෂිය:**

මෙ තත්වයේ දිළිඳු බව ජේසුස් වහන්සේගේ දිළිඳුබව ලෙස අපට සිතෙන්නට පුළුවන. උන්වහන්සේ අනුව යන අපට නිවැරදි ආකාරයෙන් මානව සම්පත් වලින් ලෝකය ගලවා ගන්නට පුළුවන් බව පෙනී යා හැකිය. නමුත් කාරණය මෙය නොවේ.

සෑම කාලයකදීම හා ස්ථානයකදීම දෙවියන් වහන්සේ මිනිසා හා ලෝකය ගලවා ගන්නට කටයුතු කරන්නේය. දිළිදූන්ගේ ජනතාවක් වන උන්වහන්සේ සභාව මගින් ද දේව වචනය මගින් ද ප්‍රසාද නිධාන මගින් ද මෙම දිළිඳුකම ප්‍රකාශ කරන්නේය. දෙවියන් වහන්සේගේ ධනය අනිවාර්යයෙන් හා සුවිශේෂී ලෙසින් ගලා යන්නේ අපගේ ධනය තුළින් නොව ක්‍රිස්තුස් වහන්සේගේ ජීවයෙන් පණ ගැන්වෙන පෞද්ගලික හා සාංඝික දිළිඳුවීම තුළිනි. අපගේ ස්වාමින් වන ක්‍රිස්තුස් වහන්සේ අනුකරණය කිරීම තුළ කිතුනු අප කැඳවා ඇත්තේ අපගේ සහෝදර සහෝදරියන්ගේ දිළිඳුකමට මුහුණ දෙන්නටත් එය ස්පර්ෂ කරන්නටත් අපේම කරගැනීමටත් ප්‍රායෝගික දේවල් තුළින් එය තුරන් කිරීමටත්ය.

අනාථභාවය යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදු දිළිඳුකමක්ම නොවේ. අනාථභාවය යනු බලාපොරොත්තුව උපකාරය හා ඇදහිල්ල නැති දිළිදුකමය. ද්‍රව්‍යමය සදාචාරික හා අධ්‍යාත්මික යනුවෙන් අනාථභාවය තුන් ආකාරයකින් පවතී. දිළිඳු බව යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ ද්‍රව්‍යමය අනාථභාවයයි. මෙය බලපාන්නේ මානව ගරුත්වයට පටහැනි තත්වයන් තුළ ජීවත්වන අයටය. මෙයින් අදහස් වන්නේ මූලික අයිතිවාසිකම් නොමැති ආහාර ජලය සෞඛ්‍ය පහසුකම් රැකියා හා සංස්කෘතිකමය වශයෙන් වර්ධනය වන්නට හා සංවර්ධනය වන්නට අවශ්‍ය අවස්ථා නැති පුද්ගලයන් වේ. මෙම අනාථභාවයට පිළියම් වශයෙන් මිනිසත් බව විරූපි කරන තුවාලයන් බඳින්නටත් මෙකී අවශ්‍යතාවයන් සපුරාලන්නටත් ශු. සභාව ඇයගේ සහය හා සේවාව පුද කරන්නීය.

දිළිඳුන් හා සමාජයේ කොන්වුවන් තුළ අප දකින්නේ ක්‍රිස්තුස් වහන්සේගේ මුහුණවේ. දිළිඳුන්ට ආදරය කිරීමෙන් හා උදව් කිරීම මගින් අප ආදරය කරන්නේත් උදව් කරන්නේත් උන්වහන්සේටමය. අපගේ උත්සහයන් ඉලක්ක කෙරෙන්නේ අනාථභාවයට හේතු කාරක වන ලෝකයේ ඇති අපචාරයන් අක්‍රමිකතාවයන් හා මිනිස් ගරුත්වය කෙලෙසන දෑ නතර කිරීම වෙතය. බලයට සැප සම්පත් වලට හා මුදලට නමස්කාර කරන විට සාධාරණ ලෙස ධනය බෙදී යාම දෙවැනි වන්නේය. මෙනිසා අපගේ හෘදසාක්ෂිය සාධාරණත්වය සමානාත්මතාවය සරළබව හා බෙදා ගැනීම වෙත යොමු විය යුතුවේ. පාපයට හා දූසිරිතට වහල්වීම යනාදිය ඇතුලත් වන සදාචාර අනාථභාවය නොසලකා හැරිය හැක්කක් නොවේ. පවුලේ එක් සාමාජිකයෙක් විශේෂයෙන් තරුණ පුද්ගලයෙක් මත්පැන් මත් ද්‍රව්‍ය සූදුව හෝ අසැබි ලිංගිකත්වයට වහල්වූව හොත් එම පවුලට කොතරම් වේදනාවක් ඇති වන්නේද? කොපමණ දෙනා ජීවිතයේ අර්ථයක් නැතිව අනාගතය කෙරෙහි බලාපොරොත්තු රහිතව සිටින්නේද? සෞඛ්‍ය ආරක්ෂාව අධ්‍යාපනයට ඇති සම අයිතිවාසිකම නැතිවීමෙන් විරැකියාව ඇතිවේ. විරැකියාව නිසා ගෘහ මූලිකයාගේ ගරුත්වය නැතිව යයි. මෙවැනි අවස්ථා හා අසාධාරණ සමාජ තත්වයන් නිසා කොපමණ දෙනා සදාචාර අනාථභාවය තුළට කිඳා බසින්නේද? මෙවැනි කාරණා දෙස බලන විට සදාචාර අනාථභාවය සිය දිවි හානි කර ගැනීමට සමීප අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

මූල්‍යමය වශයෙන් පිරිහීමකට හේතු පාදක වන මෙකී තත්වයේ අනාථභාවය දේව ආදරය ප්‍රතික්ෂේප කරන විට හා දෙවියන්ගෙන් ඈත් වන විට අප අත්දකින අධ්‍යාත්මික අනාථභාවය හා අනිවාර්යයෙන් බැඳී ඇත. අපේ දේවල් අපටම කළ හැකි කියා විශ්වාස කරන විට හා ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපට සමීප වන දෙවියන් වහන්සේ අනවශ්‍ය යැයි කියා සිතන විට වැටීමක් කරා අපි ගමන් කරමු. අපව නිදහස් කිරීමටත් සැබවින්ම ගලවා ගන්නටත් හැකියාව ඇත්තේ දෙවියන් වහන්සේට පමණකි.

අධ්‍යාත්මික අනාථභාවයේ විෂ නසන ඖෂධය වන්නේ ශුද්ධවු සුවිශේෂයයි. කොහේ ගියද කිතුනුවන් ලෙස අප කැඳවා ඇත්තේ කළ පාප වලට සමාව දෙන ගැළවීමදායක සුපුවත පතල කිරීමටය. දෙවියන් වහන්සේ අපගේ පාපිෂ්ඨභාවයට වඩා අති විශාල බවත් උන්වහන්සේ සෑම කාලයකදීම අපට නිදහසේ ප්‍රේම කරන බවත් සදාතනික ජීවිතයට හා සාංඝිකත්වයට අපව මවා ඇති බවත් සුපුවත පෙන්වා දෙන්නේය. දයාවේ හා බලාපොරොත්තුවේ මෙම සුපුවතේ පණිවුඩකාරයන් වීමට ස්වාමින් වහන්සේ අපට ආරාධනා කරන්නේය.

අන්ධකාරයේ සැරිසරන සහෝදර සහෝදරියන්ට බලාපොරොත්තුව දෙමින් බිඳුනු සිත් ඇත්තන් සනසවමින් අපට බාරකොට ඇති නිධානය හා ප්‍රීතියේ සුපුවත බෙදා ගැනීම අපව උද්දාමයට පත් කරන්නකි. මෙයින් අදහස් වන්නේ දිළිඳුන් හා තමන්ගේ නැතිවූ බැටළුවන් ආදරයෙන් සොයා යන එඬේරෙක් වන ජේසුස් වහන්සේ අනුගමනය හා අනුකරණය කිරීමටය. උන්වහන්සේ සමඟින් උද්‍යෝගිමත් ලෙස ධර්මදානයේ නව මංපෙත් විවෘත කරන්නටත් මානව සංවර්ධනය ඇති කරන්නටත් හැකිවන්නේය.

**හිතවත් සහෝදර සහෝදරියනි**
ද්‍රව්‍යමය සදාචාරාත්මක හා අධ්‍යාත්මික අනාථභාවයන්ගෙන් පෙළෙන සෑමට ක්‍රිස්තුස් වහන්සේ තුළ සෑම සැදැහැවතෙකුම වැළඳ ගන්නා දේව තාත්තාගේ ආදරයේ සුභාරංචි පණිවුඩය මගින් සාක්ෂි දැරීමට මෙම චතාරික සමය තුළ හැකි වේවා. උන්වහන්සේගේ දිළිඳු බව තුළ අප පොහොසත් කරන ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරන තරමට මෙම කාර්යය කිරීමට අපට හැකි වන්නේය. තමකම නසා ගැනීමට චතාරිකය සුදුසු කාල පරිච්ඡේදයකි. අපගේ දිළිඳුවීම තුළින් අන් අයට උදව් වන්නටත් අන් අයව පොහොසත් කරන්නටත් කළ හැකි දේ අපි අපෙන්ම අසා ගනිමු නම් වඩාත් යහපත් දේ කළ හැකි වන්නේය. සැබෑ දිළිඳුකම අපට රිදුම් දෙන බව අමතක කළ නොහැක්කකි. පාපවලට දඬුවම් ලැබීම තුළ ඇති මේ දූක්ම නොමැතිව තම කම නසා ගැනීම කළ නොහැකිවේ. කිසිදු වටිනාකමක් හෝ නැති රිදුමක් නැති දයාව මම පිළිනොගනිමි.

දිළිඳුන් මෙන් ගණන් ගැණුනත් බොහෝ දෙනෙකු ධනවත් කරන කිසිත් නැත්තන් මෙන් ගණන් ගැනුනත් සියල්ල ඇත්තන් මෙන් සිටින අපට ශුද්ධාත්මයාණන් අපගේ තීරණ වලදී සවිමත් කර මිනිස් සමාජයේ අනාථභාවයන්හිදී අපගේ සැලකිල්ල හා වගකීම වැඩිකරන සේක්වා!

මේ නිසා දයාවන්ත වීමටත් දයාවෙන් යුතුව ක්‍රියා කිරීමටත් අපට හැකිවන්නේය. මෙම බලාපොරොත්තුව ප්‍රකාශ කරමින් මමද යාච්ඤා කරන්නේ එක් එක් සැදැහැවත් සාමාජිකයාට ද සෑම කිතුනු සංඝයකටම ද පලදායක චතාරික ගමනක් ආරම්භ කරන්නට හැකිවේවා කියාය. මා වෙනුවෙන් යාච්ඤා කරන මෙන් ඔබ හැමගෙන් ද මම ඉල්ලා සිටිමි. ස්වාමින් වහන්සේ ඔබ ආශිර්වාද කරන සේක්වා. අපගේ ස්වාමි දියණියන් ඔබ ආරක්ෂා කරන සේක්වා.

**පරිවර්තනය**
**ගරු උපුල් සිල්වා**
**පියතුමා**
**උඩුබද්දාව මීසම**

## මරිය දහමේ අධ්‍යාත්මිකත්වය - 5

# "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි" 2

අප සමිඳාණන් වහන්සේට කරන ප්‍රශංසාව තුළින් උන්වහන්සේගේ මහිමය තව තවත් මෙලොව තුළ පතුරුවයි. එය තව තවත් ප්‍රසාරණය කරවයි, ව්‍යාප්ත කරවයි. එමගින් උන්වහන්සේ අපගේ ජීවිත තුළ කරනු ලබන බලපෑම විශාල වේ, තීව්‍ර වේ. දෙවියන් වහන්සේට කරන ප්‍රශංසාව උන්වහන්සේව අන්‍යයන්ට හඳුන්වා දීමක් ද වේ. එවිට අන්‍යයන්ගේ ජීවිතද ඉතා උසස් තත්ත්වයකට එස වේ, අන්‍යයන්ද ශ්‍රේෂ්ඨත්වයට පත් වේ.

එවිට ඔවුන් විසින් ද කළ යුත්තේ මරිය තුමිය මෙන් සමිඳාණන් වහන්සේට දිගින් දිගට ප්‍රශංසා කිරීමයි. දෙවියන් වහන්සේට ප්‍රශංසා නොකරන හදවත මිය ගිය හදවතකි. දෙවියන් වහන්සේගේ ජීවය එයට ඇතුළු වන්නේ, එම ජීවයෙන් එය පිරී ඉතිරී පිටාර ගලන්නේ උන්වහන්සේට ප්‍රශංසා කරන විට පමණි. ප්‍රසංශා කිරීම සෑම විටම දෙවියන් වහන්සේ පිළිබඳ ගැඹුරු අත්දැකීමක ප්‍රතිඵලයකි. එමෙන්ම එම අත්දැකීම නඩත්තු කිරීමටත් දිගින් දිගටම ප්‍රශංසා කළ යුතුවේ.

මරිය තුමියගේ උදාන ගීතයේ පළමු වන කොටස (ලූක් 1:46-49) එතුමියගේ ජීවිතයේ අධ්‍යාත්මික සාරය පිළිබඳ සාරාංශයක් වැනිය. එතුමියගේ ජීවිතයේ සැබෑ ගැඹුර ඒ තුළින් මොනවට අනාවරණය වේ. එමෙන්ම එතුමිය ගැන දැන ගැනීමට අවශ්‍ය සෑම කරුණක්ම ඒ තුළ අඩංගු වී ඇත. දෙවියන් වහන්සේගෙන් මරියතුමියට අවශ්‍ය සෑම දෙයක්ම ලැබී ඇත. එතුමියට දෙවියන් වහන්සේගෙන් තවත් දෙයක් බලාපොරොත්තු වීමට නැත. එතුමියගේ සමස්ත ජීවිත කාලය පුරාම දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම හැර වෙනත් කිරීමට දෙයක් එතුමියට නැති තරම්ය.

උදාන ගීතයේ දෙවන කොටස (1:50-55) දෙවියන් වහන්සේ සමස්ත මානව වර්ගයාගේම සැබෑ ගැලවීම උදෙසා ක්‍රියාත්මක වන ආකාරය නිරූපණය කරයි. දෙවියන් වහන්සේ මරිය තුමියගේ ජීවිතය තුළ ක්‍රියාත්මක වන ආකාරයත්, සමස්ත මානව සංහතිය තුළ ක්‍රියාත්මක වන ආකාරයත් එකම කාසියේ පැති දෙක මෙන්ය. මෙම පාර්ශවයන් දෙක හරහාම දෙවියන් වහන්සේ ක්‍රියාත්මක කරන්නේ තමන් වහන්සේගේ එකම සැලැස්මය.

මරිය තුමියගේ උදාන ගීතය තුළ අඩංගු සෑම දේව ධාර්මික අදහසක්ම සමස්ත බයිබලය පුරාම පැතිරී ඇත. තවත් ලෙසකට පවසන්නේ නම් සමස්ත බලය පුරා පැතිරී ඇති අදහස් සහ අත්දැකීම් එතුමියගේ උදාන ගීය තුළද කුඩා පරිමාණයෙන් නිරූපණය වී ඇත. උදාන ගීතය ගැඹුරින් අධ්‍යයනය කිරීම සමස්ත බයිබලයම අධ්‍යයනය කිරීමට සමානය. අපි දැන් මෙම කරුණ උදාහරණ සහිතව සලකා බලමු. ඒ සඳහා මරිය තුමියගේ උදාන ගීතයත්, සමස්ත බයිබලයත් සංසන්දනය කර බලමු.

ලූක් 1:46-47 = "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි" මෙම අධ්‍යාත්මික අත්දැකීම සහ එහි ප්‍රකාශය බයිබලයේ තවත් ස්ථාන වල ඉතා පැහැදිලිව සඳහන් වී ඇත. "මම හිමි තුමන් ගැන ප්‍රීති ප්‍රමෝද වන්නෙමි; මා ගැලෙව්වේ හිම තුමන් බැවින් තුටු පහටු වන්නෙමි" (ගීතාවලිය 35:9). සැමුවෙල් දිවැසිවරයාගේ මව වන හන්නා ද මෙසේ ප්‍රකාශ කර ඇත. "මා සිත සමිඳුන් කෙරෙහි ප්‍රීතිමත් වේ. මාගේ සවිය සමිඳුන් කෙරෙහි උසස් වී තිබේ. ඔබ මා ගැළෙවූ නිසා මම ප්‍රීති වෙමි" (1 සාමුවෙල් 2:1). හබක්කුක් දිවැසිවරයාද මෙවැන් අත්දැකීමක් ප්‍රකාශ කර ඇත. "සමිඳුන් කෙරෙහි මම ප්‍රීති වන්නෙමි. මාගේ ගැළවීමේ දෙවිඳුන් කෙරෙහි ප්‍රීති ප්‍රමෝද වන්නෙමි (හබක්කුක් 3:18).

ලූක් 1:48a = "මක්නිසාද, එමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක." මීට සමාන්තර අදහස් ශුද්ධ ලියවිල්ල තුළ අඩංගු වී ඇති ආකාරය දැන් අපි සලකා බලමු. "සියල බලැති සමිඳාණන් වහන්ස, ඔබේ මෙහෙකාරි වන මාගේ දුක් දෙස හොඳින් බලා, මා සිහි කර, මා අමතක නොකර...." (1 සාමුවෙල් 1:11). "සමිඳාණන් වහන්සේ මාගේ දුක් බැලූ සේක" (උත්පත්ති 29:32). එමෙන්ම ද්විතීය සම්මත ග්‍රන්ථ වලට අයත් පොතක් වන හතර වන එස්රා (මෙය රෝමානු කතෝලික සභාව විසින් භාවිත කරනු ලබන බයිබලය තුළ අඩංගු නොවේ) හී මෙසේ සඳහන් වී ඇත. මෙහිදී සියොන් වඳ ස්ත්‍රියක් මෙන් කතා කරමින් මෙසේ ප්‍රකාශ කරයි." දෙවියන් වහන්සේ උන්වහන්සේගේ දාසියට ඇහුම් කන් දී, මාගේ දීන තත්ත්වය ගැන සැලකිලිමත් වී, මාගේ දැඩි වේදනාව සලකා බලා, මට පුතෙක් ලබාදුන් සේක" (9:45).

ලූක් 1:48b= "හැම පරපුරක්ම මෙතැන් සිට, භාග්‍යවන්තී ය'යි මට කියනු ඇත." පුරාණ ගිවිසුමේ ජාකොබ්ගේ බිරිඳ වූ ලෙයා ද තම සේවිකාව වූ ගිල්පා මගින් පුතෙකු ලැබූ විට මීට සමාන දෙයක් ප්‍රකාශ කර සිටියාහ. "මම කෙතරම් භාග්‍යවන්තද? ස්ත්‍රීහු මා 'භාග ‍යවන්තී' යයි පවසන්නෝය" (උත්පත්ති 30:13).

ලූක් 1:49a= "පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක." මෝසෙස් විසින් ඊශ්‍රායෙල් ජනතාවට ඊට සමාන දෙයක් මතක් කර දෙන ලදී. "ඔබ ප්‍රශංසා කළ යුත්තේ, බල බලා සිටියදීම මේ මහා භයානක දේවල් ඔබ උදෙසා ඉටු කළ, ඔබේ දෙවියන් වහන්සේගේ" (ද්විතිය නීති සංග්‍රහය 10:21). ශෙපනියා දිවැස්වරයාගේ පොතේද මීට සමාන අත්දැකීමක් වාර්තා වී ඇත. "ඔබේ දෙවි සමිඳාණෝ ඔබ සමගය. ඔබට ජය අත් කර දෙන සෙබළාණෝය" (3:17).

ලූක් 1:49b = "පරිශුද්ධයාණෝ යනු එතුමන්ගේ නාමයය" ගීතාවලිය තුළද මෙම දේව ධාර්මික සත්‍යය සඳහන් වී ඇත. "එතුමන්ගේ නාමය සුවිශුද්ධය" (111:9).


ලූක් 1:50 = "එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ." ගීතාවලියද මෙම අධ්‍යාත්මික අත්දැකීම ඉතා පැහැදිලිව ඉදිරිපත් කොට ඇත. "සමිඳුන්ගේ තිර පෙම, තමන්ට ගරුබිය පාන අය කෙරෙහි සදාකාලයෙන් සදාකාලයට වේ" (103:17). එමෙන්ම ක්‍රි.ව. පස් වන ශත වර්ෂයේ සිට සමහර බයිබල් වල අඩංගු වී තිබූ "සලමොන්ගේ ගීතාවලිය" (Psalms of Solomon) තුළත් මීට සමාන අදහසක් අඩංගු වී ඇත: "උන්වහන්සේ කෙරෙහි ගරුබිය පාන අය කෙරෙහි උන්වහන්සේගේ දයා කරුණාව පවතී" (13:11).

ලූක් 1:51-53 = "සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා, උඩඟු උදම් සිතැත්තන් විසුරුවා හැර, මහ නරපතීන් සිය සිහසුන් වලින් පහත හෙළා, දීනයන් ඉහළ නංවා උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක." මෙම දේව ධාර්මික සත්‍යතාවය බයිබලය තුළ අලුත් අදහසක් නොවේ. සාමුවෙල් දිවැසිවරයාගේ මව වූ හන්නාගේ යාච්ඤාව තුළ මෙම අදහස විස්තරාත්මකව අඩංගු වේ. "සමිඳාණෝ දිළිඳු කමද පොහොසත් කමද ඇති කරන සේක. පහත්කම ද උසස්කමද ගෙන දෙන සේක. අධිපතීන් සමග හිඳුවන පිණිසත්, මහිමාසන උරුම කර දෙන පිණිසත්. එතුමාණෝ දුප්පතා ධූලියෙන් නැඟුටුවන සේක" (1සාමුවෙල් 2:7-8). ගීතාවලිය තුළද මෙම අදහස ගැබ් වී ඇත. "ඔබ.... සිය බාහු බලය පා සතුරන් පලවා හළ සේක" (89:10). උපදේශකයා හෙවත් සිරාක් පොතද මෙවැනි අදහසක් ඉදිරිපත් කරයි. "සමිඳාණෝ බලවතුන්ගේ ආසන බිඳ හෙළූ සේක. ඔවුන්ගේ තැන්වල වාඩිගන්නට බැහැපතුන්ට සැලැසූ සේක" (10:14).

ජෝබ්ගේ පොතේද දෙවියන් වහන්සේ මීට සමාන දේවල් ඉටු කරන බව ඉඟි කර ඇත. "එතුමාණෝ..... බලවතුන් පහළට හෙළන සේක" (12:19). එමෙන්ම 1947 දී කුම්රාන් නමැති ස්ථානයෙන් සොයා ගන්නා ලද ඇකුළුම් පත් වලින් එකකද එම අදහසට සමාන අදහසක් සඳහන් වී ඇත. "ඔබ වහන්සේ ඔබවහන්සේගේ ශක්තියෙන් පහතට වැටුනු වුන් නැඟිටුවා, උසස් හා බලවන්තයින්ව පහතට දැමූ සේත" (1QM14:10-11). එසකියෙල් දිවැසිවරයාද එවැනි අත්දැකීමක් ගැන සඳහන් කර ඇත. "කිරීටය ගලවා දමන්න. ඔටුන්න ඉවත් කරන්න. මෙය තිබුණු අන්දමටම නොවන්නේය. පහත් දේ උසස් කරන්න. උසස් දේ පහත් කරන්න" (21:26). ගීතාවලියටද මෙම අත්දැකීම ආගන්තුක දෙයක් නොවේ. "මන්ද, එතුමාණෝ පිපාසිත වූවන් තෘප්තියට පමුණුවන සේක. සාගිනි වූවන් යහපත් දෙයින් පිනවන සේක" (107:10).

ඉදිරි කලාපයට... »





මහාචාර්ය ඇන්ටන් මීමන

සංග්‍රහය

## මරියතුමිය සහ කතෝලික සම්ප්‍රදාය - 5

### ජන්ම පාපයෙන් මරිය තුමිය සැබවින්ම නිදොස් වූවා ද? - I

ජන්ම පාපය (Originali Peccata=Original Sin) යන ඉගැන්වීම කතෝලික සභාව කෘතිමව සකස් කරන ලද්දක්ද? ඒ සඳහා බයිබලීය, දේව ධාර්මික, මනෝ විද්‍යාත්මක, මානව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක, ඓතිහාසික සහ අධ්‍යාත්මික පදනමක් තිබේද? ජන්ම පාපය හඳුන්වා දෙන ලද්දේ වෙනත් ජාතීන්ව කතෝලික සභාවේ ග්‍රහණයට හසුකර ගැනීමට ද? මරිය තුමිය සහ ජන්ම පාපය අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? පිළිසිඳ ගත් මොහොතේ පටන් පෘථිවියේ ගත කරන ලද අවසාන මොහොත දක්වා එතුමිය ජන්ම පාපයේ ග්‍රහණයෙන්, වහල්කමින් සහ බලපෑමෙන් සැබවින්ම මිදී සිටියාද?

ජන්ම පාපය යනු මිනී මැරීම, කාමමිථ්‍යාචාරය කිරීම, සොරකම් කිරීම, බොරු සාක්ෂි කීම. අන් වස්තු ආශා කිරීම වැනි පාපයක් නොවේ. ඒ නිසාම අපි පාපොච්චාරණය නමැති සක්‍රමේන්තුවට සහභාගී වීමේදී "පියාණෙනි මා ජන්ම පාපය" කළා කියා නොපවසමු. ජන්ම පපාය අනෙක් පාපකාරී ක්‍රියාවන්ගේ ගොඩට දමා තේරුම් ගත නොහැකිය. එමෙන්ම එය අප දෛනික ජීවිතය තුළ සිදු කරන වෙනත් පව් සමගද සංසන්දනය කළ නොහැකිය.

ජන්ම පාපය යනු පාපකාරී සිතුවිළි, ක්‍රියාවන්, හැසිරීම් රටාවන් සහ චේතනාවන් කෙරෙහි අප තුළ ඇතුලාන්තයෙන් පවතින ආකර්ෂණයයි, ප්‍රවණතාවයයි, ඇල්මයි, පෙළඹවීමයි, වශීවීමයි, පාපය දෙසට අපටම නොතේරී අපව ඇදී යෑමයි. පාපයේ ග්‍රහණයෙන් පහසුවෙන් මිදීමට අප තුළ පවතින නොහැකියාවයි, දුෂ්කරතාවයයි, අපහසුවයි. නමුත් ඇත්තෙන්ම අප තුළ පාපය කෙරෙහි ඉතා සියුම් ආකර්ෂණයක්, ඇල්මක්, නතුවීමක් තිබේද?

කුඩා ළමුන් පිරිසක් පූස් පැටියෙක්ව හෝ බලූපැටියෙක්ව හෝ අල්ලා ගෙන උෟට දෙන වද වේදනා දෙස මඳක් බලන්න. මෙම අවුරුදු 6 ක් හෝ 7 ක් හෝ වූ ළමුන් එවැනි අහිංසක සතෙකුට ඇනීමට, වද දීමට පෙළඹුනේ ඇයි? ඔවුන්ව පොළඹවූ බලවේගය කුමක්ද? එම අහිංසක සතාට වද වේදනා දීමෙන් ඔවුන් විශාල සතුටක්, තෘප්තියක් ලබන්නේ කෙසේද?

අන්‍යයන්ට හිරිහැර කිරීමට, ඇනීමට, වද වේදනා ලබාදීමට අප තුළ ස්වභාවයෙන්ම, ඇතුලාන්තයෙන්ම තල්ලුවක්, ප්‍රවණතාවයක්, රුචියක් යම් ආකාරයකට පවතින බව මෙම උදාහරණය මගින් අපට අවබෝධ කර ගත හැකිය. එමෙන්ම පාප කාරී ක්‍රියාවන් උදෙසා ඇති එම ආකර්ෂණය සමස්ත මානව සංහතියටම පොදු වූවකි. කිසිම පුද්ගලයකුට තමන් සුදනෙකු ලෙස පෙනී සිටිය නොහැකිය. මෙම ප්‍රවණතාවය සම්බන්ධයෙන් එක පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකුට වඩා උසස් හෝ පත් හෝ නොවේ. අප සෑම දෙනා තුළම එම ප්‍රවනතාවය පවතී.

එමෙන්ම මෙම පාපයට ඇති අභිරහස්මය ආකර්ෂණය සම්බන්ධයෙන් එක පරම්පරාවක් තවත් පරම්පරාවකට වඩා යහපත් හෝ අයහපත් හෝ වේ, හොඳ හෝ නරක හෝ නොව්, උසස් හෝ පහත් හෝ නොවේ. එය සමස්ත මානව සංහතියටම පොදු තත්ත්වයකි. මානව සංහතියේ ආරම්භයේ සිට අද දක්වා මෙම ප්‍රවණතාවය පැවතී ඇත. එමෙන්ම එය අනාගතයේදීද පවතින තත්ත්වයකි.

ජන්ම පාපය අපගේ ආදී මව්පියන් දෙදෙනාගෙන් උරුම වූ දෙයක් බව යන්නෙන් අදහස් කරන්නේ එයයි. එමෙන්ම එය එක පරපුරකින් තව පරපුරකට ගලා ගෙන යනවා යන්නෙන් අදහස් කරන්නේ එයයි. නමුත් මෙම අදහස අප පටලවා ගන්නේ නැතිව තේරුම් ගත යුතුය. අප හැම දෙනා තුළම පාපයට ආකර්ෂණයක් තිබුනත්, අප හැම දෙනාම එහි ගොදුරක් බවට පත් වී පාපකාරී ජීවිත ගත කරන බව මෙයින් අදහස් නොවේ. පාපයට ඇති නැඹුරුට අප ප්‍රතිචාර දක්වන ආකාරය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. ජන්ම පාපයේ ක්‍රියාකාරිත්වය ගැන අප අවදියෙන් සිටින ප්‍රමාණයේ විවිධ මට්ටම් තිබිය හැකිය. හැම පුද්ගලයෙක් තුළම ඒ ගැන එක හා සමාන අවදිවීමක්, අවබෝධයක් සහ අවංක භාවයක් නොතිබෙන්නට පුළුවන.

අපි අප තුළ පාපයට පවතින අභිරහස්මය ආකර්ෂණය ගැන අවදියෙන් සිටියත් නැතත්, ඒ ගැන අවබෝධයක් තිබුන්ත නැතත්, එහි ක්‍රියාකාරීත්වය අපට අවතක්සේරු කළ නොහැකිය, එය ප්‍රතික්ෂේප කළ නොහැකිය. අප නොතේරෙන බලවේග අප තුළ ක්‍රියාත්මක විය හැකිය.

පාපයට අප තුළ පවතින වැළැක්විය නොහැකි තරමට ප්‍රබල ආකර්ෂණය පිළිබඳව බයිබලය තුළද ඉඟි පවති. "ස්ත්‍රිය ද ගස පෙනුමට කෙතරම් රමණීයද පල කෙතරම් ප්‍රණීත ද නුවණ වැඩුමට කෙතරම් කදිම ද කියා දුටු විට එයින් ගෙඩි කීපයක් කඩා කෑවාය. තමා සමග සිටි සිය සැමියාට ද ඉන් සමහරක් දුන් විට ඔහුද කෑවේය" (උත්පත්ති 3:6). පාපය අප ඉදිරියේ සෑම විටම පෙනී සිටින්නේ අවලස්සන, අසුන්දර, කැත, විරූපී, නපුරු, තිත්ත දෙයක් ලෙස නොව, ඉතා රමණීය, ප්‍රණීත සහ කදිම දෙයක් ලෙසයි. අප පාපයේ ගොදුරක් බවට ඉතා පහසුවෙන් සහ ලෙහෙසියෙන් පත්වන්නේත් එහි පවතින ඉතා ප්‍රබල ආකර්ෂණීය භාවය නිසයි. පාපය හැම විටම ඉතා අසුන්දර, විරූපී, අවලස්සන, නපුරු, තිත්ත සහ අප්‍රසන්න දෙයක් ලෙස අප වෙතට ළඟා වෙන්නේ නම් අපට එයින් බේරී සිටීම පහසු දෙයක් බවට පත්වේ. අසුන්දර, විරූපී, අවලස්සන දෙයකට අප කවුරුත් ආකර්ෂනය වන්නේ නැත.

ඉදිරි කලාපයට... »

පහන්

# වසර සියයක් සපිරි ගුණ ගරුක ගුරුපියා

ඈත අතීතයේ මිනිසාගේ ආයුෂ කාලය ගැන විමර්ශනය කරද්දී ශු. බයිබලයේ එන ආබ්‍රහම්ගේ යුගයේ මිනිසුන් වසර 300-600 පවා ජීවත් වූ බැව් අනාවරණය වෙයි. එහෙත් ඒ එදාය. අද මිනිසාගේ ආයු කාලය හාත්පසින්ම වෙනස්ය. එදා ජන ජීවිතය ගැන මෙනෙහි කරද්දී සුන්දර වටපිටා පරිසරය මිනිසාගේ සිත කය පිනවීමට සමත් වුනා. එහෙත් අද මිනිසා ක්ෂණික මුදල් හඹා යෑම නිසා පරිසරය දූෂණය වී වස විෂ ආහාර පාන භාවිතය නිසා නොයෙක් රෝගාබාධවලට ගොදුරු වීම හේතුවෙන් මිනිසාගේ ආයුෂ කාලය අවු. 50-60 බවට පත්ව ඇත.

මෙම කරුණු කාරණා අපට එළි පෙහෙළි කරමින් දහස් ගණන් ගෝල බාලයන්ගේ නැණ - නුවණ - දියුණු කළ වසර 100 ක් සම්පූර්ණ කරමින් ශරීර සුවයෙන් අදටත් පසුවන ගුරු පියකු සොයා ගිය ගමනක විගතුග මෙසේ දිග හරින්න දෙන්න මට අවසර.

අප ජීවත්වන මේ සමාජය තුළ ඉතාමත් ඉහළ තලයේ වැජඹෙන පරිණත ගුරු ගෝල පිරිසක් බිහි කළ මේ ගුරුපියා ඇහින් නොදැක නමින් කීවත් ඔබ හඳුනන දෙහිවලගේ නික්ලස් ප්‍රැන්සිස් කොස්තා ඉස්කෝලෙ මහතාය.

ඔහු එදා අම්මගෙන් බිව්ව මව් කිරි වල ශක්තිය නිසාදෝ හෙතෙම ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් පරිනත - ඥාණ ශක්තිය තවමත් සිහි එලවන ජව සම්පන්න පුද්ගලයෙකි.

ජාඇල කලඑළිය ප්‍රදේශයේ අද ජීවිතයේ සැඳෑ සමය සුවසේ විඳින ඔහුගේ මතක සුවඳ තොර තෝංචියක් නොමැතිව ගලා එමින් මගේ පෑන් තුඩට ඉස්පාසුවක් නොමැති විය. මේ ඔහුගේ කට හඬය.

දැන් මට වයස අවුරුදු 100 යි. මා මෙලොවට බිහි කළ මගේ අම්මගෙ නම පවස්තිනා රොවෙල් මා හදා වඩා ගන්න නෙක දුක වින්ද පියා මනුවෙල් කොස්තා. මගේ උපන් ගම වැවලයි. අපේ පවුලෙ මා සමග පිරිමි දෙන්නයි. ගැහැනු දෙන්නයි මං තමයි පවුලේ වැඩිමලා වර්ෂ 1913.09.02 වැනි දින තමයි මං මෙලොවට බිහිවුනේ.

මට පාසල් යන්නට පෙර හා පුරා කියා අ..... ආ කියල අකුරු කියෙව්වේ ගරු ලියෝ පියතුමාය. රෙද්ද බැනියම ඇඳල තාත්තගෙ සුළැඟිල්ලෙ එල්ලිල වැවල රෝ. ක. පාසලට මාව තාත්ත ඇරලපු දවස අද වගේ මතකයි. තාත්ත මගෙ දෝතට බුලත් හුරුල්ලක් දීලා පුතේ ඉස්කෝල මහත්තයාට වැඳපන් කීවා. කෝට් රෙදි ඇන්ද ප්‍රැන්සිස් ඉස්කෝල මහත්තයාට මං තරමක භයකින් වගේ දණ ගහල වැන්ද.

පාසල් ජීවිතය හරියට ගලා බසින පුළුල් දිය දහරාවක් වගේ හරිම සුන්දරයි. අපි කොල්ලො කුරුට්ටෝ එක්කල වෙල් එළියේ දුව පැන සෙල්ලම් කරපු හැටි මතක් වෙද්දී හරි ආසයි. අඹ ගස්වලට කජු ගස්වලට පොලු ගහපු ඒ සුන්දර කාලය අද වගේ මතකයි.

එදා අද වගේ විදුලි ආලෝකය තිබුණේ නැහැ. හැම ගෙදරකම වාගේ දැල්වුනේ භූමිතෙල් කුප්පි ලාම්පු. අම්ම තාත්ත බෙහෙවින් ආගමට ලැදි නිසා රාත්‍රියට කෑමට පෙර හැමදාම කොන්තෙ කියනවා.

යමක් කමක් තේරෙන වයසට එළඹෙද්දී මං පල්ලියේ පූජාවට උදව් වුනා. එදා අද වගේ O/L, A/L තිබුණේ නැහැ. තිබුණේ ප්‍රාරම්භය සහ ජ්‍යෙෂ්ඨ විභාගයයි.

අවසාන ගුරු විභාගය වැවලින් ප්‍රථමයට සමර්ථ වුනේ මමයි. මට උගන්නපු ගුරුවරු තමයි අන්තෝනි පොන්සේකා සහ සෙබස්තියන් ගුරුනාන්සෙ. එදා ගුරුවරයකුගේ මාසික වේතනය රු. 20/= යි මේ ගුරුවරු ළමයින්ට හරියට කැප වෙලා ඉගැන්නුවා. ජ්‍යෙෂ්ඨ පංතියේ ළමයින්ට ඉස්කෝලෙන් පස්සෙත් නොමිලේ ඉගැන්නුවා. ගුරු විභාගය සඳහා මග්ගොන රෝ. ක. ගුරු අභ්‍යාස විද්‍යාලයේ වසර දෙකක පුහුණුවක් ලබා ගැනීමෙන් පසුව හා හා පුරා කියා ගමට යාබද කලඑළිය ගමේ පාසලට මට පළමු පත්වීම ලැබුණා.

එවක මෙහි මුල්ගුරුවරයාව සිටියේ එම්. ඩී. ප්‍රැන්සිස් ඉස්කෝලෙ මහතාය. මට උගන්වන්න ලැබුණේ 4 වන පංතියට සහ ජ්‍යෙෂ්ඨ පංතිවලටයි. ඉගැන්නුයේ භූගෝල විද්‍යාව, ආගම සහ සෞඛ්‍යයයි. 4 වෙනි පංතියේ ළමයි 40 ක් විතර සිටි අතර ජ්‍යෙෂ්ඨ පංතියට සිටියේ ළමයි 5 දෙනයි. ගුරුවරු රෙදිකෝට් ඇන්ද අතර ගුරුවරියන් ඇඳ පැළඳගෙන ආවේ සාරියි.

මං හැමදාම පාසල් ගියේ පා පැදියෙනි. වසර 16 ක් කලඑළිය පාසලේ ඉගැන්වීමේ කටයුතු කළා. මට තාම මතකයේ රැඳි සිටින දෙයක් තමයි දවසක් පල්ලිය ඉදිරිපිට ළමයි 3 දෙනෙකු ගහ ගත්ත. මේ දුටු මං එවෙලේම තුන් දෙනා කනෙන් ඇදන් විත් වේවැල් පහර දීල පාසල ඇතුලේ දණ ගස්වල කුරුසය ආකාරයට අත් විහිදුවා ඉන්න අණ කළා. සැහෙන වේලාවක් දණ ගසාගෙන සිටි ළමයි දෙන්නෙක් අමාරුවට අත් පහත් කර සිටියා. මැද සිටි ළමයා අත් විහිදගෙ නම සිටිනු දුටුවා. ඒ වෙනින් කවුරුවත් නොව කුරුණෑගල (ඇතුගල්පුර) රදගුරුව සිටි අද විශ්‍රාමිකව සිටින රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ය. මං එදා සිතුවා මේ ළමයා කවදා හරි සමාජයේ හොඳ ස්ථාවරයකට එන ළමයකු වෙයි කියල. මගෙන් අධ්‍යාපනය ලද ගෝල බාලයන් අද පොලිස් නිලධාරීන්, වෛද්‍යවරුන්, ගුරුභවතුන්, හමුදා උසස් නිලධාරීන් ඇතුළු ප්‍රභූ පිරිස් මුණගැසුනාම මා ලබන සතුට කියා නිම කරන්න බැහැ.

කලඑළිය පාසලෙ උගන්වන කාලේ මං හීනයක් දුටුවා කව්ද වයසක කෙනෙක් මට සිහිනෙන් කීවා උඹේ



ඇට කටු කවදා හරි දාන්න වෙන්නෙ අලගොල්ලෑවේ කියල.

ඒ දවස්වල පාසල් පාලනය කළේ පියතුමන්ලා යටතේ සිහිනය දැකල තෙදිනකට පස්සෙ බොරැල්ලෙ ජනරල් මැනේජර් ගරු අන්තෝනි පියතුමාව මුණ ගැසෙන්න කියල පණිවිඩයක් ලැබුණා. පසුව මට උන්වහන්සේව මුණ ගැසුනම ඇහැව්වා කැකිරාවට මාරුවක් වෙන්න කැමැතිද කියල. මං කැමැතියි කිව්ව. පස්සෙ මට සිහිනය මතක් වෙලා ගොඩක් භය හිතුනා.

පසුවදා පියතුමාගෙ කාරකෙන්ම පියතුමා සමග කැකිරාවට මාව එක්ක ගියා. ඊළඟ පත්වීම මට ලැබුණේ අලගොල්ලෑව නමැති දුෂ්කර ප්‍රදේශයක පාසලකටය. එවකට උතුරු මැද ප්‍රදේශ භාරව සිටියේ ගරු රෙජිනෝල්ඩ් පියතුමාය. අලි කොටි වලස්සු විෂ ඝෝර සර්පයින් සිටින මහා මූකලානක පිහිටි අලගොල්ලෑව රෝ. ක. මිශ්‍ර පාසලේම සිටි ළමයි සංඛ්‍යාව 24 යි. අටවන පංතියට සිටියේ එක ළමයයි. මුළු උතුරු මැද ප්‍රදේශයටම මීසම් 7 ක් තිබූ අතර අලගොල්ලෑව පාසල පුංචි කඩ කාමරයක් වැනි පල්ලිය ඉස්තෝප්පුවේ පැවතුනා. බොහෝ විට ඉඩ කඩ නොමැති නිසා ගස් යට පවා ඉගැන්නුවා. බෞද්ධ බලවේගයක් ඇති මේ ප්‍රදේශයේ කතෝලිකයිනට නොයෙක් අකටයුතුකම් කළා කතෝලික දේවස්ථානයක් පවා කඩා දැම්මා. රාත්‍රියට අලි කොටි වලසුන්ගේ භයංකර ශබ්ද ඇසෙද්දී සැහෙන්න බියෙන් තමයි සිටියේ. පස්සෙ පරිසරයට පුරුදු වුනා. මුළු පළාතටම උදේ සවස පාරේ දුවන්නේ බස් දෙකයි. මේ නිසා අතීශයින් දුර බැහැර ළමුන්ට පාසල් ඒමට දුෂ්කර වුනා.

ප්‍රදේශයේ සමාජ සේවකයකු වන සල්ලිය බාගෙ ඇති ඩේවිඩ් මුදලාලි තමාගේ බස් රථය දරුවන්ට උදේ හවස පාසල් යන්න ප්‍රවාහනය නොමිලේ ලබා දුන්නා.

අලගොල්ලෑව මුළු පාසලටම මාත් එක්ක තවත් ගුරුවරියක් සිටියා උඩුගම කියල. 1954 මේ පුංචි පල්ලියයි ඊට යාබද ඉස්තෝපු කැල්ලෙ පිහිටි පාසල එදා අයිතිව තිබුණෙ යාපනය පදවිය භාරව සිටි අතිඋතුම් එමලියානු පිල්ලේ කියන හිමිපාණන්ටයි.

ගම්මුන්ගේ එකමුතු කම නිසා එමිලියානු පිල්ලේ රදගුරු හිමිපාණන් විසින් අලගොල්ලෑව දෙව්මැඳුර හා පාසල සඳහා මහ මූකලානෙන් ලැබුණු ඉඩම් අක්කර 4 කැලෑව එළි පෙහෙළි කරල ඉඩමෙන්ම මැටි පුච්චල ගඩොල් හදල පල්ලිය හදන්න ගත්ත. මේ මූකලානේ මං පොඩි කුඹුරකුත් අස්වැද්දුව. ඉදහිට අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ඇවිත් බලල යනවා.

ගරු රෙජිනෝල් පියතුමා සමග උතුරු මැද පළාතේ හැම මීසමකටම මටත් යන්න ලැබුණා, එදා අලගොල්ලෑවේ පවුල් 40 ක් විතර සිටියා. ප්‍රධාන රැකියාව ගොවිතැනයි. මුළු ගමටම සිටියේ එකම රජයේ සේවකයෙකි. ඔහු සෞඛ්‍ය අංශයේ සුළු සේවකයෙකි. මං අලගොල්ලෑවේ වසර 2 ක් සේවයෙ යෙදුනා.

එදා පිදුරු සෙවිලි කළ මැටි ගැසූ ගෙවල් දොරවල් අද උළු ගෙවල් බවට පරිවර්තනය වෙලා. අලගොල්ලෑව මිනිස්සු ආගමට හරි ලැදියි. ගුරුවරුන්ට හරියට ගෞරව කළා.

එවකට සිටි කොළඹ කාදිනල් අතිඋතුම් තෝමස් බෙන්ජමින් කුරේ හිමි මට කීව ගෙයක් දොරක් හදා ගන්න සල්ලි දෙන්නම් ඊට අමතරව පඩියට තව රු. 40/= ක් දෙන්නම් අලගොල්ලෑවේ නවතින්න කියල.

මට අලගොල්ලෑවෙන් 1956 නායකකන්ද පිරිමි පාසලට මාරුව ලැබුණා. ඊට පස්සේ මගේ කැමත්තෙන් මාබෝල පාසලට මාරුවක් ගත්තා. වසර 5 ක් මෙහි සේවයෙන් අනතුරුව විශ්‍රාම ගියා.

විශ්‍රාම ගැනීමෙන් පසුව සීමා සහිත ජාඇල විශ්‍රාම වැටුප් ලබන අයගෙ සංගමයේ ගම්පහ දිස්ත්‍රික්කයේ සභාපති බවට පත්වෙලා විශ්‍රාමිකයින්ට මහජන බැංකුවෙන් පොලි රහිත ණය ලබා ගැනීමට ක්‍රමවේදයක් ඇති කළා.

ගම්පහ දිස්ත්‍රික්කයේ විශ්‍රාමිකයින් 57,000 කින් විශ්‍රාමිකයන්ට කරන ලද සේවයට හිමි එකම පදක්කම් ලාභියා නික්ලස් කොස්තා වන අප ගුරුපියාය.

විශ්‍රාම ගියත් ඔහු සිය පරිනත භාවය තව තවත් පිළිබිඹු කරමින් සිළුමිණ පත්‍රයේ ප්‍රහේලිකා තරග කිහිපයකින් ජයග්‍රණය කර ඇති බැව් පවසයි.

**ඩබ්. එම්. ලෙස්ලි**


# ජනතා සේවයට දිවියම කැපකර දිවියට සමුදුන් මානව හිතවාදියා

මිනිසුන් උපදිති. මියයති. තම උපන් දේශයට මතු පරම්පරාවට, තම සහෝදර ජනතාවට සේවාවක් කර එම සේවාව ජනතා අගැයුමට ලක්වේ නම් කෙනෙක් අමරණීය වන්නේය.

එවැනි ජනතා පුත්‍රයකු වූ පමුණුගම ඇලෙන්එගොඩ දොන් ජෝශප් රපියෙල් ජෝන් ජයකොඩි නොහොත් ඩී. ජේ. ආර්. ජේ. ජයකොඩි (කවුරුත් ආදරයට අමතන, ජයකොඩි මහත්මයා) පනහේ දශකයේ සිට පමුණුගම කීර්ති නාමය වර්ණවත් කළ එඩිතර යුග පුරුෂයෙක් විය.

1930 වසරේ මෙලොව එළිය දුටු ජයකොඩි මහතා පමුණුගම වංශවත් පවුලක් වූ දොන් ජෝශප් ජයකොඩි හා ගම මැද ලියනගේ මේරි ප්‍රැන්සිස්කා මහත්මියගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයෙකි. පළමුව පිහිටුවූ පමුණුගම ගම් කාර්ය සභාවේ ජනතා වැඩි ඡන්දයෙන් පමුණුගම ගම් කාර්ය සභිකයා වූ ඔහු ජනතා ප්‍රශ්න හා ග්‍රාමීය ප්‍රශ්න ගැන දැඩි ලෙස සංවේදීව කටයුතු කළේය.

පමුණුගමට පළමුවරට ඩිස්පැන්සරියක් පිහිටුවීමෙහිලා පුරෝගාමියෙකු වූ ඔහු ඒ සඳහා එම භූමි භාගය ලබා ගැනීමට කරන ලද අරගලයේද පුරෝගාමියා විය. ඉන්පසු හැටේ දශකයේ එම ඩිස්පැන්සරිය ග්‍රාමීය රෝහලක් කිරීමටද පෙරමුණගත්තේ ඔහුය. අද එය පර්යන්ත රෝහලක් දක්වා උසස් තත්ත්වයට පත්වීමේ ඉතිහාසයේ යුග පුරුෂයා ඔහුය.



අද ප්‍රදේශයේ පවතින අතුරු මාර්ග රාශියක් ලබා ගැනීමට පුරෝගාමියා වූයේද ඔහුය. 60 ජූලි මාසයේ එවකට විදුලිබල අමාත්‍ය වරයාව සිටි මෛත්‍රීපාල සේනානායක මහතා මගින් පමුණුගම ප්‍රදේශයට පළමුවරට විදුලිය ලබාගැනීමට පුරෝගාමියා වූයේද ඔහුය. ප්‍රදේශයේ හැම ජනතා ප්‍රශ්නයකදීම යුක්තිය හා සාධාරණය වෙනුවෙන් ජනතාවගේ පැත්තේ සිටි ඔහු දෙව්මැඳුරේ පියවරුන් සමග පවා සාධාරණය වෙනුවෙන් කළ අරගල එමටය.

1971 ත්‍රස්තවාදී කැරැල්ලේදී සැක කරුවකු ලෙස ඔහු නිරපරාදේ මාස 9 ක් බන්ධනාගාර ගත කර ද සිටියේය. පමුණුගම ඉතිහාසය කට පාඩමින් කීමට සුවිශේෂී හැකියාවක් තිබූ ඔහු පමුණුගම බුද්ධිමතුන් එක්වූ මොහොතක පැය 3 ක් පමණ පමුණුගම ඉතිහාසය පිළිබඳ දේශනයක් කළේය.

පමුණුගම කලාකරුවන්, මාධ්‍යවේදීන් හා බුද්ධිමතුන් සමග සමීපව කටයුතු කළ ඔහුගේ වඩාත් සමීපතම මිත්‍රයා වූයේ ප්‍රදීපයේ වත්මන් සංස්කාරක දුන්ගාල්පිටියේ ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි පියතුමාගේ දයාබර පියාණන් වූ මාධ්‍යවේදී සාන්තසාගර හෙට්ටිආරච්චි මහතාය. බොහෝ සමාජ අසාධාරණ ප්‍රශ්නවලදී ප්‍රදීපයට ලිපි සැපයූ අදීන දක්ෂ ලේඛකයෙක්ද විය. පමුණුගම කිතුනු පුරයේ ඉතිහාසයේ එක් යුගයක් වර්ණවත් කළ එහි කීර්ති නාමය රැන්දූ ජයකොඩි පියා මිය යන තුරුම අවිවාහකව පිරිසිදු යහපත් චාම් සරල දිරියක් ගත කළ උත්තම පුරුෂයෙකි.

එතුමාගේ ආත්මයට දේව රාජ්‍යයේ උරුම හිමිවේවා. ප්‍රදීප ලේඛක, පාඨක හා සංස්කාරක පියතුමාගේද පැතුම එය වේ.

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# දහම් සේවාවේ වසර විසි පහක සේවයට උපහාර!

වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ වසර විසි පහක සේවා කාලයක් සංක්‍රිස්තියන් ලෙස කටයුතු කළ මුතුකුඩ ආරච්චිලාගේ දොන් ලයනල් තියඩෝර් අප්පුහාමි මහතා සිය සේවයෙන් විශ්‍රාම ලැබීම නිමිතිකොට ඔහු වෙනුවෙන් උපහාර උලෙළක් පැවැත්වීමට වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමන් ඇතුළු වෙන්නප්පුව මීසම් සේවක සභාව තීරණය කර ඇත.

1932 වර්ෂයේ කොච්චිකඩේ මුරුතාන ගමේ උපත ලැබූ ලයනල් මහතා වෙන්නප්පුව ප්‍රදේශයේ පදිංචිව සිටි හැරියට් මේබල් මහත්මිය සමග විවාහ වීමෙන් පසුව වෙන්නප්පුව ප්‍රදේශයේ පදිංචියට පැමිණ ඇත. 1978 වර්ෂයේ හලාවත පදවියේ හිටපු අනුනායක ගරු ලියෝ පයස් ප්‍රනාන්දු පියතුමන් වෙන්නප්පුව මීසම් සේවක පියතුමන් ලෙස කටයුතු කරන අවධියේ ලයනල් මුලින්ම වෙන්නප්පුව දේවස්ථානයේ සේවය සඳහා පැමිණ ඇත. ඉන්පසුව වසර විසි



පහක කාලයක් එනම් 2013 වසර දක්වා ඒ මහතා වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගෙ දේවස්ථානයේ සංක්‍රිස්තියන් ලෙස මහත් වූ සේවාවක් කර ඇත. ඒ මහතාගේ මතකයේ හැටියට ගරු බීඩ් ප්‍රනාන්දු, හයිසින්ත්, ප්‍රැන්සිස්ලාවුස්, රෙක්ස් ඩයස්, ක්‍රිස්ටි තිසේරා, පැට්‍රික් විජේසිංහ, ප්‍රැන්ක් තිසේරා සහ එරික් ප්‍රනාන්දු පියතුමන් යටතේ මෙම සේවයේ යෙදී ඇති බව සඳහන් කරයි. අතිඋතුම් ප්‍රැන්ක් මාකස් රදගුරු හිමිපාණන්ගේ සහ හලාවත වත්මන් රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ලෙන්ගතු බව ඒ මහතාගේ සේවා කාලය තුළ ලැබූ සුවිශේෂී වූ අත්දැකීමක් බව ලයනල් මහතා සඳහන් කරයි.

ලයනල් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් පැවැත්වෙන උපහාර උලෙළ මාර්තු 23 වනදා වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබූ අතර මද අසනීප තත්ත්වයකින් පසුවන ලයනල් ප්‍රනාන්දු මහතාට ඉක්මන් සුවය ජේසු සමිඳුන් තුළ ප්‍රාර්ථනා කරමු.

**ප්‍රියන්ත පීටර්ස්**
වෙන්නප්පුව

**කිතුනු ගී 500... 1 පිටුවෙන්**

බොහෝ ගීතිකා සඳහා ඒවායේ මුල් කෘතියෙන්ම ස්වර ප්‍රස්ථාර ලබාගෙන ඇති අතර, අනෙකුත් ගීතිකා සඳහා ස්වර ප්‍රස්ථාර ඒවායේ නිර්මාණකරුවන්ගෙන්ම ලබාගෙන තිබීම මෙහි වූ විශේෂත්වයකි. ගීතිකාවේ පුන ගැයුම හා පද පමණක් නොව ආරම්භක වාදන හා අන්තර් වාදන සමඟින් වාදනය කිරීමේ දී භාවිතයට පහසුවන අයුරින් සැකසෙන මෙම පොත, පහසු මිලකට ඔබ අතට පත් කිරීමට හැකි බව ගරු දොන් සිසිල් කුමාර පියතුමා පවසා සිටී.

**කතෝලික පෞද්ගලික... 1 පිටුවෙන්**

අදාළ පාසල් විසින් මුල් පිටපත් පරීක්ෂා කර බලා, වෙනත් පාසලකින් ද ඔබ ඉල්ලුම් පත් ලබා ගන්නේ නම්, එම පාසලටද ඉදිරිපත් කිරීම සඳහා එම සහතිකවල මුල් පිටපත් ඔබට ආපසු දෙනු ඇත. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් පාසලට බාර දීමේදී දෙමාපියන්ගේ විවාහ සහතිකයේ සහ දරුවන්ගේ ක්‍රිස්තියානි සහතිකවල මුල් පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණීම අවශ්‍ය නොවන අතර ඡායා පිටපත් ඇමිණීම ප්‍රමාණවත්ය. ඔබව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එහිදී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත් ඡායා පිටපත් සමඟ සසඳා පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ඔබව වෙනත් පාසලකට සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඇත්නම්, එහිදී ඉදිරිපත් කිරීමට හැකි වන ලෙස සම්මුඛ පරීක්ෂණයෙන් පසු මුල් පිටපත් ආපසු දෙනු ලැබේ. ඔබගේ දරුවා පාසලකට තෝරා ගනු ලැබුවහොත්, එම පාසලට ඔබගේ දරුවා ඇතුළත් කරන්නේ නම් එම අවස්ථාවේදී ඔබගේ විවාහ සහ ක්‍රිස්තියානි සහතිකවල මුල් පිටපත් පාසලට බාරදිය යුතුය.

මේ අනුව ඔබගේ දරුවා ඇතුළත් කිරීම සඳහා ඔබ ඉල්ලුම් කරන සෑම පාසලක් සඳහා විවාහ සහ ක්‍රිස්තියානි සහතික වල මුල් පිටපත බැගින් මීසම් සේවක පියතුමාගෙන් ඉල්ලා නොසිටින්න. ඉල්ලුම් කරන සියළුම පාසල් සඳහා දෙමාපියන්ගේ විවාහ සහතිකයේ සහ දරුවන්ගේ ක්‍රිස්තියානි සහතිකයේ එක් මුල් පිටපත බැගින් ලබා ගැනීම ප්‍රමාණවත් ය.

**අගරදගුරු පදවි කතෝලික අධ්‍යාපන සහ කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරී පියතුමා**

# පුහුණු ධර්මදූතයින් විසිර යති



පමුණුගම පිහිටි අගරදගුරු පදවි ධර්මදූත සේවා පුහුණු මධ්‍යස්ථානයේ පළමු අදියරේ නේවාසික පුහුණු පාඨමාලාව හමාර කළ පුහුණු ධර්මදූතයන් බෝපිටිය මීසමේ සියළුම ඒකකයන්හි නිවෙස් වලට ගොස් 2000 ක් පමණ කිතුනුවන් හමුවී ප්‍රායෝගිකව ලබා ගත් අත්දැකීම්, ප්‍රශ්න හා ගැටලු පිළිබඳ සාකච්ඡාවක් පසුගියදා පමුණුගම ධර්මදූත සේවා පුහුණු මධ්‍යස්ථානයේ දී එහි අධ්‍යක්ෂ ගරු ජූඩ් පීරිස් පියතුමා හා බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමා සමඟ සංවාදයට එක් වූ අවස්ථාව මෙහි දැක්වේ.

සේයාරුවේ දැක්වෙන පුහුණුව ලද ධර්මදූතයන් මෙසේය. මේරි මැග්ඩෙලා ඇන්ටනි - මහනුවර පදවිය, මොරින් පද්මා ලින්සි ප්‍රනාන්දු - හලාවත පදවිය, ජයන්ති ප්‍රනාන්දු - කුරුණෑගල පදවිය, එම්. එදිරිසිංහ - කොළඹ පදවිය, රේමන් ප්‍රනාන්දු - කොළඹ පදවිය, දේශක ගරු මේරි ඔගස්ටින් පැවිදි සෙයුරිය ද මෙහි සිටී.


**(සටහන - ජෝ. සංගපාලආරච්චි, සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**

# දිව්‍ය සත්ප්‍රසාදීය තරුණ සමිතියේ නුවානාන්තර එල්ලේ තරගය

ශ්‍රී ලංකාවට නිදහස ලැබූ දිනය සමරමින් සෑම වසරකම ඇලතුර සා. රෝකුස් මුනිඳුන්ගේ දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාදීය තරුණ සමිතිය මෙහෙයවන නුවානාන්තර එල්ලේ තරගාවලිය මෙවර ද සුපුරුදු පරිදි ඇලතුර ක්‍රීඩාංගනයේ දී පැවැත්විය.

මෙම තරගාවලියේ ශූරතාවය හයවෙනි නොවාන ඒකකය දිනාගත් අතර එහි අනුශූරතාවය තුන්වන නොවාන ඒකකය හිමිකරගන්නා ලදි.

✍ **නිමාෂා පෙරේරා**



බුරුල්ලපිටිය මීසම් සේවක පියතුමා ලෙස වසර පහකට වඩා වැඩි කාලයක් මීසමට සුවිශේෂී සේවයක් කළ ගරු සුභාජ් චමින්ද පියතුමා (වම්පස) වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශගතවීම නිමිත්තෙන් මීසමෙන් සමුගැනීමත් නව මීසම් සේවක පියතුමා ලෙස අනුරාධපුර පොතානගම මීසමේ සේවය කළ ගරු ඩඩ්ලි සපරමාදු පියතුමා (දකුණු පස) පිළිගැනීමත් සනිටුහන් කරමින් බුරුල්ලපිටිය මීසම් ජනතාව විසින් මහත් හරසරින් පිළිගෙන පියතුමන් දෙනම දිව්‍ය පූජා යාගය සඳහා දේවස්ථානය කරා පෙරහරින් කැඳවාගෙන පැමිණි අයුරු.

**(සටහන - වෙනීෂියස් ඇන්ටනි, සේයා - ලාල් මැන්දිස්)**



සගසුව දිනූ ගරු කිංස්ලි අදිකාරම් ජේ. නි. පියතුමන්ගේ අවසන් කටයුතු සිදු කිරීමට ප්‍රථම මීගමුව අක්කර පනහේ ජේසු නිකාය මධ්‍යස්ථානයේ දෙව්මැඳුරේ දී ගරු ප්‍රභාත් සංජීව ප්‍රනාන්දු ජේ. නි. පියතුමන්, ගරු ගාමිණී පෙරේරා ජේ. නි. පියතුමන් හා ගරු ඇන්ටන් පීරිස් ජේ. නි. පියතුමන් ස්වර්ගස්ථ ගරු පියතුමන්ගේ දේහය අභියස දිව්‍ය යාගය පුද කළ අයුරු සේයාරුවෙන් දැක්වේ. සග සුව දිනූ ගරු පියතුමන්ගේ අවසන් කටයුතු එතුමන්ගේ උපන් ග්‍රාමය වන මහනුවර දී සිදු කරන ලදි. **(සටහන - ඩබ්ලිව් තිලක් ප්‍රනාන්දු, සේයා - ජේ. නි. මාධ්‍ය ඒකකය**




ගුවන් සේවා ඇකඩමියේ ත්‍යාග ප්‍රදානෝත්සවය ඉකුත් දා සෞදි අරාබි ගුවන් සේවාවේ ජ්‍යෙෂ්ඨ වෙන් කිරීම හා ප්‍රවේශ පත් කළමනාකාරිණී දයාමාල් ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ඇය පාඨමාලාව හැදෑරූ අයකුට සහතික පත් දානය කරද්දී ජාත්‍යන්තර සංචාරක කටයුතු උපදේශක හා පාඨමාලාව මෙහෙය වූ දීපාල් පෙරේරා මහතා පසෙක සිටී.

# මහා පාදනමස්කාරය සහ දේව මෙහෙය

හලාවත පදවියේ වනාතවිල්ලුව මීසමට අයත් වන මැද පිහිටි ඓතිහාසික පල්ලෙකන්ඩල් ශු. අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ දී 2014 අප්‍රේල් 01 වන අඟහරුවාදා දින පෙ.ව. 10.00 සිට මහා පාද නමස්කාරයක් හා දේව මෙහෙයක් පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ වැල්ල වීදිය මීසම් සේවක ගරු ටෙරන්ස් බෝදියාබදුගේ පියතුමන් විසිනි. වනාතවිල්ලුව මීසම් සේවක ගරු කමල් ඩේමියන්, සහයක ගරු එරන්ද ශාන්ත පියතුමන්ලා හා මීසම් වාසීන් එක්ව මෙය සංවිධානය කැරේ. ඒ සඳහා එක්වීමට ඔබටත් ඇරියුම! **(කැලුම් ශ්‍රීමාල්)**



ආඬිඅම්බලම මීසමේ, ආඬිඅම්බලම ශුද්ධවූ ජපමාල මාතා දෙව්මැඳුරේ අවමංගල්‍ය සුභ සාධක සංගමයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු තොගයක්, බස්නාහිර හිටපු පළාත් සභා මන්ත්‍රී ආනන්ද හරිශ්චන්ද්‍ර මහතා විසින් දේවස්ථානයට පරිත්‍යාග කිරීම පසුගියදා සිදුවිය.

එම පුටු තොගය මීසම් සේවක ගරු නිමල් පොන්වීර පියතුමන් වෙත පිරිනැමූ අයුරු. අවමංගල්‍යය සුභ සාධක සංගමයේ ලේකම් ඩිලාන් රසික, භාණ්ඩාගාරික හර්බට් ස්ටැන්ලි ප්‍රනාන්දු සහ සංවිධායක ට්‍රොන්ෂි කැනීෂියස් මහතුන් සමඟ ආඬිඅම්බලම දෙව්මැඳුරේ මීසම් ධර්ම සේවා සභාවේ ලේකම් ටී. සුනිල් ප්‍රනාන්දු මහතා ද මෙහි වෙති. **(සේයා - රොෂාන් ප්‍රදීප්)**



නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් සාදා තිබූ තොරණයි මේ.

මෙය උණ ලී වලින් සාදා ලණු ඔතා නිම කළ කරත්ත දෙකකි. මෙය මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමන්ගේ සංකල්පනාවකට අනුව හිටපු සහයක ගරු නිමන්ත ප්‍රගීත් පියතුමන් හා පාස්කු කමිටුවේ සැදැහැවතුන් සමඟ කැපවීමෙන් කළ නිර්මාණයකි. **(සටහන සහ සේයා - ශ්‍රියාංගනී පිලීෂියා)**

# අවමංගල්‍යය ස්තුති කිරීමයි



## ඉසබෙලා පෙරේරා මහත්මිය

ඉසබෙලා පෙරේරා මහත්මියගේ පවුලේ උදවිය වශයෙන් අපි රදගුරු හිමිපාණන්ට, ගරු පියතුමන්ට, පැවිදි සොයුරියන්ට, බෞද්ධ භික්ෂූන් වහන්සේට, ඥාතීන්ට, අසල්වාසීන්ට, මිතුරන්ට, අවමංගල උළෙළට එක්වීම පිළිබඳවත්, ශෝක පණිවුඩ එවීමෙන් හා විවිධ මාර්ගවලින් සහය වීම ගැනත් තුති පුදමු. වෛද්‍ය නිලධාරීන් සිය කාලය හා ශ්‍රමය වැය කිරීම ගැන ද තුති පුදන අතර පෞද්ගලිකව තුති පිදීමට නොහැකිවීම ගැන කණගාටු වෙමු.

**දියණියෝ, බෑණාවරුන්, මුණුබුරු මිණිබිරියන් හා**
**මී මුණුබුරු මිණිබිරියන්**

# අති උත්තම පාප් තනතුරේ විශිෂ්ටත්වය



වතිකානයේ අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියා විසින් උන්වහන්සේගේ ජනහිතකාමී වැඩ පිළිවෙල අනුව යමින් ලඟදී එතුමාණන් ඉටු කළ විශිෂ්ට කර්තව්‍යයක් පිළිබඳව තම ප්‍රශංසාව පළ කරමින් හලාවත පදවියේ වයික්කාල මීසමේ සින්දාත්‍රිමාතා දේවස්ථානයේ දායක ප්‍රැන්සිස් බෙනට් පීරිස් මහතා විසින් උන්වහන්සේ වෙත යවන ලද ලිපියකට උන්වහන්සේ විසින් පිළිතුරු එවීමේ භාග්‍යය ඔහුට උදා විය.

වතිකාන රාජ්‍ය නායක අති උත්තම පාප් වහන්සේ විසින් එවන ලද එම ලිපිය දුටු ශ්‍රී ලංකාවේ වැඩ බලන වතිකාන තානාපති මොන්සිඤ්ඤෝර් රෙනාටෝ කුච්චි පියතුමන් විසින් කොළඹ පිහිටි වතිකාන තානාපති කාර්යාලයේ දී ප්‍රැන්සිස් බෙනට් පීරිස් මහතා වෙත භාර දීම සිදු කළ අවස්ථාවයි මේ.



ජා-ඇල මාඑළිය ග්‍රාමයේ ගරු ක්ලිෆර්ඩ් පර්වින් පියතුමන් විසින් මාඑළිය ජනතාවට මරිය වසර වෙනුවෙන් තිළිණයක් ලෙස දෙන ලද ලූර්දු ගුහාව කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් අතින් පසුගියදා ආසිරි ගන්වා විවෘත කැරිණි.

ලූර්දු ගුහාවේ අල්තාරය මත දිව්‍ය පූජාව ඔප්පු කළ අතර මෙයට මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත පියතුමා , මා එළිය ගරු නිහාල් රොඩ්රිගෝ පියතුමා, ගරු පියවරුන්, පැවිදි සොයුරියන් ඇතුළු සැදැහැවතුන් ද එක්වූහ. **(ධම්මිකා බණ්ඩාර)**



සෙත් සරණ නිවාස ව්‍යාපෘතියේ කටාන පහළ මඩම්පැල්ල සන්තියාගෝ නිවාස පංතියේ නව නිවසක් වැලිහේන ශු. කයිතානු මුනි දේවස්ථානයේ වසර ගණනාවක පටන් සංක්‍රිස්තියන් ධූරය දරන ලියනගේ විජේ මහතා ඇතුළු පවුලේ දූ දරුවන් වෙත පිරිනමන ලදී.

එම මීසමේ ගරු නිශාන්ත රුද්‍රිගු පියතුමා ඇතුළු මීසම් ධර්ම සේවා සභාවේ දායකත්වය තුළ ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර නිවසට ගෙවැදීමේ ප්‍රීතිය නිමිත්තෙන් පවත්වන ලද ආගමික වතාවත් සහ තේ පැන් සංග්‍රහයට වැලිහේන හිටපු මීසම් සේවක ගම්පහ ඉදිගොල්ල සිද්ධස්ථාන පාලක ගරු නොයෙල් නෝනිස් පියතුමා ද ගරු ඇනීටා පැවිදි සොහොයුරිය සමඟ නිවාස පංතියේ බැතිමතුන් ද එක්වූහ. **(සේයා - එච්. ඒ. කල්දේරා)**



# ප්‍රදීපය

## මංගල යෝජනා

**මනාලියෝ**

සිංහල, කතෝලික දෙමාපියන් තම උපාධිධාරි / පශ්චාත් උපාධිධාරී, උසස් රැකියාවක නියුතු, 26 හැවිරිදි දියණියට උගත් පුතනුවකු සොයයි. පිළිතුරු මවගේ ඊ-මේල් ලිපිනයට **sfdo2014march@gmail.com** හෝ අංක N6932, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...

**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**

## ඔබගේ දුවට හෝ පුතාට සුදුසු

## කතෝලික සහකරුවකු හෝ සහකාරියක සඳහා

**මංගල යෝජනා දැන්වීමක් පළ කර ගැනීමට අවශ්‍ය නම් පහත උපදෙස් පිළිපදින්න.**

**ඔබගේ පුතුගේ හෝ දියණියගේ විස්තර මුද්‍රිත අකුරින් හෝ පැහැදිලි අත් අකුරින් ලියා හැකි ඉක්මනින් අප වෙත යොමු කරන්න.**

- මංගල යෝජනා දැන්වීම් සඳහා පළමු වචන 15 ට රු. 500/- ක මුදලක් වන අතර ඉන් පසුව වැඩිවන වචනයකට රු. 8.00 ක මුදලක් එකතු වේ.
- තැපැල් මගින් මංගල යෝජනා දැන්වීම එවන්නේ නම් දැන්වීම සමග ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් එවන්න.
- ඔබගේ දුරකථන අංකය පළකළ යුතු නම් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර අත්සන් කරන්න.
- දැන්වීම ෆැක්ස් මගින් අප වෙත එවන්නේ නම් දැන්වීම සඳහා වැය වන මුදල මරදාන **HNB** ශාඛාවේ ගිණුම් අංක 108010005037 ට ඔබගේ මුදල් බැර කරන්න. ඉන්පසු මුදල් බැර පත හා දැන්වීම අප ආයතනයට ෆැක්ස් කරන්න.
- දැන්වීම ෆැක්ස් කළ පසු එය අප ආයතනයට ලැබී ඇත්දැයි පරීක්ෂා කර දැන ගන්න.
- මංගල යෝජනා සඳහා පිළිතුරු එවීමේදී මංගල යෝජනා අංකය පැහැදිලිව සඳහන් කර කුඩා කවරයක (**3 1/2' 6"**) එවන්න.



**ගරු අධ්‍යක්ෂ පියතුමා,**
**කොළඹ කතෝලික මුද්‍රණාලය, අංක 2,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**
**දු.ක. 2695984 / 2678106 / 011-4899611 ෆැක්ස් : 2692586**

